# නියමුවා

"දයලෙක්තික දර්ශනයට කිසිවක් නිත්‍ය, සර්ව සම්පූර්ණ හෝ ශුද්ධ හෝ නොවේ. එය සෑම දෙයක්ම හා සෑම දෙයකම තාවකාලික බව අනාවරණය කරයි. ඇති වීමේ හා නැති වීමේ, පහළ සිට ඉහළට වන අනන්ත උද්ගමනයේ ක්‍රියාදාමය හැර වෙනත් කිසිවක් එය හමුවේ ඔරොත්තුදීමට අසමත්ය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**01 වෙළුම,**
**18-19 පිටු**

ISSN 1391 - 1031 | 2021 ජුනි විද්‍යුත් මුද්‍රණය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී




ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු වට රවුම අසල - 2021.05.19

## රාජපක්ෂ පාලනය

# අවසන් රාජ්‍ය දේපොළත් බිලිදෙයි!

පසුගිය මැයි 17වැනි දින අගමැති මහින්ද රාජපක්ෂ මහතා නාගරික සංවර්ධන ඇමතිවරයා ලෙස සම්මත කර ගනු ලැබ තිබෙන කැබිනට් පත්‍රිකාවක් අනුව කොළඹ නගරයේ ඉතාම වටිනා රාජ්‍ය දේපොළ ප්‍රමාණයක් ඇතුළු රටේ වැදගත් ආයතන රැසක් බහුජාතික සමාගම්වලට දිගුකාලීනව බදු දීමට හෝ පරිපාලනය පැවරීමට අදාළ ඉඩකඩ සකස් කරගෙන තිබේ.

එකී කැබිනට් පත්‍රිකාවට අනුව සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් නමින් රාජ්‍ය අයිතිය ඇති පුද්ගලික ආයතනයක් පිහිටුවා දැනට විවිධ රාජ්‍ය ආයතන බාරයේ තිබෙන කොළඹ නගරය ඇතුළු තවත් ප්‍රදේශවල රාජ්‍ය දේපළ රැසක් මෙකී ආයතනයට පවරාගෙන එය මගින් එම ආයතන බදුදීම හෝ පරිපාලනය පැවරීමට සූදානම් වේ. ඒ අනුව කොළඹ නගරයේ තිබෙන ඓතිහාසික වටිනාකමකින් යුත් ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය, ගෆූර් ගොඩනැගිල්ල, විදේශ අමාත්‍යාංශ ගොඩනැගිල්ල, මහ තැපැල් කාර්යාලය ආදී ගොඩනැගිලි හා ඉඩම් රැසක් ඇතුළත්කර ගෙන තිබෙන අතර සෙලන්දිවා ආයතනයට සම්බන්ධ අනුබද්ධ ආයතන 03ක් සකස් කොට මෙම දේපළ පෞද්ගලික අංශයට පවරාදීමට සූදානම් වන බව සඳහන්ය. මෙසේ පවරා ගන්නා භූමිභාගයන් අතරට සීනෝර් රෙස්ටුරන්ට් දේපළ, වෝටර්ස්එජ් හෝටලය හා කන්කසන්තුරේ ජාත්‍යන්තර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයද අයත් වේ.

ඒ අතර මහින්ද රාජපක්ෂ අගමැතිවරයා හා අලි සබ්‍රි අධිකරණ අමාත්‍යවරයා විසින් ඒකාබද්ධව ඉදිරිපත් කරනු ලදුව 17වැනි දින සම්මත කර ගනු ලැබ තිබෙන තවත් කැබිනට් පත්‍රිකාවකට අනුව දැනට බොරැල්ලේ පවතින බන්ධනාගාර සංකීර්ණය ඉන් ඉවත්කර එය කළුතර, හොරණ ප්‍රදේශයේ මිල්ලනියට ගෙන ගොස් බොරැල්ලේ ඇති වටිනා ඉඩම් වාණිජ කටයුතු සඳහා යොදාගැනීමටද සැලසුම් කරනු ලැබ ඇත.

මීළඟ බරපතළ ක්‍රියාමාර්ගය මතුවන්නේ බලශක්ති අමාත්‍යවරයා ලෙස උදය ගම්මන්පිල මහතා විසින් මැයි 24 දින ඉදිරිපත් කරනු ලැබ තිබෙන කැබිනට් පත්‍රිකාවකිනි. එයට අනුව දැනට ඛනිජ තෙල් සම්බන්ධව පවතින රාජ්‍ය අයිතිය අහෝසි වනසේ ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත සංශෝධනය කිරීමට ආණ්ඩුව සැරසෙයි. ඒ අනුව දැනට රාජ්‍ය ඒකාධිකාරයක් ලෙස පවතින ඛනිජ තෙල් පිරිපහදුවද ඇතුළත්ව ඛනිජ තෙල් ගෙන්වීම, බෙදාහැරීම ආදී සෑම ක්ෂේත්‍රයක්ම පෞද්ගලික අංශයට ලබාදීමේ බලය ඇමතිවරයා වෙත පැවරේ.

මේ සියල්ල එක්ව බලන විට පෙනීයන්නේ, දේශප්‍රේමය ගැන කථාකරමින්, ජාතික ආර්ථිකයක් ගැන පම්පෝරි ගසමින්, විකිණීම නතර කර විකුණා දැමූ දේපළද යළි පවරාගන්නා බවට වහසි බස් දොඩා බලයට පැමිණි රාජපක්ෂවරුන්, නව ලිබරල්වාදය කරපින්නාගෙන විවෘත ආර්ථිකය යටතේ මෙතෙක් පෞද්ගලීකරණය කිරීමට නොහැකි වූ රාජ්‍ය සම්පත්ද පෞද්ගලීකරණය මගින් විදේශ රටවලට බිලිදීමට සූදානම් බවය. දේශප්‍රේමය ගැන 'ඇගේ මයිල් කෙළින් වන' කථා පැවැත්වූ රාජපක්ෂවරු දැන් අධිරාජ්‍යවාදී ආර්ථික ව්‍යාපෘතියේ අවසන් කොටස ඉටුකිරීම සඳහා පියවර ගනිමින් සිටිති.

කොළඹ නගරයේ බොහෝ ආයතන වරාය නගරය ආසන්නයේ පවතින නිසා ඒවා බොහෝ විට ඊට එන සමාගම්වලට ලබාදෙනු ඇතැයි ඇතැමුන් තුළ සැකයක් පවතී. ඒ අතරම චීනයට බොහෝ දේ ලබාදීම නිසා මතුවන කලාපීය අර්බුදය සමනය කිරීමට ඉන්දියාවටද රටේ සම්පත් දීමට ආණ්ඩුවට සිදුවනු ඇත. අවසානයේ සිදුවෙමින් තිබෙන්නේ රට රැකීමට, ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට, අධිරාජ්‍යවාදය පැරදවීමට, ජාතික ආර්ථිකය හැදීමට කප්පරක් පොරොන්දු දී බලයට පැමිණි ඊනියා දේශප්‍රේමීන් ලෙස පෙනීසිටි රාජපක්ෂ පාලනයම අධිරාජ්‍යවාදයේ හා කලාපීය බලවතුන්ගේ වුවමනාවලට අනුව යමින් රටේ ඉතිරිව තිබෙන රාජ්‍ය සම්පත් සියල්ල ඩොලර් කිහිපයක් වෙනුවෙන් බිලිදීමට සූදානම් වීමය. මෙය විවෘත ආර්ථිකයේ මෙතෙක් සම්පූර්ණ කිරීමට නොහැකි වූ දෙවැනි ඉනිම සම්පූර්ණ කිරීමක් වන අතර රට මුළුමනින්ම විදේශ බලවතුන්ගේ කෙළිබිමක් බවට පත්කිරීමකි.


### 03 පුපුරා යා හැකි...




කොරෝනා ජාවාරමක්කර ගැනීමට එරෙහි විරෝධයක් සමාජය තුළ තිබේ. ෆෝට් සිටියේ වැඩි අයිතිය චීනයට ලබාදෙමින් ෆෝට් සිටි පනත පාර්ලිමේන්තුවේ...

### 05 දේශප්‍රේමයේ සැබෑව...




ධනවාදය අධිරාජ්‍යවාදයට ගොස් නව ලිබරල්වාදී ආර්ථික දේශපාලන ප්‍රතිපත්තියක් තුළ පවතින විට ලොව කිසිදු ධනපති කණ්ඩායමකට ඉන් මිදී.....

### 07 කොවිඩ් හමුවේ...



අද බිළිගනිමින් තිබෙන මිනිස් ජීවිත, වෛරසය පිළිබඳව ජනතාව තුළ ඇතිවී තිබෙන බිය, පුරවැසියන්ගේ ඇස්වලින් ගලන කඳුළු යනාදී සියල්ල බරපතළ...

### 09 ආර්ථිකයේ කුණුවීම...



ආණ්ඩුව ආදායම උපයන ක්‍රියාවලියක් හෝ නිෂ්පාදන ක්‍රියාවලියක් මගින් ආර්ථිකය මෙහෙයවනවා වෙනුවට සිදුකර ඇත්තේ රටේ පවතින මුදල් ...

තරුණ.................... 04
ජාත්‍යන්තර.................... 06
කාන්තා.................... 08
විශේෂ.................... 10
වේදිකාව.................... 11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# සටන් බිම

## කොරෝනා අරමුදල දරුවන්ගේ අධ්‍යාපනය සඳහා යෙදවිය යුතුයි



මේ වන විට රට පුරා ගුරු විදුහල්පතිවරුන් විශාල පිරිසක් කොරෝනා රෝගයට ගොදුරු වී ඇති බවත් පස්දෙනෙකුට වඩා වැඩි පිරිසක් මියගොස් ඇති බවත් පවසන ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ගුරු විදුහල්පතිවරුන් එන්නත් කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් සැකසිය යුතු බව අවධාරණය කරයි.

ලංකා ගුරුසේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පසුගියදා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ පැවති මාධ්‍ය හමුවක් අමතමින් මේ බව පැවසීය.

සෞඛ්‍ය සේවය, ආරක්ෂක අංශවලට පසු වැඩිම අවදානමක් ඇත්තේ ගුරු විදුහල්පතිවරුන්ට නමුත් ආණ්ඩුව මේ දක්වා දරුවන්ගේ ආරක්ෂාව, අධ්‍යාපනය පිළිබඳව හෝ සිතා තවමත් ගුරු විදුහල්පතිවරුන්ට එන්නත් ලබාදීමට කටයුතු කර නැතැයි ඔහු මෙහිදී පෙන්වා දුන්නේය. බොහෝ රටවල් ලොක්ඩවුන් කර පැවතියද අධ්‍යාපනය නතර කිරීමට කටයුතු කර නොමැත්තේ රටේ ඉදිරි ආයෝජනය දරුවන්ගේ අධ්‍යාපනය බව එම රටවල් දැන සිටින හෙයින් බවත් මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය.

"මිලියන 1773 ක් ඇති කොරෝනා අරමුදලෙන් පිස්සු කෙළින්නෙ නැතුව රටේ අනාගත ආයෝජනය දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ යුතුයි. නමුත් එක පැත්තකින් නාමල් රාජපක්ෂ ඇමතිවරයා ජිම් හදන්න කැබිනට් එකේ අනුමැතිය ගනිද්දී ඇම්බියුලන්ස් 10කට වංචාකාරී ලෙස මිලියන 194ක් යොදවලා. මෙසේ අරමුදලින් වංචා කරන්නේ රාජ්‍ය සේවකයගෙ දිනක වැටුප බලෙන් කපාගත් ආණ්ඩුවයි.

online ක්‍රමයට අධ්‍යාපනය දීම අසාර්ථක බව අධ්‍යාපන බලධාරීන්ම පවසනවා. සමහර පවුල්වලට අඩුම තරමේ ස්මාර්ට් ෆොන් එකක් ගැනීමේ හැකියාවවත් නැහැ. ගුරුවරු මේ අධ්‍යාපනය ලබා දෙන්නේ තමන්ගෙ සොච්චම් පඩියෙන් ඩේටා දාගෙනයි. අඩුම ගානෙ ඩේටා ටිකවත් නොමිලේ දීමට ආණ්ඩුව වගබලා ගත යුතුයි." මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය.

මෙම මාධ්‍ය හමුව සඳහා ලංකා ගුරුසේවා සංගමයේ උපලේකම් ඒ.පී. මිල්ටන් සහෝදරයාද සහභාගි විය.

## වෙළඳ කලාප සේවකයින් දැඩි අර්බුදයක - BOI වහා මැදිහත් විය යුතුයි - ගාමිණී රත්නායක සහෝදරයා



වසංගත තත්වය තුළ වෙළඳ කලාප සේවක සේවිකාවන්ගේ මූලික අයිතිවාසිකම් පවා උල්ලංඝනය කරමින්, ඔවුන්ගේ අයිතිවාසිකම් කප්පාදු කරමින් කටයුතු කරන බවත් නිරෝධායන නීතිරීති උපයෝගි කරමින් මූලික වැටුප් පවා කප්පාදු කරමින් සිටින බවත් වෙළඳ කලාප සේවකයින්ගේ ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු ගාමිණී රත්නායක සහෝදරයා පවසයි. ඔහු මේ බව සඳහන් කරන්නේ ආයෝජන මණ්ඩල සභාපතිවරයා වෙත ලිපියක් යොමු කරමිනි.

මූලික සෞඛ්‍ය පහසුකම් පවා ලබානොදෙමින්, වෙළඳ කලාප තුළ කොරෝනා පොකුරු නිර්මාණය කරමින් සේවක ජීවිත අනතුරට හෙළා ඇති බවද නිරෝධායන නීතිරීති උපයෝගි කරගනිමින් ජීවිත අවදානම නොසලකා සේවය කරනු ලබන වෙළඳ කලාප සේවක සේවිකාවන්ගේ වැටුප් කප්පාදුව නවතා දමන ලෙසද එම ලිපියෙන් ඉල්ලා සිටී.

එහි වැඩිදුරටත් පවසා ඇත්තේ 85,000 කට ආසන්න වෙළඳ කලාප සේවක සේවිකාවන් විසින් කොවිඩ් 19 වසංගතය හමුවේ රටේ ආර්ථිකය වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටුකරනු ලබන බවත් කොවිඩ් වසංගතයට මුහුණු දෙමින් තම ජීවිත අවදානමද නොසලකා වැඩ කිරීමට ඔවුන්ට සිදුවී ඇති බවත්ය.

මේ තත්වය තුළ වෙළඳ කලාප සේවක සේවිකාවන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර දීමටත් ජීවිත අවදානම නොසලකා සේවය කරනු ලබන වෙළඳ කලාප සේවක සේවිකාවන්ගේ වැටුප් කප්පාදුව නවතා දැමීමටත් BOI ආයතනය මැදිහත් විය යුතුව ඇති බව මෙම ලිපිය මගින් ගාමිණී රත්නායක සහෝදරයා අවධාරණය කරයි.

## වසංගතය සමග බෑ. දින 45 කින් අවසන් කළ යුතුයි

### සෞඛ්‍ය වෘත්තීය සමිතිවලින් යෝජනාවලියක්



දින 45 කින් කොවිඩ් 19 වසංගතය අවසන් කිරීම වෙනුවෙන් සෞඛ්‍ය වෘත්තීය සමිති විසින් සකස් කරන ලද යෝජනා 10කින් යුත් වැඩපිළිවෙළ පසුගියදා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කෙරිණි. වසංගතයක් සමග මිනිස් ජීවිත පවත්වාගෙන යාමට නොහැකි බවත් එබැවින් මෙම වසංගතය දින 45ක් තුළ අවසන් කිරීම වෙනුවෙන් යෝජනා 10කින් යුත් පැහැදිලි වැඩපිළිවෙළක් සෞඛ්‍ය වෘත්තීය සමිති එක්ව සකස් කරන ලද බවත් මෙම අවස්ථාවට සහභාගී වූ සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර පැවසීය.

කොවිඩ් වසංගතය තුරන් කළ රටවල් සඳහා ඕනෑතරම් උදාහරණ සොයා ගත හැකි බවත් එබැවින් මෙලෙස සකස් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආණ්ඩුවට බලපෑම් කරන බවත් මෙහිදී ඔහු පැවසීය. මෙම අවස්ථාව සඳහා සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති සමන්ත කෝරලේආරච්චි සහෝදරයාද සහභාගි විය. එසේම මෙම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම වෙනුවෙන් රට තුළ සංවාදයක් ගොඩනැගීමට කටයුතු කරන බවත් ඒ සඳහා සියලු ක්ෂේත්‍රයන් ආවරණය කරමින් මේ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කරන බවත් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා මෙම අවස්ථාවේදී පැවසීය.

## ගැටලු නොවිසඳීමට එරෙහිව රට පුරා හෙද හෙදියෝ එක් දින අසනීප නිවාඩු



රට පුරා සියලුම රෝහල්වල සේවය කරනු ලබන හෙද හෙදියෝ පසුගිය මැයි මස 31වැනි දින සේවයට වාර්තා නොකර අසනීප නිවාඩු ගැනීමේ ක්‍රියාමාර්ගයක නිරත වූහ. කොවිඩ් ආසාදිතයින්ට ප්‍රතිකාර කරනු ලබන සියලුම රෝහල්වල සේවය කරන හෙද හෙදියන්ට බලපා ඇති ගැටලු ඉදිරිපත් කරනු ලැබුවත් මේ දක්වා එම ගැටලු විසඳීමට ආණ්ඩුව විසින් ක්‍රියාමාර්ග නොගැනීම නිසා මෙලෙස අසනීප නිවාඩු ගැනීමේ වෘත්තීය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වූ බව සමස්ත ලංකා හෙද සංගමයේ ලේකම් එස්.බී. මැදිවත්ත සහෝදරයා නියමුවා වෙත පැවසීය.

කොවිඩ් තුරන් කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් සැකසීම, හෙද හෙදියන්ට ප්‍රවාහන පහසුකම් ලබාදීම, නුසුදුස්සන් හෙද හෙද සේවාවට බඳවා නොගැනීම, ගර්භනී හෙදියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම, සමීපතයන්ට කොවිඩ් එන්නත ලබාදීම, සියලු කාර්ය මණ්ඩලයට අනතුරු දීමනාවක් ලබාදීම ඇතුළු ගැටලු ගණනාවක් මුල් කර ගනිමින් මෙම වෘත්තීය ක්‍රියාමාර්ගය දියත් කරන ලද බවද මෙම වෘත්තීය ක්‍රියාමර්ගයෙන් පසු සෞඛ්‍ය අමාත්‍යාංශයේ බලධාරීන් සමග පැවති සාකච්ඡාවේදී මෙම ගැටලු ගණනාවක් විසඳීම සඳහා එකඟතාව පළ වූ බවද මැදිවත්ත සහෝදරයා වැඩිදුරටත් කියා සිටී.

## ධනවාදය තවදුරටත් ගැසට්වලින් පාලනය කරන්න බැහැ

### ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික නලින් හේවගේ සහෝදරයා

**(පසුගිය 09වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවේදී අදහස් දක්වමින්)**



ආර්ථිකයේ කඩා වැටීම කොවිඩ් නිසා වුණා කියලා ආණ්ඩුව කියනවා. නමුත් ධනවාදී ලිබරල් ආර්ථිකය දැන් තියෙන්නේ මරණ වංචකයේ. පහුගිය ආණ්ඩු දෙකම අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා මේ තත්වය ඇතිවී තිබෙනවා. දිගටම ආර්ථික වර්ධන වේගය පහත වැටී දැන් ඍණ වෙලා තියෙනවා. ප්‍රධාන ආර්ථික දර්ශක 30ක් ගත්තොත් එයින් 25ක් විතර තියෙන්නේ දැවැන්ත කඩාවැටීමකයි. උදාහරණයක් හැටියට රටේ ණයබර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 2019දී 80%යි. 2020දී 101%යි. රුපියලක් හොයනකොට රුපියල් 1.10ක ණයක් තියෙනවා. විරැකියාව වැඩිවෙලා. ආදායම් බෙදී යාමේ විෂමතාවය වැඩිවෙලා.

2020දී එක් පුද්ගල ආදායම රු. 61,000කට ආසන්න මුදලක් වෙන්න ඕනෑ. පවුලේ පස් දෙනා නම් ලක්ෂ 03ක්. හැබැයි ඒ මහ බැංකු වාර්තාවේම සඳහන් කරනවා ජනගහනයෙන් 42%කගේ ආදායම ඩොලර් 02කට වඩා අඩුයි කියලා. ඒ කියන්නේ දවසක ආදායම රු. 400ට අඩුයි. මේ වගේ දැවැන්ත විෂමතාවයක් තිබෙනවා. ඉන්දියාවේ හිටිය ශ්‍රේෂ්ට ආර්ථික විද්‍යාඥ අමර්ත්‍යා සෙන් කියලා. ඔහු කියන්නේ අදෘෂ්‍යමාන වෙළඳ බලවේග විසින් හසුරුවන රටක දෘෂ්‍යමාන රජය මැදිහත්වී හසුරුවනවා නම් ධනවාදයෙන් වුණත් මීට වඩා ප්‍රතිඵලයක් ගන්න පුළුවන් කියලා. හැබැයි ලංකාවේ ආණ්ඩුවට මේක කරන්න ක්‍රම දෙකක් නිසා බැහැ. එක, ධනවාදයට වෙළඳපොළ පාලනය කරන්න බැහැ. හාල්වලට විතරක් බන්දුල ගුණවර්ධන ගැසට් 05ක් ගැහුවා. එළවළුවලට ගැසට් ගැහුවා. පොල්තෙල්වලට ගැහුවා. සීනිවලට ගැහුවා. ව්‍යාපාරිකයෝ මේවා ගණන් ගන්නේ නැහැ. ආණ්ඩුවට වෙළෙන්දන්ව පාලනය කරන්න බැහැ. ධනවාදය තවදුරටත් ගැසට්වලින් පාලනය කරන්න බැහැ කියලා මෙයින් පැහැදිලි වෙනවා."

## කොතලාවල නව විශ්වවිද්‍යාල පනත මගින් අධ්‍යාපනය මිලිටරිකරණය වනවා

### සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා



ආණ්ඩුව විසින් ඉදිරිපත් කර ඇති නව කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු බලතල මිලිටරි ව්‍යුහයකට ලබාදීමට යෝජනා කර ඇතැයි පෙන්වා දුන් සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා, මෙමගින් නිදහස් අධ්‍යාපනය විකිණීමටත් අධ්‍යාපනය මිලිටරිකරණය කිරීමටත් ආණ්ඩුව උත්සාහ දරන බවට අනතුරු ඇඟවීය.

රංගන දේවප්‍රිය සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මාධ්‍ය හමුවකට එක්වෙමිනි. ඔහු එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් මෙසේද පැවසීය.

"අද වෙනකොට මෙම කොමිෂන් සභාව දේශපාලන බලයට නතුවී තිබුණත් එම කොමිෂන් සභාවට පත්කර තිබෙන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්. නමුත් ඉදිරිපත් කර තිබෙන කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත මගින් ඒ සියලු බලතල යෝජිත මිලිටරි ව්‍යුහයකට ලබාදෙන්න සූදානම් වෙනවා. මේ පනත මගින් බලය ලබාදෙන්න යෝජිත පාලක මණ්ඩලය පිළිබඳව සඳහන් කර තිබෙනවා. පනත අනුව මේ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා බවට පත්වෙන්නේ ඉහළ හමුදා නිලධාරියෙක්. ඔහු ඇතුළු පාලක මණ්ඩලයේ 09 දෙනාගෙන් 07 දෙනෙක්ම මිලිටරි ආයතන හා සම්බන්ධයි.

පහුගිය කාලේ සයිටම් ආයතනය විසින් ශික්ෂණ රෝහලක් තමන්ගේ ලාභ අපේක්ෂාව වෙනුවෙන් නිර්මාණය කළා. එවැනි ශික්ෂණ රෝහලක් මෙම ආයතනයටත් ලබාදෙන්න මේ පනත මගින් උත්සාහ කරනවා එසේම මෙයින් ආණ්ඩුවේ අධ්‍යාපන පෞද්ගලීකරණ වේගය වැඩි කරන්න හදනවා. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සම්බන්ධ පනත සම්මත කළේ අපේ රටේ ආරක්ෂක අංශවලට අදාළ කණ්ඩායම්වලට විශේෂ අධ්‍යාපනයක් ලබාදෙන්නයි. නමුත් අද ගෙන එන සංශෝධනවලින් වෙනත් තැනැත්තන් වෙනුවෙනුත් අධ්‍යාපනය ලබා දෙන්න සූදානම් වෙනවා.

අධ්‍යාපනය පෞද්ගලීකරණයට අමතරව අනාගතයේ මේ පනත යටතේ මිලිටරිකරණයට අදාළ ඉඩකඩ ලබාදෙනවා. ශිෂ්‍යයින්ගේ ශිෂ්‍ය සංගම්, ආචාර්යවරුන්ගේ ආචාර්ය සංගම් සහ අනධ්‍යයන සේවකයින්ගේ අනධ්‍යයන සේවක සංගම් පිහිටුවීම මේ පනත යටතේ අහෝසි කරනවා. මේ පරිපාලනය සම්පූර්ණ මිලිටරිකරණ ව්‍යුහයක් පත් කරනවා. ඔවුන්ට රටේ සාමාන්‍ය නීතියෙන් එහා හමුදා නීතිය යටතේ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් ලබාදෙන්න යනවා.

විශ්වවිද්‍යාලයක් කියන්නේ නිදහස් භූමියක්. හුදෙක් පංති කාමරයක් නොවෙයි. නමුත් මේ පනත මගින් නිර්මාණය කෙරෙන ආයතන තුළ ශිෂ්‍යයින්ගේ නිදහස සම්පූර්ණයෙන් සීමා කර තිබෙනවා. අපේ රටේ සන්නද්ධ හමුදාවලට අවශ්‍ය විශේෂ දැනුම ලබාදෙන්න අවශ්‍ය නම්, ඊට බාහිර පුද්ගලයන්ට මේ ආයතනයෙන් දැනුම ලබාදෙන්න නම් ආණ්ඩුව කරන්න ඕනෑ වෙනම පනතක් ගේන එක නෙවෙයි. පවතින මේ ආයතනයත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතට ගන්න එකයි."

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## රටටම කොරෝනා අස්සේ ආණ්ඩුවට ලාදුරුද?

ලාදුරු යනුවෙන් හඳුන්වන භයානක බෝවන රෝගය වැළඳුන විට අදාළ පුද්ගලයාගේ ශරීරයේ හැඟීම් දැනීම් නැතිවන බවට සාමාන්‍ය වෛද්‍ය මතයක් තිබේ. වත්මන් ආණ්ඩුව ක්‍රියාකරන දෙස හා ගන්නා තීරණ දෙස බලන විට හැඟීයන්නේ රටටම කොරෝනා වැළඳෙමින් තිබියෙදී ආණ්ඩුවට 'ලාදුරු වැළඳී ඇති' බවකි. ඒ, දෛනිකව රට තුළ සිදුවන බරපතළ සිදුවීම්වලදී ආණ්ඩුව පෙන්වන අසංවේදීකම නිසාය. ආණ්ඩුවට යමක් දැනෙන්නේ ඒ ගැන මුළු රටම කථා කොට හඬනගා සෑහෙන කලක් ගිය පසුවය.

පසුගිය දිනක ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර මහතා කළායයි කියන ප්‍රකාශයක් ජන මාධ්‍යවල පළවිය. එම මාධ්‍ය වාර්තාවලට අනුව ඔහු පවසා තිබුණේ විදේශවලින් ණය ගැනීම වහාම සීමා කළ යුතු බවය. සංවර්ධන යෝජනා ක්‍රම හා ව්‍යාපෘති සඳහා විදේශ ණය ගැනීම සීමා කළ යුතු බව පවසා තිබූ ඔහු විදේශ ණය උගුලක් බවද පවසා තිබුණි. හිටපු මුදල් අමාත්‍යාංශ ලේකම්වරයෙකුද වන ජයසුන්දර මහතාට මේ 'ණය උගුල' වැටහී ඇත්තේ කෙතරම් ප්‍රමාදවීද?

දැන් වසර ගණනාවක් තිස්සේ ජ.වි.පෙ.ත් තවත් විවිධ සංවිධානත් ලංකාවේ ණය අර්බුදය පිළිබඳව කථා කළ අතර පාලකයන් විසින් ලංකාව ණය උගුලක සිරකර ඇති බවට කරණු දත්ත හා උදාහරණ සහිතව පැහැදිලි කළේය. එහෙත් මේ වන තෙක්ම ආණ්ඩුව කටයුතු කළේ විදේශ ණය ගැනීම 'ජයග්‍රහණයක්' බව පවසමිනි. අද ණය උගුලක් කියන වත්මන් පාලනයම, ජයසුන්දර මහතා ඇතුළු බලධාරීන්ම පැවසුවේ ණය ලැබීම ජයග්‍රහණයක් බවය.

පාලනයකින් තොරව විදේශ ණය අරගෙන ඒවා නාස්තිකොට ණය අර්බුදයක්වී, ණය පොලී වාරික ගෙවා ගැනීමට නොහැකි වී, බංගලාදේශයෙන් පවා ඩොලර් මිලියන 200ක ණයක් ගැනීමට සිදුවූ පසු විදේශ ණය ගැනීම සීමාකිරීමට කථා කිරීම විකාරයකි. සැබැවින්ම මෙය අසංවේදීකමේ හෝ සංවේදීකමේ ප්‍රශ්නයක් නොව තවදුරටත් ණය ගැනීමට තැනක් නැති තරමටම ණය ගැනීමෙන් පසු හිත හදාගැනීම සඳහා කියන ප්‍රකාශයන්ය. මේවා 'දුකට කියන කවි' වැනි ප්‍රකාශයන් වේ.

කොවිඩ් වසංගතය මර්දනය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන්ද ආණ්ඩුවේ හැසිරීම හා තීරණ ගැනීම සිදුවන්නේ අසංවේදීවය. ආණ්ඩුවට ලාදුරු දැයි සිතෙන්නේ මේ නිසාය. රෝගය විශාල වශයෙන් පැතිරෙන බවත් මේ සඳහා ලොව නිපදවනු ලැබූ අනුමත එන්නත් ලංකාවට ලබාගත යුතු බවත් 2020 මුලදීම සෞඛ්‍ය අංශ පෙන්වා දෙන විට ආණ්ඩුව කීවේ එන්නත ගැනීමට අපට 'හදිසියක්' නැති බවය. එන්නත වෙනුවට ආණ්ඩුව 'පැණි', 'මුට්ටි' ප්‍රවර්ධනය කළේය. දැන් එන්නත ගැනීම අවසානයේ මතක් වී ගැනීමට යන විට අතේ සල්ලි නැත. අදාළ රටවල හා සමාගම්වල අවශ්‍ය කරන එන්නත් ඇත්තේද නැත. මන්ද බොහෝ රටවල් කල් ඇතුවම එන්නත් ඇණවුම් කර ලබා ගනිමින් සිටින නිසාය.

රෝගය බෝවීම උග්‍රවන විට වහාම සති කීපයකට රට වසා තැබිය යුතු යැයි වසංගත රෝග විශේෂඥයින් ඇතුළු සෞඛ්‍ය අංශ ඇතුළු රටේ විවිධ සංවිධානයන් කියද්දී ආණ්ඩුව කීවේ 'කොරෝනා සමග ජීවත්වෙමු' කියාය. කොරෝනා සමග ජීවත්වීම මාරයා සමග ජීවත්වීමක් බව දැන් වැඩිවී ඇති කොරෝනා මරණ සංඛ්‍යාව විසින් පෙන්වා දී තිබේ. අප්‍රේල් මුලම අලුත් අවුරුද්දට පෙර සංචරණ සීමා පැනවිය යුතු බවට වූ ඉල්ලීමට 'සංවේදී' නොවී එය නොදන්නාසේ සිටි ආණ්ඩුව අවසානයේ රෝගය ව්‍යසනයක් දක්වා වැඩිවූ විට අකමැත්තෙන් මෙන් සංචරණ සීමා පැනවූ අතර ඒවා පනවනු ලැබුවේ පිළිවෙළක් නැතුවය. දැන් ආණ්ඩුව ඉස්තාලය වසන විට අශ්වයා පැන ගොසිනි.

මෙම රෝගයේ බිහිසුණු බව ගැන, මිනිසුන්ට සිදුවන පීඩාව ගැන, මෙය පාලනය කළ යුතු ආකාරය ගැන ආණ්ඩුවට කිසිදු අවබෝධයක්, වගවීමක්, සැලැස්මක් හෝ සංවේදීකමක් නොවීය. ඒ වෙනුවට ඔවුන් කළේ 'අපි තමයි හොඳටම කළේ' යනුවෙන් පම්පෝරි ගසමින් කාලය කාදැමීමය.

රෝගය වැඩිවන විට රෝහල් පහසුකම් සීමාවී සෞඛ්‍ය කාර්ය මණ්ඩල හෙම්බත් වී ලංකාවේ සෞඛ්‍ය සේවයේ ධාරිතාව ඉක්මවන බවත් ඒ නිසා රෝහල්වල පහසුකම් වැඩිකරන අතරම රෝගීන් වැඩිවීම පාලනය කරගත යුතු බවට කී කථා සියල්ල ආණ්ඩුව නෑසුනාසේ ඉවත දැමීය. මේ මොහොතේ පවා රෝගීන් අඩුකිරීමට කටයුතු කරනවා වෙනුවට 'රෝගීන්ට ඇඳක් ලබාදීම' තම කාර්යය ලෙස ආණ්ඩුව විසින් සිතන බව පෙනේ. රටට කොරෝනා හැදෙද්දී ආණ්ඩුවට 'ලාදුරු' දැයි සිතෙන්නේ මේ නිසාය.

සැබෑ ලෙසම සිදුවී තිබෙන්නේ කුමක්ද? මේ පාලකයින් 'සියල්ල දත්' ලෙස සිතීම හා උද්ධච්ච වීමේ ප්‍රතිවිපාකය. මෝඩකමට උද්ධච්චකම්, මුරණ්ඩුකම, ඇහුම්කන් නොදීමේ දුර්ගුණය එකතු වූ විට එවැනි පාලකයින්ට හා පාලනයකට කළ හැක්කේ විනාශයක් කැඳවීම පමණි. මෙම ප්‍රශ්නය වසංගතයක් පිළිබඳ ප්‍රශ්නයක් නිසා මෙය මර්දනය කිරීමේ ප්‍රමුඛතාවය ගත යුත්තේ වසංගත රෝග විශේෂඥයින් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රය බව වසරකට වැඩි කලක් තිස්සේ අප හැම දෙනාම කියද්දී ආණ්ඩුව එය දඩබ්බර ලෙස නොසලකා සිටියේය. ඒ අතර පසුගියදා ඩිලාන් පෙරේරා ප්‍රකාශ කර තිබුණේ හමුදාපතිවරයා කොවිඩ් වැළැක්වීමේ කටයුතුවල මූලිකත්වයෙන් ඉවත්වී එය වෛද්‍ය ක්ෂේත්‍රයට බාරදිය යුතු බවය. එය ආණ්ඩුවේම මතයදැයි පැහැදිලි නැත.

කෙසේ වුවත් මේ සියල්ලෙන් පෙන්වන්නේ අන්කිසිවක් නොව ආණ්ඩුවේ මුග්ධ බව හා උද්ධච්චකමය. කොරෝනාවලට ප්‍රතිකාරයක් සොයාගත්තද ඉහත ලක්ෂණවලට නම් ප්‍රතිකාර නැත.

# පුපුරා යා හැකි පීඩාවක් අබියස

මේ වන විට ලංකාවේ පවතින සමාජ ආර්ථික හා දේශපාලන අර්බුදය උග්‍රවෙමින් ඉන් පොදු ජනතාව ඉමහත් ලෙස පීඩාවට පත්ව තිබේ. වත්මන් ආණ්ඩුවේ වැරදි, අදූරදර්ශී හා හිතුවක්කාරී ක්‍රියාමාර්ග නිසා මෙම පීඩාවන් තව තවත් වැඩිවෙමින්ද තිබේ. මෙම තත්වය පුපුරා යාමට ආසන්න ගිනිකන්දකට සමානය. එහෙත් ආණ්ඩුව කටයුතු කරමින් සිටින්නේ ගිනිකන්ද මත සැණකෙළි පවත්වන ආකාරයට මිස ගිනි නිවන ආකාරයට නොවේ.

ලංකාවේ උග්‍රවී ඇති ආර්ථික අර්බුදය නිසා එහි සමස්ත බර දරාගැනීම සිදුව ඇත්තේ මෙරට පොදු ජනතාවටය. ඒ, කොරෝනා වසංගත තත්වය විසින් ඇතිකර තිබෙන ඉතාම අහිතකර තත්වයන්ටද මුහුණ දෙමිනි. ලංකාවේ ණය අර්බුදය උග්‍රවී දැන් ණය ගැනීමට රටක් ඉතිරිවී නැති මට්ටමට ලංකාව පත්වී තිබේ. බංගලාදේශයෙන් ඩොලර් මිලියන 200යක් ගැනීමට සිදුවීමෙන් ලංකාවේ තත්වය වටහාගත හැක. ඊට අමතරව කොරෝනා එන්නත මිලදී ගැනීම සඳහා ලෝක බැංකුවෙන් ඩොලර් මිලියන 80.5ක ණයක් ගැනීමටද සිදුවිය. දැන් ණය ගැනීමට නොහැකිවීම කෙතරම් දැයි කිවහොත් 'විදේශ ණය' උගුලක් බවත් විදෙශ් ණය ගැනීම් සීමාකළ යුතු බවත් පැවසීමට ජනාධිපති ලේකම්වරයාටම සිදුවී තිබේ.

ආර්ථික අර්බුදයේ අනිටු ප්‍රතිඵල විසින් මෙන්ම ඒ සඳහා ආණ්ඩුව ගනු ලබන වැරදි ක්‍රියාමාර්ගවලින් සියලු ජනකණ්ඩායම් පීඩාවට පත්ව තිබේ. එක් අතකින් වෙළඳපොළේ බඩු මිල වැඩිවීම සීඝ්‍රයෙන් සිදුවන අතර සහල්, පොල් වැනි අත්‍යාවශ්‍ය ආහාර පාලනයකින් තොරව ඉහළ යමින් තිබේ. හාල් මිල පාලනයට ආණ්ඩුව ගැසූ ගැසට් දැන් ආගිය අතක් නැත. ගැසට් පරදා බඩු මිල ඉහළ ගොස් තිබේ.

අනෙක් අතට විදේශ මුදල් ඉතිරිකර ගැනීම සඳහා පසුගිය කාලය පුරාම ආණ්ඩුව ආනයන සීමාවක් පවත්වාගෙන ගියේය. ඒ අනුව රථවාහන, සෙරමික් භාණ්ඩ, අමතර කොටස් වර්ග සහ කහ පවා ගෙන්වීම නැවැත්විය. ඉන්ද ලංකාවේ ආර්ථිකයට කළේ අහිතකර බලපෑමකි. සමහර නිෂ්පාදනයන් බිඳවැටීමටත් විශාල වශයෙන් රැකියා අහිමිවීමටත් මෙය හේතුවක් විය. රථවාහන එකලස් කිරීමේ (විශේෂයෙන් ත්‍රීරෝද රථ) කර්මාන්තයේ නියළුණු විශාල පිරිසකට රැකියා අහිමි විය.

දැන් ඒ අතර ආණ්ඩුව රසායනික පොහොර ගෙන්වීම නතර කිරීමේ හා කෘෂි රසායනික සීමාකිරීමේ තීරණයක් ගෙන තිබේ. මෙය මතුපිටින් බලන විට 'හොඳ' 'රැඩිකල්' තීරණයක් සේ පෙනුණද ක්‍රමානුකූල සැලැස්මකින් තොරව එක්වරම රසායනික පොහොර හා කෘෂි රසායන නතර කිරීම ලංකාවේ කෘෂිකර්මාන්තය විනාශවීමේ මඟක් වන්නේය. දැනටම වී වගාව සඳහා පොහොර හිඟයක් පවතින අතර, එළවළු, පලතුරු, මල්, තේ, කුරුඳු, රබර් වැනි වගාවන්ටද මෙම තීරණය ඉතාම අහිතකර ලෙස බලපා තිබේ. මේ මගින් ලංකාවේ කෘෂිකර්මාන්තය මුළුමනින්ම බිඳ වැටෙන අතර කෘෂිකර්මය මත පදනම් වූ ගැමි ආර්ථිකය විනාශ වී ගොස් ගොවි ජනතාව ඇතුළු ග්‍රාමීය ජනයා ආදායම් නැතිකමින් විශාල පීඩාවකට ලක්වනු ඇත. එසේම රට තුළ ආහාර හිඟයකටද මෙම තීරණය හේතුවන බව පැහැදිලිය.

අනෙක් අතට තේ, කුරුඳු, රබර්, පලතුරු, මල් වැනි වගාවන්ට කරන අහිතකර බලපෑම නිසා ලංකාවේ අපනයන ආදායමද අඩුවී තවත් අර්බුදයකට මඟ පාදනු ඇත. ලංකාවේ සාමාන්‍යයෙන් අපනයන ආදායමින් 25% ක් පමණ ලබාගන්නේ කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කිරීමෙනි. එවිට එම ආදායමටද මෙය අහිතකර ලෙස බලපානු ඇත. ඒ අතර ආහාර ද්‍රව්‍ය පිටරටින් ගෙන්වීමට සිදු වුවහොත් විදේශ විනිමය අර්බුදයද තවත් ඉහළ යනු ඇත.

මේ අතර මෙම තීරණය විසින් විය හැකි තවත් අනතුරක් තිබේ. ඒ, ගොවියා කෘෂිකර්මාන්තයෙන් ඉවත්වූ පසු වගා නොකරන ඉඩම් ටික බහුජාතික සමාගම් විසින් තුට්ටු දෙකට ඩැහැගැනීමේ අනතුරය.

මේ සමස්ත ක්‍රියාවලිය විසින් කෘෂිකර්මාන්තයෙන් යැපෙන විශාල ජනගහනයකට ජීවනෝපාය අහිමිවී ඔවුන් තුළ දැවැන්ත පීඩාවක් හා විරෝධයක් ගොඩනැගෙනු ඇත. මෙම පීඩනය හා විරෝධය දැනටද මතුවෙමින් තිබේ.

මේ සියල්ල අතර කොරෝනා වසංගතය ආණ්ඩුව විසින් නිවැරදි ලෙස කළමනාකරණය නොකිරීම නිසා මුළු සමාජයම ඉන් පීඩාවට පත්ව සිටී. කොරෝනා නිසා විවිධ වර්ගයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පවත්වාගෙන ගිය විශාල පිරිසකට ආදායම් අහිමිවී ඇති අතර බැංකු ණය සහ ලීසිං ගෙවා ගැනීමට නොහැකිවීමේ අර්බුදයකට ඔවුහු මුහුණදී සිටිති. ඊට පිළියමක් ආණ්ඩුව සතුව නැත. එසේම කොරෝනා වසංගතය තුළ පවා කොම්පැනිකාරයන්ට ලාභ උපයාදීමට ආණ්ඩුව උත්සාහ දැරීම නිසා පෞද්ගලික අංශය තුළ රෝගයට ගොදුරුවෙමින් කිසිදු සහනයක් හෝ පහසුකමක් නැතිව වැඩ කිරීමට තරුණ තරුණියන්ට සිදුව තිබේ. ඔවුන් තුළ පවතින පීඩාවද අති විශාලය.

කොරෝනා සඳහා ලබාදෙන එන්නත සැලසුමකට අනුව ලබානොදීම නිසා පෝලිම්වල රස්තියාදුවන ජනතාව තුළද, රෝගීවූ පසු හිරකරුවන්ට මෙන් සැලකීමේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නිසා පීඩාවට පත්වන පවුල් තුළද, එදාවේල සොයාගත් ආර්ථිකය බිඳවැටීමෙන් අසරණව කිසිදු පිළිසරණක් නැතිව දුක්විඳින ජනතාව තුළද, තම තමන්ගේ සේවාවල ගැටලු නිසා රජයේ සේවකයන් තුළද, තම කර්මාන්තය බිඳවැටීම නිසා ධීවරයා තුළද ආදී ලෙස සියලු ජන කොටස් තුළ පීඩාවක්, විරෝධයක් වර්ධනය වෙමින් තිබේ.

මේ විරෝධයට ඇහුම්කන්දී ඊට හැකි පමණින් හෝ පිළියම් සෙවීම වෙනුවට මෙහිදී ආණ්ඩුව අනුගමනය කරන මර්දනකාරී හා හිතුවක්කාරී ක්‍රියාමාර්ග විසින්ද මේ පීඩනය වැඩිකරමින් තිබේ. රට තුළ සංචරණ සීමා පැනවීමේදී ආණ්ඩුවේ බලධාරින් අනුගමනය කළ ක්‍රියා හා ඊට සමාජයෙන් ආ විරෝධයේදී ආණ්ඩුව ඊට මුහුණදුන් ආකාරය මීට නිදසුනකි. සංචරණ සීමා ඉවත්කළ පසුගිය මැයි 25 දින ආණ්ඩුව නිවේදනය කළේ අත්‍යාවශ්‍ය භාණ්ඩ ගැනීමට පවුලකින් එක් අයෙක්ට එළියට යාමට ඉඩ දෙන බවත්, ඔවුන්ට වාහනවලින් යාම තහනම් බවත්, පයින් ගොස් බඩු මිලදී ගත යුතු බවත්ය. පවුලකට දින කීපයකට අවශ්‍ය ආහාර වර්ග, ගෑස් ආදිය පයින් ගොස් අතේ බරට ගෙනඒමට නොහැකි බව තේරුම් ගැනීමට ඕනෑම කෙනෙකුට පුළුවන. මෙයට හාස්‍යජනක විරෝධයක් ලෙස සමහරු

12 වැනි පිටුවට




> කොරෝනා ජාවාරමක් කර ගැනීමට එරෙහි විරෝධයක් සමාජය තුළ තිබේ. පෝට් සිටියේ වැඩි අයිතිය චීනයට ලබාදෙමින් පෝට් සිටි පනත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම පිළිබඳ ගොඩාහයට ඡන්දය දුන් අය තුළ පවා විරෝධයක් තිබේ. ඒ අතර බලන විට පෙනීයන්නේ රට තුළ සෑම ජන කොටසක් තුළම ආණ්ඩුවට එරෙහි විරෝධයක් වර්ධනය වෙමින් තිබෙන බවය.







**YES WE CAN**

# මුතු ඇටය ගිනි ගනී...

පසුගියදා කොරෝනා රෝගීන් 3306ක් වාර්තා විය. මෙම ප්‍රමාණය හමුවන්නේ පරීක්ෂණ 19,314කිනි. නමුත් මැයි මස 6වෙනිදා කළ පීසීආර් පරීක්ෂණ ප්‍රමාණය 27,889කි. ඉන් රෝගීන් හමුවූයේ 1851කි. මෙමගින් පෙනෙන්නේ රෝගීන්ගේ සැලකිය යුතු ඉහළ යාමකි. නමුත්, ආණ්ඩුවේ වගකිවයුත්තන් ප්‍රකාශ කරන්නේ කොරෝනා රෝගය හොඳටම පාලනය කර ඇති බවය. පසුගියදා නාමල් රාජපක්ෂ ඇමතිවරයා මාධ්‍ය හමුවේ කියා සිටියේ ලෝකයේ එන්නත්කරණ වැඩසටහනේ හොඳම රටවල් අතර අප රටද පවතින බවයි. නමුදු යථාර්ථය ඊට හාත්පසින්ම වෙනස්ය.

එන්නත්කරණ ක්‍රියාවලිය අමු අමුවේ දේශපාලනීකරණය වී ඇත. මෙම තකතීරු පාලකයින් කොරෝනා ව්‍යසනයෙන් අසරණව සිටින ජනතාවට ලබාදෙන එන්නතද තම ඡන්ද ගොඩ වැඩිකරගැනීම වෙනුවෙන් පාවිච්චි කරමින් සිටී. එන්නත්කරණ ක්‍රියාවලියට තවමත් ජාතික වැඩපිළිවෙලක් සකසා නැති අතර ලෝකයේ බොහෝ රටවල් විසින් එන්නත්කරණ ක්‍රියාවලිය සඳහා ජාතික වැඩපිළිවෙලක් සකසන ලදී. එම එන්නත්කරණ ක්‍රියාවලිය මෙම රෝගයේ වැඩිම අවදානම සහිත කණ්ඩායම්වල සිට අවදානම අඩුම කණ්ඩායම් දක්වා වර්ගීකරණය කර ලබාදුනි. නමුදු අපේ රටේ එන්නත්කරණ ක්‍රියාවලිය සිදුවන්නේ ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ගේ ඕනෑඑපාකම් අනුවය. මොරටුව සභාපතිවරයාගේ හැසිරීමෙන් එය රටටම නිරාවරණය විය. අවදානම වැඩිම කොටස් හඳුනාගන්නවා වෙනුවට ආණ්ඩු හිතවාදීන් එම ලැයිස්තුවල ඉහළට පැමිණ තිබීම කණගාටුදායකය. එමෙන්ම මේ කොමිස්කාර පාලකයින්ගේ මෙම එන්නත්කරණ ක්‍රියාවලියද අත යට ගනුදෙනු කිරීමට යොදාගැනීම නිර්ලජ්ජිතය.

දැන් මේ පෙනෙන්නේ අපේ රටේ කොමිස්කාර ධනපතියන්ගේ අසමත්කමයි. නිර්ලජ්ජිත බවයි. අමානුෂික බවයි. අද වනවිට මේ පාලකයින් බලයට ඒමට පෙර වහසි බස්දෙඩූ රටේ ජාතික ආරක්ෂාව, සම්පත් රැකගැනීම, ජනතා ආර්ථිකය නගාසිටුවීම වැනි ඊනියා සටන්පාඨ අමු අමුවේ පුස්සක් බවට පත්කරමින් ඇත. පෝට් සිටිය චීනයට බදු දුන්නේ, නැගුණු ජනතා විරෝධය තඹයකට මායිම් නොකොටය. දැන් දැන් දත කන්නේ කොළඹ නගරයේ පිහිටි අප රටේ ජනතාව සතු වටිනා ඉඩකඩම්, ගොඩනැගිලි විදේශිකයින්ට නතු කිරීමටය. කොමිස්කාර ධනපතීන් රකින ඔවුන්ගේ කේවට්ටයින් යොදා මේ මහා ජාතික අපරාධ අයිසින් තැවරූ කේක් ගෙඩියක් බව පෙන්වීමට උත්සාහ දරමින් ඇත.

තවද ජනතාවගේ ජීවන වියදම ගතවන තත්පරයක් පාසාම ඉහළ යමින් ඇත. ආණ්ඩුවේ වැරදි ආර්ථික උපායමාර්ග නිසා මෙම තත්වය තවත් දරුණුවෙමින් ඇත. නිෂ්පාදනයට ඇල්පෙනිත්තක තරම්වත් දායකත්වයක් නොදී ආනයන නවතා දැමීමම මෝඩ, තකතීරු තීරණයකි. මේ නිසා අද භාණ්ඩ මිල ඉහළයාම වළක්වාගත නොහැකි තත්වයට පත්ව ඇත. මෙවැනි පසුබිමක මෙම කොමිස්කාර පාලකයින්ගේ ඉතා සමීප ව්‍යාපාරිකයන්  තම ලාභ ගොඩ වැඩිකරගැනීම සඳහා කෘත්‍රිම ලෙස භාණ්ඩ හිඟයක් නිර්මාණය කර ඇත. ජනතාවට සිදුවන්නේ කබලෙන් ලිපට වැටීමටය.

ජාතික ආරක්ෂාව ගැන නන් දෙඩූවද යුරේනියම් සහිත පුපුරන ද්‍රව්‍ය පටවාගත් නැවක් හම්බන්තොට වරායට වද්දා ගන්නේ රටේ ජාතික ආරක්ෂාව දැවැන්ත අනතුරකට හෙළමින්ය. එපමණක් නොව පසුගියදා එක්ස්ප්‍රස් පර්ල් නෞකාවට කොළඹ වරාය ආසන්නයේ නැංගුරම් ලෑමට ඉඩදෙන්නේද අපේ රටේ ජාතික ආරක්ෂාව සහ අපේ සාගර හා වෙරළබඩ කලාපය අතිදැවැන්ත අනතුරකට හෙළමින්ය. සිදුවූයේ ගිණිය නොහැකි තරම් පාරිසරික විනාශයකි. අනාගත පරම්පරාවද දැවැන්ත අනතුරකට හෙළීමකි.

මෙලෙස අප රට පාලනය කරන කොමිස්කාර ධනපතීන් විසින් ඉන්දියන් සාගරයේ මුතු ඇටය හපකරනු ලැබෙමින් ඇත; කෙළෙසනු ලැබෙමින් ඇත. අනාගතයේදී මේ වටිනා මුතු ඇටය ගිනි ගොඩක් බවට පත්කරන ලකුණු ඇත. මේ වටිනා මුතු ඇටය, අපගේ මාතෘ භූමිය ගිනිගොඩක් බවට පත්වීමට නොදී රැකගැනීම අප කාගෙත් යුතුකමක් වන්නේය. ඒ වෙනුවෙන් මෙම කොමිස්කාර ධනපතීන් පලවා හැර වැඩකරන ජනතාවගේ පාලනයක් නගා සිටුවීම වෙනුවෙන් අවදි විය යුතුය; සටන් කළ යුතුය; එක්සත් විය යුතුය.

# කළු ආණ්ඩුවේ කළු මුහුද



දූපතක් වූ අපට හිමිව ඇති අතිශය වටිනා සම්පතක් වනුයේ මහා සාගරයයි. ආර්ථිකයේ වැඩි පංගුවකට දායක වන සාගරය මිල දන්නා වටිනාකම නොදන්නා අමන පාලකයන්ගේ තීරණ හේතුවෙන් විනාශ වන ආකාරය MV - pearl Express නෞකාව මනාව පෙන්නුම් කරමින් තිබේ. වන්දි ලෙස හිමිවන ඩොලර් වලට කෑදර කමින් එම නැවට මෙරට මුහුදු තීරයට ඇතුළු වන්නට දුන්නද ආණ්ඩුවේ පාර්ශවයන් විසින්ම දැන් ප්‍රකාශ කර සිටිනුයේ අපේකෂා කළ අන්දමේ වන්දියක් ලබාගත නොහැකි වනු බවය. වන්දියක් ලැබුණද මින් සිදුවූ පාරිසරික හානිය යතාවත් කළ නොහැකි බව මේ පාලකයන්ට වැටහෙන්නේ ද නැත. ඔවුන්ට ඒ පිළිබඳ අමාරුවක් ඇත්තේද නැත. ධනවාදය තුළ ඔවුන්ට එය තවත් ආර්ථික මාර්ගයක් පමණක් වන බැවිනි. කටාර් සහ ඉන්දියාවේ වරායවල් මෙම නැව ප්‍රතික්ෂේප කරද්දී අපේ පාලකයන් ඊට ඉඩ දෙන්නේ එබැවිනි.

අප වායුගෝලයේ ඔක්සිජන් ප්‍රතිශතයෙන් 50% - 80%ත් අතර ප්‍රමාණයක් නිපදවනු ලබන්නෙ පෘතුවි ගෝලයෙන් වැඩි කොටස අත්පත් කරගෙන සිටිනු ලබන සාගර විසිනි. ඉන්දියන් සාගරයේ අප සාගර කලාපය යනු ජෛව විවිධත්වය අතින් සුවිශේෂී කලාපයකි. විශේෂයෙන්ම මෙම නැව ගිනි ගැනීමට ලක්වූ නොගැඹුරු මුහුදු කලාපය යනු අතිශය සංවේදී හා ජෛව විවිධත්වය අතින්  ඉහළ ප්‍රදේශකි. නීති විරෝධී ලෙස මෙරටින් ගෙන යාමට තැත් කිරීමේදී අල්ලා ගන්නා මුහුදු ජීවීන්ද අත්හරිනු ලබන්නෙ මෙම නොගැඹුරු සාගර කලාපයටය. එවැනි සංවේදී හා සුවිශේෂී සාගර කලාපයකට නයිට්‍රික් අම්ල ටොන් 25 ක්, පොලිතින් සහ ප්ලාස්ටික් අඩංගු බහාලුම් 87, යූරියා බහාලුම් 88, කොස්ටික් සෝඩා බහාලුම් 42, ලිහිසි තෙල් වර්ග සහිත බහාලුම් 30, ඊයම් බහාලුම් 8 ක් ඇතුළු මෙතනෝල් වැනි පරිසරයට අහිතකර රසායනික ද්‍රව්‍ය අඩංගු ගිනි ගනිමින් පවතින නැවකට පැමිණීමට ඉඩ දීමෙන් සිදුවූ පාරිසරික හානිය තවත් වසර 25කට පමණ යතාවත් කළ නොහැකිය. මන්ද මෙම නැවේ තිබූ නයිට්‍රික් අම්ලය යනු ජීවී පටක ඔක්සිකරණයට හේතුවන එමෙන්ම ස්පර්ශ වුවහොත් ප්‍රබල පිළිස්සීම් ඇති කරන, තවද ජලයේ ph අගය සීඝ්‍ර ලෙස හීන කරවන අතිශය අන්තරාකාරී රසායනිකයකි. සාගර ජලයේ ධාරිතාව අතිමහත් සහ එහි ස්වාරක්ෂක ගුණය නිසා සාගර ජලයේ ph අගය සැලකිය යුතු ලෙස පහළ නොගියද එය ජලය සමඟ තනුක වනතෙක් කාලය තුළ ජීවීන්ට හානිකර වේ. එමෙන්ම නයිට්‍රික් අම්ලය දහනයේදී උපදින නයිට්‍රස් ඔක්සයිඩ සහ නයිට්‍රජන් ඩයොක්සයිඩ් අම්ල වැසි ඇති වීමට හේතු වේ. විශේෂයෙන්ම ගිලීගිය බහාලුම් තුළ වන නයිට්‍රික් අම්ලය සාගර පතුලේදී නිදහස් වුවහොත් එය ජලය සමඟ තනුක වනතෙක් මත්ස්‍යයන්, පැළෑටි, කොරල්පර වැනි ජීවීන්ට අතිශය හානිකර ප්‍රතිඵල ගෙන එන්නේය. එමෙන්ම මෙම අම්ලය සාගර ජලයේ ඇතැම් ද්‍රව්‍ය සහ නැවේ පැවති කොස්ටික් සෝඩා, සෝඩියම් මොනොක්සයිඩ් සමඟ ප්‍රතික්‍රියා කිරීමෙන් සාගර පතුලේ නයිට්‍රේට් මට්ටම වැඩි කර යම් කාල සීමාවකට දරාගත නොහැකි තරමට ඇල්ගී සහ සයනො බැක්ටීරියා වර්ධනය කරන අතර එය මුහුදු ජීවීන්ට අහිතකර වේ. තවද නැවේ තිබූ සෝඩියම් මොනොක්සයිඩ් අන්තරායකර රසායනික කාණ්ඩකරණය යටතේ වර්ගීකරණය තිබූ අතර එහි විෂභාවය මාරක මාත්‍රාව ලෙස ද සඳහන්ව තිබිණ. ඒවා ජලය හා එක්ව සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් නම් ප්‍රබල භෂ්මය නිපදවන අතර එයද ජීවීන්ගේ පැවැත්මට අතිශය හානිකර වේ.

තවද මෙම නැව ගිනි ගැනීම හේතුවෙන් සිදුවූ දීර්ඝ කාලීන හානිය වනුයේ ඉන් පිටවූ ප්ලාස්ටික් බිඳිතිය. පවතින නිරිතදිග.මෝසම් සුළං හේතුවෙන් මේවන විට දික්වැල්ල සහ මීගමුව දක්වා වෙරළ තීරයට ඒවා ගොඩ ගසමින් තිබේ. එමගින් කොරල්පර, වැලි පර මෙන්ම ගල්පර පවා තර්ජනයට ලක්වන අතර ආහාර දාමය ඔස්සේ මිනිසුන්ගේ ශරීරටද ඇතුල් විය හැකිය. මේවා වියෝජනය වීමට වසර 25කට අධික කාලයක් යන අතර ඒ සඳහා වැය වනුයේ සාගර ජලයේ ඔක්සිජන්ය. මේ විනාශයේ හානිය මෙතරම් බරපතල වුවද පාලකයන්ට ඉන් එලක් නැති අතර මේ වන විටත් සාගර දූෂණයෙන් ලොව 5 වන තැන සිටින අපට අංක 1 වීම තුළින් හොඳටම කළ තරම වැඩිකල් නොගොස් පෙන්වීමට හැකිවනු ඇත.

## කනත්තට හෙළා රට



බලන් අවරගිර
මුහුදේ ගිලෙන ඉර
ජීවිත දහස් ගණනින්
තුරුළු කර තදින්..

ලාබෙට ගෙනත් මරණය
පාඩු නෑ ලොකු අත්වලට
කොම්පැනි සේප්පුවට
එන්නතත් ලිස්ට් එකට..

බිස්නස් මැෂිමක්
සැනිටයිසර්,මාස්ක්
ෆෝන්,ඩේටා කාඩ්
සූරන්න, සාක්කු, හිස්...

වසංගතයම පතන
මහ හොරුන් ලිහන
හිමින් රට වනසන
මීඩියා ටෝක් සනසන..

ලොවම ඉල්ලන මනුදම්
ලොවක සැනසුම් මල්දම්
සුවඳින් සරසන්න නම්
අවැසි සමබිමකි මනරම්..

# දේශප්‍රේමයේ සැබෑව හා ව්‍යාජය


ලාංකේය දේශපාලනය තුළ 'දේශප්‍රේමීන්' ලෙස වෙස්වළාගෙන සිටියවුන්ගේ සැබෑ නිරුවත හෙළි වූ සිදුවීමක් පසුගියදා ලංකාවේදී සිදුවිය. ඒ වරාය නගරයේ වැඩි අයිතිය චීනයට ලබාදෙන, ලංකාවේ ස්වෛරීත්වයට හානිකරන වරාය නගර සංවර්ධන කොමිෂන් සභා පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීමය. ආණ්ඩු පක්ෂයේ සියලු දෙනා හා රතන හිමියෝද පනතට පක්ෂව ඡන්දය දී තම ඊනියා දේශප්‍රේමී සළුපිළි ප්‍රසිද්ධියේ උණා දැමූහ.

ඉතාම වටිනා දේශපාලන සංකල්පයක් වූ දේශප්‍රේමය, පසුගිය කාලය පුරාම බලයට කෑදර ධනපති දේශපාලන තක්කඩියන් විසින් ගණිකා වෘත්තියේ යොදවනු ලබන හැටි ලොව පුරා රටවල් රැසකදී විටින් විට අපට දැකගත හැකි විය. දේශපාලන තක්කඩිකමෙන් සැබෑ දේශප්‍රේමය වෙන්කොට හඳුනාගත යුතු වන්නේ ඒ නිසාය.

## කුමක්ද මේ දේශප්‍රේමය

දේශප්‍රේමය නැමති සංකල්පය ප්‍රධාන දේශපාලන සටන් පාඨයක් ලෙස මතුවූයේ පැරණි වැඩවසම් ආධිපත්‍යය බිඳ දමමින් ධනපති ක්‍රමය බිහිවීමත් සමඟ ධනපති ජාතික රාජ්‍ය බිහිකර ගැනීමේ අවස්ථාවලදීය. විශේෂයෙන්ම ධනවාදය බිහිවන විට පැරණි වැඩවසම් රාජ්‍යයන්ට යටත්ව යටත්විජිත ලෙස පැවති රටවල් යටත්විජිතභාවයෙන් මිදී ධනේශ්වර ජාතික රාජ්‍ය නිර්මාණය කර ගැනීම සඳහා කළ සටන්වලදී දේශප්‍රේමය මනෝභාවයක් ලෙස, සටන්පාඨයක් ලෙස භාවිත විය. දේශප්‍රේමයේ සරලතම තේරුම තමන්ගේ රටට, තම මව්බිමට ආදරය කිරීම හා එය එහි සතුරන්ගෙන් රැක ගැනීමට, එහි නිදහස දිනා ගැනීමට සටන් කිරීමය. එබැවින් ධනවාදය තුළ ආරම්භයේ මතුවූ දේශප්‍රේමය ප්‍රගතිශීලී එකක් විය.

එහෙත් ධනවාදය සමාජ ක්‍රමයක් ලෙස යල්පැන ගොස් අර්බුදයට පත්ව ඇති මේ යුගයේ, ධනවාදයට, ධනපති පංතියට තවදුරටත් දේශප්‍රේමී විය නොහැකි අතර දැන් ඔවුන්ගේ දේශප්‍රේමය ජනතාව රැවටීමේ තක්කඩි උපායක් පමණි. විශේෂයෙන්ම ධනවාදය අධිරාජ්‍යවාදයට ගොස් නව ලිබරල්වාදී ආර්ථික දේශපාලන ප්‍රතිපත්තියක් තුළ පවතින විට ලොව කිසිදු ධනපති කණ්ඩායමකට ඉන් මිදී වෙනම පැවතිය නොහැක. ඒ නිසාම මේ යුගයේ ධනපති දේශපාලන කණ්ඩායම්වලට දේශප්‍රේමී විය නොහැක.




## දේශප්‍රේමයේ ආකාර

ධනේශ්වර ජාතික රාජ්‍ය බිහිවූ මුල් අවදියේ එම ජාතික රාජ්‍ය වෙනුවෙන් සටන් වැදුනු දේශීය ධනපති කණ්ඩායම් දේශප්‍රේමී සටන්පාඨ තුළ කටයුතු කළ බව අපි කලින්ද සඳහන් කළෙමු. ඒ දේශප්‍රේමය මතුවූ එක් ආකාරයකි. එසේම ධනවාදය අධිරාජ්‍යවාදයට යාමත් සමග පැරණි යටත්විජිත, අධිරාජ්‍යවාදය විසින්ද කලක් එලෙසම පවත්වාගෙන ගිය අතර එම යටත්විජිතවාදයට එරෙහිව යටත්විජිත ලෙස පැවති රටවල නිදහස් අරගල බිහිවිය. එම නිදහස් අරගල හෙවත් ජාතික විමුක්ති අරගලවලදී දේශප්‍රේමය සංකල්පයක් ලෙස, සටන් පාඨයක් ලෙස විශාල කාර්යභාරයක් ඉටුකළේය. එහිදී කිසියම් දුරක් දක්වා දේශීය ධනපති කණ්ඩායම්ද යටත්විජිතකරණයට එරෙහිව දේශප්‍රේමීහු ලෙස කටයුතු කළහ. පළමු ලෝක යුද්ධය හා දෙවන ලෝක යුද්ධය අතර කාලය තුළත් දෙවන ලෝක යුද්ධය නිමාවූ අසන්න කාලය තුළත් මෙම ජාතික විමුක්ති අරගල පැවති අතර ඒවා දේශප්‍රේමී විය.

ලෙනින් විසින් සමාජවාදී විප්ලවයේ උපායමාර්ගය ලෙස යොදා ගන්නා මෙන් 3වැනි ජාත්‍යන්තරයේ පක්ෂවලට උපදෙස් දෙනු ලැබුවේද මෙම ජාතික විමුක්ති අරගලයන්ය.

මීළඟට දේශප්‍රේමය හඳුනාගත හැකි අවස්ථා වන්නේ යුද්ධ නිර්මාණය කොට රටවල් ආක්‍රමණය කිරීමත් සමගය. බලවත් රටක් විසින් තවත් රටක් ආක්‍රමණය කළ විට එම ආක්‍රමණයට එරෙහිව ආක්‍රමණයට ලක්වූ රටේ ජනතාව කරන අරගලයද දේශප්‍රේමී අරගලයක් වේ. දෙවන ලෝක යුද්ධයේදී නාසි ආක්‍රමණයට එරෙහිව සෝවියට් දේශය විසින් ගෙනගිය සටන හැඳින්වූයේ දේශප්‍රේමී යුද්ධය ලෙසය. එසේම නාසි ආක්‍රමණයට එරෙහිව යුරෝපා රටවල පැවති අරගලද දේශප්‍රේමී අරගල විය. එසේම ලංකාවේ 1987 ඉන්දු-ලංකා ගිවිසුම තුළින් ඉන්දියානු හමුදාව ලංකාවට ගොඩබැසීමට එරෙහි අරගලය දේශප්‍රේමී අරගලයක් විය.

> ධනවාදය අධිරාජ්‍යවාදයට ගොස් නව ලිබරල්වාදී ආර්ථික දේශපාලන ප්‍රතිපත්තියක් තුළ පවතින විට ලොව කිසිදු ධනපති කණ්ඩායමකට ඉන් මිදී වෙනම පැවතිය නොහැක. ඒ නිසාම මේ යුගයේ ධනපති දේශපාලන කණ්ඩායම්වලට දේශප්‍රේමී විය නොහැක.

## දේශප්‍රේමය හා වම

නූතන ධනවාදය තුළ, නව ලිබරල් ක්‍රමය තුළ තවදුරටත් කිසිම ධනපති කණ්ඩායමකට දේශප්‍රේමී විය නොහැක. මන්ද ඔවුන් ලෝක බලවතුන්ට යටත්වී ඒ මත යැපෙන අය බවට පත්වී ඇති නිසාය. ඒ අනුව දැන් දේශප්‍රේමයට එක්ව ගමන්කළ හැක්කේ වමේ ව්‍යාපාරය සමග පමණි. අධිරාජ්‍යවාදය නව ලිබරල් උපායමාර්ගය තුළත්, ලොව ආර්ථික වශයෙන් බලගතු රටවල් තම ආර්ථික, දේශපාලන හා යුදමය අවශ්‍යතා සඳහාත් විවිධ ආකාරයෙන් පරිධියේ ඌණ සංවර්ධිත රටවල් මත ආධිපත්‍යය පතුරුවමින් ඒවා තම අරමුණු වෙනුවෙන් මෙහෙයවයි. මේ සඳහා අධිරාජ්‍යවාදීන් මෙන්ම ආර්ථික වශයෙන් බලවත් රාජ්‍යයන්ද යොදගනු ලබන්නේ මෙම පරිධියේ රටවල සිටින බලයට කෑදර, මුදලට කෑදර ධනපති පක්ෂ හා කණ්ඩායම් හා නායකයින්ය.

මෙම රටවල බිඳදමා ඇති ආර්ථිකය ඇදගෙන යාමට ණය දීම මගින්ද ණයට හිලව්වට එම රටවල සම්පත් තමන් සතුකර ගැනීම මගින්ද ඒ සඳහා එම රටවල දුබල ධනපති නායකයින්ට අල්ලස් ලබාදීම මගින්ද ප්‍රබල රටවල් මෙම දුබල රටවල් තම අවශ්‍යතා සඳහා යොදා ගනිති. එවිට එම රටවල් ඉදිරියේ නව යටත්විජිත ලෙස පැවති දැනුදු වෙනස් ආකාරයෙන් විවිධ බලවතුන්ට යටත්වන රටවල ජනතාව ඉදිරියේ සැබෑ නිදහස් අරගලයක් පවතී; ජාතික විමුක්ති අරගලයක් පවතී. එය දේශප්‍රේමී අරගලයකි. එහෙත් එම අරගලයේ බලවේගයක් බවට පත්වීමට මෙම රටවල් විදෙස් බලවතුන්ට පාවාදී ඇති ධනපති කණ්ඩායම්වලට නොහැක. ධනපති කණ්ඩායම්වලින් යැපෙන කුඩා දේශපාලන කණ්ඩායම්වලට හෝ පුද්ගලයන්ටද නොහැක. ඔවුන්ට කළ හැක්කේ, ලංකාවේදී පසුගිය දිනවල සිදුකළාක් මෙන් ජනතාව රවටා බලය ගැනීම වෙනුවෙන් දේශප්‍රේමීන් ලෙස බොරුවට රඟපෑමය; ව්‍යාජ දේශප්‍රේමයක් ආරෝපණය කර ගනිමින් ටික දිනකට ජනතාව රැවටීමය. ලාංකේය දේශපාලනයේ මේ දිනවල අප දකිමින් සිටින්නේ එයයි.

## ජාතිවාදය හා දේශප්‍රේමය

අප වැනි රටවල සමහර අය සිතා සිටින ලෙස දේශප්‍රේමය යනු ජාතිවාදය නොවේ. දේශප්‍රේමය ප්‍රගතිශීලී සංකල්පයක් වන අතර ජාතිවාදය ඉතාම ප්‍රතිගාමී මනෝභාවයකි. ජාතිවාදය ජනතාව බෙදා වෙන්කර එකිනෙකා පසමිතුරු කර ජනතාව දුර්වල කරන අතර එය සේවය කරන්නෙ අධිරාජ්‍යවාදයට, ධනවාදයට හා ප්‍රතිගාමීත්වයටය. ඒ නිසාම දේශප්‍රේමයට ජාතිවාදය සමග කිසිදු සබඳකමක් නැත. ජාතිවාදය යනු ජාතිවාදයම මිස දේශප්‍රේමය නොවේ. ජාතිවාදයේදී එක් ජාතිකත්වයක් වෙනුවෙන් තවත් ජාතිකත්වයක් පීඩාවට පත්කරයි. එකම රටේ ජනයා අතර සතුරුකම් ඇති කරයි. එය රටක නිදහසට බාධා කරන බැවින් එය දේශප්‍රේමයට හානිකරය. එබැවින් ජාතිවාදීන්ට හෝ ධනපති දේශපාලන කණ්ඩායම්වලට මේ යුගයේ දේශප්‍රේමීන් විය නොහැක.

ණය වෙනුවෙන්, තමන්ට ලැබෙන කොමිස් මුදල්, විදේශ සංචාර, වෙනත් පෞද්ගලික ලාභ හා බලය සඳහා ලෝක බලවතුන් ඉදිරියේ දණින් වැටෙන, ඔවුන්ගෙන් යැපෙන, දුර්වල, නිවට, පරාධීන ධනපති පාලකයින්ට, දේශප්‍රේමීන් විය නොහැක. සත්‍යය එයයි.

මේ අනුව මේ යුගයේ දේශප්‍රේමීන් විය හැක්කේ ධනවාදයට, අධිරාජ්‍යවාදයට, නව ලිබරල් ක්‍රමයට එරෙහිව සමාජවාදය වෙනුවන් සටන් කරන, වමේ ව්‍යාපාරයන්ටය; ජාතිවාදයට එරෙහිව ජාතික සමගිය වෙනුවෙන් සටන් කරන වමේ ව්‍යාපාරයන්ටය. දැන් දේශප්‍රේමය, සැබෑ ජාතික නිදහස් අරගලය සමග එනම් අධිරාජ්‍යවාදයෙන් හා සියලු ව්‍යාප්තවාදයන්ගෙන් මිදී ස්වාධීන ස්වෛරී රාජ්‍යයක් වෙනුවෙන් වන අරගලය සමග පමණක් සමපාත වේ. එම අරගලයට නායකත්වය දිය හැක්කේ මේ යුගයේදී සැබෑ වමේ ව්‍යාපාරයකට පමණි. ඒ නිසාම වත්මන් යුගයේ දේශප්‍රේමීන්ට අත්වැල් බැඳගත හැක්කේ වම සමග පමණි.

# පලස්තීනය: එළිමහන් සිරකඳවුරක් ලෙස පහරකෑමට ලක්ව



ඊශ්‍රායලය පලස්තීනයේ ගාසා තීරයට ගුවන් ප්‍රහාර එල්ල කිරීමට පටන් ගත්තේ මැයි 10 වනදාය. දින 11ක් පුරා සිදුකෙරුණු ගොඩබිම් හා ගුවන් ප්‍රහාරවලින් පලස්තීන වැසියන් 240කට වැඩි පිරිසක් ජීවිතක්ෂයට පත්වීමෙන් පසු ඊශ්‍රායලය සටන් විරාමයකට එකඟ විය. ඊජිප්තුවේ මැදිහත් වීමෙන් ගෙන ආ සටන් විරාමය මැයි 21 දින සිට ක්‍රියාත්මක විය.

රාමසාන් මාසය තුළදී ඊශ්‍රායලය විසින් පනවා තිබූ එක්රැස්වීමේ සීමාවලට හා ෂික් ජාරා ප්‍රදේශයේ වැසියන් බලහත්කාරයෙන් ඉවත් කිරීමට එරෙහිව පලස්තීනුවන් මීට සති කිහිපයකට පෙර සිට විරෝධතා දැක්වීම ආරම්භ කර තිබුණි. මෙම විරෝධතවලදී පලස්තීන ජනතාව හා ඊශ්‍රායල ආරක්ෂක අංශ අතර ගැටුම් ඇති වූ නමුත් හමාස් සංවිධානය විසින් ඊශ්‍රායලයට රොකට් ප්‍රහාර එල්ල කිරීමට බලපෑ ආසන්නතම හේතුව වූයේ අල් අක්සා පල්ලියේ සිදු කළ සාමකාමී ආගමික වතාවත්වල යෙදී සිටි පලස්තීනුවන්ට එම පල්ලිය තුළට කඩා වැදුණු ඊශ්‍රායල ආරක්ෂක අංශ විසින් කඳුළු ගෑස් හා රබර් උණ්ඩ ප්‍රහාර එල්ල කරමින් 90කට වැඩි පිරිසකට තුවාල සිදු කිරීමයි. හමාස් සංවිධානය විසින් එල්ල කළ රොකට් ප්‍රහාරවලින් ඊශ්‍රායල වැසියන් 13දෙනෙකු (ඉන් එක් අයෙක් ඉන්දියන් ජාතික කාන්තාවකි.) ජීවිතක්ෂයට පත් විය. සාමාන්‍යයෙන් මෙවැනි අවස්ථාවලදී හමාස් සංවිධානය ප්‍රතිචාර දක්වන්නේ ඊශ්‍රායල ආරක්ෂක අංශ වෙත ප්‍රහාර එල්ල කිරීමෙන් නොවේ; ඊශ්‍රායල සාමාන්‍ය වැසියන් ඉලක්ක කරගනිමින් ප්‍රහාර එල්ල කිරීමෙනි.

මෙම ගැටුම් ඇතිවන අවස්ථාව වන විට පලස්තීන පාලන අධිකාරිය සඳහා නියෝජිතයන් පත්කර ගැනීම වෙනුවෙන් වූ මැතිවරණය මැයි - ජුනි මාසවලදී පැවැත්වීමට ෆාටා සංවිධානය හා හමාස් සංවිධානය අතර එකඟත්වයක් ඇති වී තිබුණි.

හමාස් වරුන්ගේ රොකට් ප්‍රහාරවලට ප්‍රති ප්‍රහාර ලෙස ඊශ්‍රායලය ගුවන් ප්‍රහාර එල්ල කරන ලද්දේ පලස්තීන වැසියන් වාසය කරන ගොඩනැගිලි, ප්‍රදේශ, සහ ඔවුන්ගේ සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉලක්ක කරගනිමිනි. එය ඊශ්‍රායලයේ යුද උපක්‍රමයකි. පලස්තීන ප්‍රදේශවල විදුලිය විසන්ධි වී ඇති අතර ජල සැපයුම් මාර්ගද විනාශ වී තිබේ. අපද්‍රව්‍ය බැහැර කෙරෙන නළ පද්ධතිවලට හානි පැමිණීම නිසා අපද්‍රව්‍ය මාර්ග පුරා ගලායන්නට පටන් ගත්තේය. ගාසා තීරයේ සෞඛ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යා ලේඛනවලට අනුව 2000කට ආසන්න පලස්තීනුවන් පිරිසක් තුවාල ලබා ඇත. නිවාස ඒකක 2000ක් මුළුමනින්ම විනාශ වී ඇත. තවත් නිවාස 15,000කට පමණ හානි සිදුවී තිබේ. ජනතාව පදිංචි වී සිටි ගොඩනැගිලි ගණනාවක් මුළුමනින්ම විනාශ කර දමනු ලැබ තිබේ. මැයි 15 වැනි දින ඊශ්‍රායලය ඇසෝෂියේටඩ් ප්‍රෙස් හා අල් ජසීරා මාධ්‍ය ආයතනවල කාර්යාල පිහිටි ගොඩනැගිල්ලටද ගුවන් ප්‍රහාර එල්ල කර විනාශ කර දමන ලදී.

මේ තත්වය තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය අවස්ථා කිහිපයකදීම වහාම සටන් විරාමයක් ඇති කරන ලෙස ඉල්ලා සිටීමට සූදානම් වුවද එක්සත් ජනපදයේ බයිඩන් පාලනය විසින් එය වළක්වනු ලැබිණි. ඒ සම්බන්ධයෙන් එක්සත් ජනපදයට ස්තූතිය පළකරමින් ට්විටර් පණිවුඩයක් යවන ඊශ්‍රායල් ආරක්ෂක ඇමති බෙනී ගාන්ට්ස් මෙසේ ලියා තිබුණි. 'ගාසා තීරයේ ඊශ්‍රායෙල් ක්‍රියාකාරිත්වය හෙළා දකිමින් නිකුත් කිරීමට සූදානම් වූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල නිවේදනය නිවැරදි ලෙස වැළැක්වීම පිළිබඳ එක්සත් ජනපද පාලනයටත් විශේෂයෙන් පසුගිය සතියේදී ඒ පිළිබඳ මා සමඟ සාකච්ඡා කළ එක්සත් ජනපද ආරක්ෂක ලේකම් ලොයිඩ් ඔස්ටින්ටත් මාගේ අවංක ස්තූතිය පළ කරමි.'

ඊශ්‍රායලය යනු අධිරාජ්‍යවාදීන් විසින්, විශේෂයෙන්ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් විසින් මැදපෙරදිග කලාපය තුළ ඔවුන්ගේ අධිරාජ්‍යවාදී වුවමනාවන් ඉෂ්ට කරගැනීම වෙනුවෙන් ගොඩනගන ලද කුලී රාජ්‍යයයි. පළමුවන ලෝක යුද්ධයේදී ඔටෝමන් අධිරාජ්‍යය පරාජයට පත්වීමෙන් පසු පලස්තීනය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අතට පත්වෙද්දී එහි ඊශ්‍රායලය නමැති රාජ්‍යයක් නොපැවතිණි. එහි සිටි බහුතරයක් අරාබි සම්භවයක් සහිත පලස්තීන ජාතිකයන් වූ අතර සුළුතරය යුදෙව් සම්භවයක් සහිත පලස්තීන ජාතිකයෝ වූහ.

පලස්තීනය තුළ යුදෙව් රාජ්‍යයක් පිහිටුවීම ඉලක්ක කර ගනිමින් ලෝක සියොන්වාදී (යුදෙව්වාදී) සංවිධානය බිහිවන්නේ 1897දීය. යුදෙව් ජාතිවාදී ධනේශ්වර ව්‍යාපාරයක් වූ එහි මැදිහත් වීමෙන් පලස්තීනය තුළ යුදෙව් ජනාවාසකරණය ඇරඹිණි. 1917 නොවැම්බර් 02 දින බොල්ෆෝර් ප්‍රකාශනය මගින් යුදෙව් ජාතිවාදීන්ට පලස්තීනය තුළ වෙනම යුදෙව් රාජ්‍යයක් ඉදිකරදීමට පොරොන්දු විය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඒ අනුව පලස්තීනය තුළ යුදෙව් ජනාවාසකරණයටත් ඒ හරහා පලස්තීන ජනතාව තම ඉඩම්වලින් පන්නා දමා ප්‍රදේශ අත්පත් කර ගැනීමටත් සන්නද්ධ වීමටත් යුදෙව්වාදීන්ට ඉඩකඩ හා ආධාර ලබා දෙන ලදී.

1948දී බ්‍රිතාන්‍යයන් පලස්තීනය හැරදා ගිය වහාම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ සහය ඇතිව සන්නද්ධව සිටි යුදෙව්වාදීන් පලස්තීන ප්‍රදේශ අත් පත් කරගනිමින් ඊශ්‍රායලය ප්‍රකාශයට පත් කරන ලදී. ඒ මොහොතේදී ජෝර්දානය බටහිර ඉවුරත් ඊජිප්තුව ගාසා තීරයත් අත් පත් කර ගත්තේය.

ඉන් පසුව ඊශ්‍රායලයට දිගින් දිගටම ආධාර කරනු ලැබුවේ එක්සත් ජනපදයයි. 1985 සිට එක්සත් ජනපදය ඊශ්‍රායලයට වාර්ෂිකව ඩොලර් බිලියන 03 බැගින් ආධාර කල අතර 1976 සිට 2004 දක්වා කාලය තුළදී, දෙවන ලෝක යුද්ධයෙන් පසු වැඩිම එක්සත් ජනපද ආධාර ප්‍රමාණයක් ලද රට වන්නේ ඊශ්‍රායලයයි. එහි සමස්ත එකතුව ඩොලර් බිලියන 146කි. 2019 වසරේදී පමණක් එක්සත් ජනපදය විසින් ඊශ්‍රායලයට ඩොලර් බිලියන 3.8ක යුද ආධාර ලබා දී තිබේ. ආරම්භයේදී එක්සත් ජනපදය ඊශ්‍රායලයට ප්‍රධාන වශයෙන් ලබා දෙන ලද්දේ ආර්ථික ආධාර වුවද මේ වනවිට එහි වැඩි පංගුව යුදමය ආධාර බවට පත්ව තිබේ. ඊශ්‍රායලයට ආර්ථික, යුදමය හා වෙනත් ආකාරයන්ගෙන් ආධාර ලබාදෙන එක්සත් ජනපදය උපායමාර්ගිකව වැදගත් සිනායි අර්ධද්වීපය හා සූවස් ඇල අවට ප්‍රදේශයේත් මැද පෙරදිග කලාපය තුළත් සිය ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහා ඊශ්‍රායලය යොදා ගනිමින් සිටියි.

හමාස් සංවිධානය බිහිවන්නේ 1987දී පලස්තීන විමුක්ති සංවිධානයෙන් බිඳී ගිය පිරිසකගෙනි. එය සුන්නි අන්තවාදී සංවිධානයක් වන අතර ඊශ්‍රායලයේ පැවැත්ම නොපිළිගනී. මෙම සංවිධානයට යුදමය හා දේශපාලන ලෙස අංශ දෙකක් ඇත. 2006 වසරේදී සමස්ත ආසන 132න් ආසන 74ක් දිනාග නිමින් පලස්තීන අධිකාරියේ බලය අත්පත් කර ගැනීමට හමාස් සංවිධානයට හැකි විය.

හමාස් සංවිධානය පලස්තීනය තුළ තහවුරුවීමට ප්‍රථම පලස්තීන ජනතාවගේ අයිතීන් වෙනුවෙන් සටන් වැදුනේ පලස්තීන විමුක්ති සංවිධානයයි. 1964දී පිහිටවූ එම සංවිධානයේ නායකයා වූයේ යසර් අරෆත්ය. සෝවියට් දේශය ඇතුළු සමාජවාදී කඳවුර පැවති අවධියේදී පලස්තීන ජනතාවගේ සාධාරණ අරගලයට ලොව පුරා හඬක් නැගුණි. සමාජවාදී කඳවුර බිඳ වැටීමත් සමඟ පලස්තීන ජනතාවගේ අරගලයද දුර්වල විය. විශේෂයෙන්ම 1993 වසරේදී ඔස්ලෝ ගිවිසුම අත්සන් කිරීමත් සමඟ පලස්තීන ජනතාව අතර පලස්තීන විමුක්ති සංවිධානයේ බලපෑම දුර්වල වී වඩාත් සටන්කාමී ලෙස පෙනී යන හමාස් සංවිධානය කෙරෙහි පලස්තින ජනතාව විශ්වාසය තබන්නට විය. එසේ වුවද හමාස් සංවිධානයද පලස්තීන ජනතාවගේ සාධාරණ අරගලයට නිවැරදි නායකත්වයක් දීමෙහි අසමත් බව පෙනෙන්නට තිබේ.

හමාස් සංවිධානය ඊශ්‍රායලයේ පැවැත්ම නොපිළිගන්නා නමුදු එක්සත් ජාතීන්ගේ සංවිධානයත් අනෙකුත් බොහෝ ප්‍රගතිශීලී සංවිධානත් පලස්තීනය හා ඊශ්‍රායලය ලෙස රටවල් දෙකක පැවැත්ම පිළිගන්නා අතර දෙරටෙහි දේශ සීමාව 1967 වසරේ සය දින යුද්ධයට පෙර පැවති දේශ සීමා වෙත යන ලෙස ඉල්ලා සිටී.

ඊශ්‍රායලය විසින් පලස්තීනයට මෙවර එල්ල කරන ලද ප්‍රහාර මාලාවට එරෙහිව ලොව පුරා විරෝධතා පැනනැගුණි. පලස්තීන ජනතාවට සහය දැක්වීම සඳහා ලන්ඩන් නුවරට 100,000ක පමණ ජනතාවක් එක්රැස් වී තිබුණි. ඉතාලියේ ලිවෝර්නෝහි ටස්කන් සිටි වරාය කම්කරුවෝ ඊශ්‍රායලය වෙත යැවීමට තිබූ ආයුද නැවකට බඩු පැටවීම ප්‍රතික්ෂේප කළහ. පලස්තීන ජනතාවද මැයි 18 වනදා සමස්ත මහා වැඩ වර්ජනයකට අවතීර්ණ වී ඊශ්‍රායල අපරාධවලට විරෝධය පාමින් පාගමනක නිරත වූහ. ඊශ්‍රායලය මෙම විරෝධතා පා ගමනටද පහර දුන්නේය. ඉන් පුද්ගලයෝ දෙදෙනෙක් මියගොස් 100කට ආසන්න පිරිසක් තුවාල ලැබූහ.

ඊශ්‍රායලය පලස්තීනයට එල්ල කරන ගුවන් ප්‍රහාර නතර කළද පලස්තීන ප්‍රදේශ අත්පත් කරගැනීම හෝ කලාපය තුළ එක්සත් ජනපද වුවමනාවන් වෙනුවෙන් ත්‍රස්ත ක්‍රියාවල නිරත වීම නතර කර දමා නැත. ලෝකයේ විශාලතම එළිමහන් සිර කඳවුර බවට පත්ව ඇත්තේ පලස්තීනයයි. අනෙක් අතට ඊශ්‍රායෙල් ජාතිකයෝද පලස්තීන ජාතිකයන් මෙන්ම අධිරාජ්‍යවාදී උගුලක සිර කර දමනු ලැබ සිටිති. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ වුවමනා එපාකම් ඉටු කරන රාජ්‍යයක් තුළ ඔවුන්ව සිරකර තබා ගනිමින් මිනිස් පලිහක් බවට පත් කර ගෙන තිබේ.

## ඉන්දියාව: ප්‍රාන්ත මැතිවරණවලින් මෝදිට පසුබෑමට සිදුවී



ඉන්දියාවේ ප්‍රාන්ත පාලනයන් හතරක් සහ එක් එක්සත් පාලන ප්‍රදේශයක් වන පොන්ඩිචෙරි සඳහා වන ප්‍රාන්ත මැතිවරණ මාර්තු 27 සිට අප්‍රේල් 29 දක්වා කාලය තුළ පැවැත්වුණි. මෙම මැතිවරණවලදී ඉන්දියාවේ පාලක භාරතීය ජනතා පක්ෂයට විශාල පසුබෑමක් අත්විය. තමිල්නාඩුවේ භාරතීය ජනතා පක්ෂය සමඟ සන්ධාන ගත වූ සමස්ත ඉන්දීය අන්නා ද්‍රවිඩ මුන්ණේත්‍ර කලගම් සන්ධානය පරාජය වූ අතර ද්‍රවිඩ මුන්ණේත්‍ර කලගම් පක්ෂය ජයග්‍රහණය කළේය. බටහිර බෙංගාලයේ සමස්ත ආසන 294කින් භාරතීය ජනතා පක්ෂයට ලබා ගත හැකි වූයේ ආසන 77ක් පමණි. ඇසෑම් සහ පොන්ඩිචෙරි එක්සත් සංගමය තුළ පාලනය රැක ගැනීමට ඔවුන්ට හැකි වුවද කේරළ ප්‍රාන්තය තුළ ඔවුන් සතුව තිබූ එකම ආසනයද අහිමි විය.

මෙම මැතිවරණයේ කේරළ ප්‍රාන්ත ප්‍රතිඵලය කාගේත් බලාපොරොත්තු දල්වන්නක් වී තිබේ. කේරළ ප්‍රාන්ත මැතිවරණයෙන් යළිත් වරක් ඉන්දියාවේ මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධානත්වයෙන් ගොඩනැගී ඇති වාම ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ ජයග්‍රහණය කළේ සමස්ත ආසන 140න් ආසන 99ක්ම ජයග්‍රහණය කරමිනි. කේරළ ප්‍රාන්තය තුළ සන්ධානයක් නැවත වතාවක් තේරී පත්වුයේ වසර 44කට පසුවය. වාම ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ 2016 වසරේ සිට කේරළ ප්‍රාන්ත ආණ්ඩුව හොබවන අතර ප්‍රධාන විපක්ෂය වූයේ ඉන්දීය ජාතික කොංග්‍රසය සහ භාරතීය ජනතා පක්ෂයයි. මෙවර මැතිවරණයේදී මෙම පක්ෂ දෙක වාම සන්ධානයට එරෙහිව දැවැන්ත මඩ හා අවලාද එල්ල කරමින් මැතිවරණ ව්‍යාපාරයේ යෙදුණද වාම සන්ධානයේ ජයග්‍රහණය වැළැක්වීමට අසමත් විය. 2018 වසරේ කේරළ ප්‍රාන්තය තුළ ඇතිවූ ගංවතුර තත්වය, විපක්ෂය විසින් සවරිමාලා දේවස්ථානයට කාන්තාවන්ට ඇතුළු වීම තහනම් කිරීමේ උත්සාහය හා කොවිඩ් 19 වසංගත තත්වය අරභයා මෙම මඩ හා අවලාද සකස් කර තිබුණි.

කේරළ ප්‍රාන්තයේ වමේ සන්ධානයේ මැතිවරණ ජයග්‍රහණයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ පවතින කොවිඩ් 19 වසංගත තත්වය තුළදී ඔවුන් සිදුකළ වැඩ කොටසය. ඉන්දියාවේ පාලක භාරතීය ජනතා පක්ෂය කොවිඩ් 19 වසංගතයේ ව්‍යාප්තිය පාලනය කිරීමට අසමත් වුවද කේරළ ප්‍රාන්තය තුළ වසංගතය සැලකිය යුතු මට්ටමකින් පාලනය කරනු ලැබ තිබේ. කොවිඩ් 19 වසංගත තත්වය ආරම්භ වූ මොහොතේ සිටම කේරළ ප්‍රාන්තයේ සෞඛ්‍ය අමාත්‍යංශයත් කොමියුනිස්ට් පක්ෂයත් එය මැඩ පැවැත්වීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ගවලට පිවිසියේය. 'දාමය බිඳිමු ' නම් වැඩසටහන මගින් කොවිඩ් 19 මැඩපැවැත්වීමේ ජනතා සහභාගිත්ව ක්‍රියා මාර්ගවලට පිවිසි කේරළයේ කොවිඩ් 19 පාලන වැඩ සටහන ඉන්දියාව තුළත් ජාත්‍යන්තරවත් ඇගැයීමට ලක් විය. ආර්ථික වශයෙන් ශක්තිමත්, විශාල හා භාරතීය ජනතා පක්ෂ පාලනය පැවති අනෙකුත් ප්‍රාන්තවල රෝගීන් විශාල ලෙස වැඩිවී, රෝහල්වල ඇඳන් හිඟවී ඔක්සිජන් හිඟයක් ඇතිවී රෝගීන් දහස් ගණනින් මිය ගියද කේරළ ප්‍රාන්තය තුළ එවැනි තත්වයක් මතු නොවීමට කේරළ ආණ්ඩුවේ මැදිහත්වීම ජනතාවගේ ප්‍රසාදයට හේතු වී තිබිණි.

## චිලිය: වමට ජය



මැයි 15 හා 16 දෙදින පැවැත්වූ, චිලියේ පළාත් පාලන ආයතනවලට සහ නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම වෙනුවෙන් වන ව්‍යවස්ථාදායක සමුළුවට සභිකයින් තෝරා පත් කර ගැනීම සඳහා පැවැත්වූ මැතිවරණයේදී වාමාංශික පක්ෂ හා ප්‍රගතිශීලි සංවිධාන, දක්ෂිණාංශික පක්ෂ පරදවා විශිෂ්ට ජයග්‍රහණයක් අත් කර ගෙන තිබේ. පළාත් පාලන ආයතන සඳහා තෝරා පත්කර ගැනීමේදී චිලියේ කොමියුනිස්ට් පක්ෂයේ ජනාධිපති ධූර අපේක්ෂක ඩැනියෙල් ජදූයේ 66% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් රෙකොලේතා නගරයේ නගරාධිපති ලෙසත් කොමියුනිස්ට් පක්ෂයේ ඉරසි ඇල්කල්දෙසා චිලියේ අගනුවර වන සන්තියාගෝහි නගරාධිපතිනිය ලෙසත් තේරී පත් වූහ.

නව ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීම සඳහා තෝරා පත්කරගත් ව්‍යවස්ථාදායක සමුළුව සඳහා අවශ්‍ය සභිකයින් 155 දෙනා අතරින් 119 දෙනෙකුම වාමාංශික පක්ෂ හා සංවිධානවලින් තේරී පත් වී තිබේ. දක්ෂිණාංශික පක්ෂ වලින් තේරී පත්වී ඇත්තේ 36 දෙනෙකු පමණි.

## ග්‍රීසිය: නූතන වහලුන් කිරීමට එරෙහිව වීදි බැස




ග්‍රීක ආණ්ඩුව, වැඩ දිනය පැය 08 සිට පැය 10 දක්වා දීර්ඝ කිරීම, ඉරිදා දිනය වැඩ දිනයක් කිරීම, වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වය සීමා කිරීම හා වැඩ වර්ජනය කිරීමේ අයිතිය කප්පාදු කිරීම ඇතුළු කම්කරු විරෝධී යෝජනා ඇතුළත් පනතක් සම්මත කිරීමට සූදානම් වේ. ඊට විරෝධය දක්වමින් පසුගිය මැයි 13 හා 14 දෙදින තුළ සමස්ත ග්‍රීක කම්කරු සටන් පෙරමුණ හෙවත් 'පාමේ' සංවිධානය විරෝධතාවක නිරත විය. මෙම පනතේ අඩංගු කරුණු සම්බන්ධයෙන් ග්‍රීක කම්කරු ඇමතිවරයා මැයි 12වැනිදා කරුණු හෙළි කළේය. සුළු සේවකයන් ඔවුන් සැබෑ ලෙසම වැඩ කරන කාලය සෙවීම සඳහා ඩිජිටල් කාඩ් පතක් හඳුන්වා දීමටත් නීත්‍යානුකූල අතිකාල ප්‍රමාණය වසරකට පැය 150කට සීමා කිරීමටත් තමන් බලාපොරොත්තු වන බව එහිදී ඔහු ප්‍රකාශ කර තිබුණි.

මේ පිළිබඳව තම ස්ථාවරය ප්‍රකාශ කළ 'පාමේ' සංවිධානය තමන් 21වැනි සියවසේ වහලුන් බවට පත්වීමට සූදානම් නැති බවත් පැය අටක වැඩ දිනය ඇතුළු අද දවසේ තමන් භුක්ති විඳින කම්කරු අයිතීන් තම අතීත පරම්පරාවන් විසින් තමන් වෙත දිනාදී ඇති අයිතීන් බවත් ධනපතියන්ට ලාභ උපයා දෙන්නේ කම්කරුවන් බැවින් තමන් යළි ඉතිහාසය කරා ආපසු ගමන් කිරීමට සූදානම් නොමැති බවත් සඳහන් කළේය.

# කොවිඩ් හමුවේ ආණ්ඩුවේ තක්කඩි හැසිරීම

ජනාධිපතිවරයා, ආණ්ඩුව සහ අනිකුත් පරිපාලන ක්ෂේත්‍ර විසින් කරන ලද නොසලකා හැරීම්, අත්හැරීම් සහ වැරදි තීන්දු හමුවේ කොවිඩ් වසංගතය බරපතළ තත්වයක් කරා වර්ධනය වී ඇති බවත් ඊට මැදිහත්වීම සඳහා කෙටි කාලීන කඩිනම් වැඩපිළිවෙළක් වෙත ආණ්ඩුව වහා ප්‍රවේශ විය යුතු බවත් අවධාරණය කරමින් පසුගිය 11වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීය.

කාලීන වැදගත්කම සලකා නියමුවා අපි එම අදහස් සහ යෝජනා පිළිබඳ සංක්ෂිප්ත සටහනක් වෙනුවෙන් මෙම ඉඩ වෙන්කළෙමු.

මේ වනවිට ලංකාව තුළ කොවිඩ් වසංගත තත්වය සීග්‍රයෙන් බිහිසුණු වසංගත තත්වයක් දක්වා දිනපතා වර්ධනය වෙමින් තිබෙනවා. පුරෝකතනය කරන සමහර ආයතනයන් මෙය ඉතාමත් භයානක අන්තයකට තල්ලුවිය හැකි බවට බරපතළ අනතුරු ඇඟවීම් කර තිබෙනවා. මියයන සංඛ්‍යාව සහ රෝගය වැළඳෙන සංඛ්‍යාව දෛනිකව විශාල අනතුරු ඇඟවීම් ජාත්‍යන්තර මට්ටමින් අපේ රට කෙරෙහි සිදුකර තිබෙනවා. මෙය මැඩපැවැත්වීම සඳහා තිබෙන අපේ සෞඛ්‍ය යාන්ත්‍රණය විශාල වශයෙන් අඩපණ වෙලා තිබෙනවා. උදාහරණයක් හැටියට රෝගය වැළඳුනු අය රෝහල් කරා ගෙනයාමට නොහැකිව දිස්ත්‍රික්ක ගණනාවක වැඩි ප්‍රමාණයක් නිවෙස්වල සිටිනවා. රජයේ රෝහල් පද්ධතියත්, අතරමැදිව ගොඩනගන ලද රෝහල් පද්ධතියෙත් මුළු ඇඳන් පිරී ගොස් තිබෙනවා. මේ නිසා රෝගීන් නිවෙස්වල කර කියාගත දෙයක් නොහැකිව අසරණ වෙලා.

අනික් පැත්තෙන් සෞඛ්‍ය කාර්ය මණ්ඩල තමන්ගේ වගකීම පූර්ණ ලෙස ඉටුකිරීම සඳහා උත්සාහ දරමින් සිටියදී පවා මූලික පහසුකම් පවා නොමැති තත්වයක් තිබෙනවා. ආරක්ෂිත ඇඳුම් කට්ටල, වෙනත් යටිතල පහසුකම් කිසිවක් වර්ධනය කර නොමැති පසුබිමක ඇතැම් රෝහල්වල උද්ඝෝෂණ පවා සිදුකරනවා. අවශ්‍ය පහසුකම් ලබාදීමට අසමත් වීම හේතුකොටගෙන කාර්යමණ්ඩල අකුරට වැඩ කිරීම් පවා ආරම්භ කිරීම සූදානම් වෙනවා. එයින් කියවෙන්නේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල විශාල හෙම්බත්වීමකට ලක්වී තිබෙන බවයි.

මහජනයා තුළ සැකය, අවිශ්වාසය, වර්ධනය වෙලා. මහජනතාව තුළ විශාල නොසන්සුන්තාවයක් වර්ධනය වෙමින් තිබෙනවා. මේ නිසා කොවිඩ් වසංගතය තුළ සංකීර්ණ විශාල ගැටලු ප්‍රමාණයක් ඇතිවී තිබෙනවා. මේ නිසා වහාම කොවිඩ්



තත්වය මැඩපැවැත්වීමට අසමත් වුවහොත් විශාල සමූහ මිනිස් ඝාතන බවට වර්ධනය වීමේ ඉඩකඩ තිබෙනවා. මේ කිසිවක් වෛරසයේ ස්වභාවික තත්වය නොවේ. මේ බොහෝ කරුණු ජනාධිපතිවරයා, ආණ්ඩුව සහ අනිකුත් පරිපාලන ක්ෂේත්‍ර විසින් කරන ලද නොසලකා හැරීම්, අත්හැරීම් සහ වැරදි තීන්දු මේ තත්වයට මූලික වී තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිවරයාගේ උඩඟු, මෝඩ අපරිණත නායකයෙක් විදිහට කටයුතු කිරීමෙන් ව්‍යසනයක් ඇතිවී තිබෙනවා. ජනාධිපතිවරයාගේ මෙම හිතුවක්කාර හැසිරීම අද අපේ රටේ මිනිස් ජීවිත බිළි ගනිමින් තිබෙනවා. රට විශාල අනාරක්ෂිතභාවයකට පත්වී තිබෙනවා.

අපේ ආයතන ව්‍යූහය අනුව ජනාධිපතිවරයා, සෞඛ්‍ය අමාත්‍යවරිය, ඖෂධ භාර අමාත්‍යවරයා, දේශීය වෛද්‍ය අමාත්‍යවරයා මේ යාන්ත්‍රණයේ මූලික වගකීම් සෞඛ්‍ය ක්ෂේත්‍රයට දිය යුතුව තිබෙනවා. හැබැයි මේ කිසිවෙක් ඒ වගකීම් ඉටු කළාද? වගකීම් විරහිත දේශපාලන සහ අනෙකුත් නායකයින්ට මේ ව්‍යසනය විසඳන්න පුළුවන්ද? මේ නායකත්වයන් අසමත්. ඒ වගේම ගොඩනගන ලද යාන්ත්‍රණය අසමත්. මෙම යාන්ත්‍රණයේ ප්‍රමුඛකව කාර්යභාරය සෞඛ්‍ය අංශ ප්‍රධානීන්ට දුන්නේ නැහැ. වෙන වෙන අය යාන්ත්‍රණයේ ප්‍රධානීන් බවට පත්කළා. මේ නිසා මුළු යාන්ත්‍රණයම බිඳ වැටිලා. බිඳ වැටීම කොතෙක්ද කියනවා නම් රජය ලබාදෙන තොරතුරු සහ දත්ත පිළිබඳව පොදු ජනතාවගේ විශ්වාසය බිඳ වැටිලා.

මේ වෛරසය එක් එක් අවස්ථාවල එක් එක් ප්‍රභේදයන් බවට අනුවර්තනය වීම එහි ස්වභාවයක්. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විශේෂඥ කණ්ඩායමක් විසින් වරින් වර මේ ප්‍රභේදයන් පිළිබඳව හඳුන්වාදීම් කළා. අපි දූපතක් නිසා ගුවන්තොටුපොළ, වරාය සහ නීති විරෝධී මුහුදු ගමන් වළක්වාගන්න ඉඩ තිබුණා. වෛරස් ප්‍රභේදය සහ ඒ ප්‍රභේදයේ අනුවර්තනයන් අපේ රටට ඇතුල්වීම වළකවා ගත හැකිව තිබුණා. එහිදීත් අපේ රටේ පාලකයන් අසමත්.

අනෙක් පැත්තෙන් අවශ්‍ය එන්නත් රටට ලබාගැනීම සඳහා තිබුණු සැලැස්ම කුමක්ද? පහුගිය දෙසැම්බර් මාසය වෙනකොට එන්නත් හඳුනාගෙන තිබුණා. සමහර රටවල් දෙසැම්බර් මැද වෙනකොට එන්නත් ලබාදීම පටන්ගෙන තිබුණා. මේ

12 වැනි පිටුවට

**අද බිලිගනිමින් තිබෙන මිනිස් ජීවිත, වෛරසය පිළිබඳව ජනතාව තුළ ඇතිවී තිබෙන බිය, පුරවැසියන්ගේ ඇස්වලින් ගලන කඳුළු යනාදී සියල්ල බරපතළ අපරාධ. මේ අපරාධවලට ජනාධිපතිවරයා සහ ඔහුගේ දේශපාලන නායකත්වයත්, ගොඩනගා තිබෙන යාන්ත්‍රණයත් වගකියන්න ඕනෑ.**



"මිනිසා මාලිගාවකදී හා පැල්පතකදී වෙනස් ආකාරයෙන් සිතයි. සාගින්න නිසා, දුක්ඛිත තත්වය නිසා ඔබට ඔබේ සිරුර තුළ පෝෂණය සඳහා දෙයක් නොමැති නම්, ඒ ආකාරයෙන්ම, ඔබේ ඔළුවේ, ඔබේ මනසේ සහ හදවතේ සදාචාරය පෝෂණය සඳහා දෙයක් නොමැත."

**ලුද්විග් ෆොයර්බාහ්**

## කොවිඩ් අර්බුදයට මුහුණදීම සඳහා වූ ජ.වි.පෙ. යෝජනා

- අද මෙම ක්‍රියාවලිය තනි දේශපාලන ආධිපත්‍යයකට යටත් කර ගෙන තිබෙනවා. මෙය සාමූහික දේශපාලන ක්‍රියාකාරිත්වයකට යටත් කළ යුතුයි. අපි ආරම්භයේදීම විපක්ෂයේ පක්ෂ හවුල් වූ යාන්ත්‍රණයක් සකස් කරන ලෙස කිවුවා. ඔවුන් විපක්ෂයේ පක්ෂ හවුල් කර ගැනීමට අකමැති නම් ආණ්ඩුව තුළම හෝ සාමූහික නායකත්වයකට මෙය යටත් කළ යුතුයි. මේ ආණ්ඩුව තුළ හිටපු ජනාධිපතිවරුන් දෙදෙනෙක් සිටිනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජ්‍ය සභාපති ධුර දරන ලද අය ඉන්නවා. ආණ්ඩුව තුළ වසංගත රෝග පිළිබඳ මහාචාර්යවරයෙක් සිටිනවා. විශේෂඥ වෛද්‍යවරුන් සිටිනවා. අඩුම තරමින් ආණ්ඩුව තුළ සාමූහික දේශපාලන නායකත්වයක් ගොඩනගන ලෙස ඉල්ලනවා. මොකද මේක අතිශය වැදගත් දේශපාලන තීන්දුවක්.
- කොවිඩ් මර්දන කාර්ය සාධක බලකාය යළි ප්‍රතිසංවිධානය කළ යුතුයි. විශේෂයෙන් මෙය සෞඛ්‍ය ප්‍රශ්නයක් ලෙස සලකා නිර්දේශයන්, අධීක්ෂණයන්, මඟපෙන්වීම් සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රය මෙම යාන්ත්‍රණය තුළ බලවත් කළ යුතුයි. අනිල් ජාසිංහ මහතා, පබා පලිහවඩන මහත්මිය, ජයරුවන් බණ්ඩාර මහතා වැන්නවුන් ඊට නැවත කැඳවිය යුතුයි. ඊට ඒකමතිත්වයක් ලබා දිය යුතුයි. එක් එක් අමාත්‍යවරුන්, මාධ්‍ය ප්‍රකාශකයින් කරනු ලබන විගඩම් කතා නතර කළ යුතුයි. රජයක් ලෙස ප්‍රතිපත්තිමය කරුණු සමාජයට ඒ බරින් හා සුදුසු ලෙස ඉදිරිපත් කළ යුතුයි. ආණ්ඩුවේ දත්ත පිළිබඳ අවිශ්වාසයක් ගොඩනැගී තිබෙනවා. මේ ව්‍යසනයේදී ජනතාව ඒකමතිකභාවයකට ගෙන ඒම අතිශය වැදගත් වනවා.
- මෙම වසංගතයට මුහුණදීම සඳහා දැනට ඇති එකම විසඳුම එන්නතයි. එමනිසා විගඩම්කාරී බෙහෙත් වර්ග එක් එක් අයට වුවමනා පරිදි මාධ්‍ය නාලිකාවලට, නිළියන්ට වුවමනා පරිදි සමාජයට ඉදිරිපත් කිරීමට ඉඩ නොදිය යුතුයි. මෙම විගඩම්කාරී ක්‍රියාවන් නතර කළ යුතුයි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරීක්ෂා කොට අනුමත කිරීමෙන් තොරව ඒවා ප්‍රචාරණය කිරීම වැළැක්විය යුතුයි. ඒවා පිළිබඳව කඩිනම් තීරණ ගත යුතුයි. ඒ වගේම එන්නත් පිළිබඳව විශාල විද්‍යාත්මක සංවාදයක් සමාජය තුළ ඇති කළ යුතුයි. ඒ වගේම එන්නත් ලබාදීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් අවශ්‍යයි. එන්නත් ලැබී ඇති ප්‍රමාණයට සාපේක්ෂව 60ට වැඩි අයට හෝ නිදන්ගත රෝග තිබෙන අයට ආදී වශයෙන් සීමාකම් අනුව ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුයි.
- දැඩි සංචරණ සීමාවන්ට යා යුතුව තිබෙනවා. අද (11) රාත්‍රියේ සිට පළාත් අතර සංචරණය සීමා කරන බව ප්‍රකාශ වී තිබෙනවා. මෙය මාසයකට වඩා ප්‍රමාද තීන්දුවක්. අප්‍රේල් 08වැනිදා බ්‍රිතාන්‍ය ප්‍රභේදය ලංකාවට ඇතුල් වී ඇති බව පර්යේෂකයින් කියනවා. පළාත් සංචරණ සීමා ඒ මොහොතේ පැනවූවානම් එය පළාතකට සීමා කර ගත හැකිව තිබුණා. නමුත් එම තීන්දුව ගෙන තිබෙන්නේ මාසයකට පසුවයි. එමනිසා තවදුරටත් පළාත් අතර සංචරණ සීමා පැනවීම ප්‍රමාණවත්ද යන ගැටලුව තිබෙනවා. එමනිසා සෞඛ්‍ය අංශවල නිර්දේශ අනුව දැඩි සංචරණ සීමාවන්ට යා යුතුව තිබෙනවා. මේ වෛරසයේ වාහකයා මිනිස් සිරුරයි. මිනිස් සිරුර සංචරණය වීම, එකිනෙකා මුහු වීම අවම කර ගැනීම අතිශය වැදගත් බව අප දන්නවා. වැළඳී තිබෙන අය හඳුනාගැනීම, ඔවුන්ගේ ආශ්‍රිතයන් හඳුනා ගැනීම, හඹා ගොස් පැතිරීම වැළැක්වීම සිදු කළ යුතුව තිබෙනවා.
- මේ රෝගය පිළිබඳ ආණ්ඩුවේ ප්‍රවේශය වෙනස් කළ යුතුව තිබෙනවා. ආණ්ඩුවේ ප්‍රවේශ වන්නේ 'කොවිඩ් සමග ජීවිතය' යන්නයි. ඒක වැරදියි. කොවිඩ් සමග ජීවත් වනවානම් මේක මෙහෙම තමයි. ආණ්ඩුවට තිබිය යුතු අධිෂ්ඨානය වන්නේ 'කොවිඩ්වලින් තොර රටක් හදමු' යන්නයි. ඒ සඳහා සියලු යාන්ත්‍රණ ඒකාබද්ධ කළ යුතුයි. එය ජාතික මෙහෙයුමක් බවට පරිවර්තනය කළ යුතුයි. ආණ්ඩුව, දේශපාලන නායකත්වය, අනෙකුත් දේශපාලන ව්‍යාපාර, රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණය, මහජන සංවිධාන, මාධ්‍ය ආයතන, පොදු පුරවැසියන් සියලු දෙනා ලංකාවෙන් කොවිඩ් තුරන් කරන බවට ස්ථිර අධිෂ්ඨානයකට එළඹිය යුතුයි. ඒ වෙනුවෙන් ජනතාව පෙළගැස්විය යුතුයි.
- සංචරණ සීමා මගින් පොදු පුරවැසියන් යම් ආර්ථික අපහසුතාවන්ට මුහුණ දිය හැකියි. අපි දන්නවා ඇතැම් සමාගම් 2019දී ලැබුවාටත් වඩා වැඩි ලාභයක් 2020 වසරේදී ලැබුවා. සමාජීය වගකීම වෙනුවෙන් ඔවුන්ට වැයබරක් දැරිය හැකියි. සමාජයක් නොපවතින්නේනම් ඔවුන්ට ව්‍යාපාර කටයුතු කළ නොහැකියි. ඔවුන් ලබන ලාභයෙන් පංගුවක් මේ අසරණභාවයට පත්වන ජනතාවට සහන සැලසීම සඳහා ලබා දිය හැකියි. ඒ සඳහා අරමුදලක් සකස් කළ හැකියි. ඒක පෙට්ටගම් අරමුදලක් නොවිය යුතුයි. එය මිනිසුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා වේගයෙන් වැඩකරන අරමුදලක් විය යුතුයි. එම අරමුදල අධීක්ෂණය සඳහා එයට ආධාර කරන ව්‍යාපාරයන්ගේ නියෝජිතයින්ගෙන්ද සමන්විත මණ්ඩලයක් පත් කළ යුතුයි.
- රටේ එළවළු, පළතුරු, මත්ස්‍ය ආදී නිෂ්පාදන බෙදාහැරීම යාන්ත්‍රණය මෙම සීමා නිසා බිඳවැටිය හැකියි. මේ බෙදාහැරීම් බොහොමයක් තිබෙන්නේ පෞද්ගලික අංශය සතුවයි. ඒ වෙනුවෙන් පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කළ යුතුයි. සංචරණ සීමා මගින් පුරවැසියන්ට සිදුවිය හැකි හානිකර බලපෑම් නතර කර ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කළ යුතුව තිබෙනවා.

## අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ සභාපතිනි සරෝජා සවිත්‍රි පෝල්රාජ් සහෝදරිය

# කොවිඩ් වසංගතය වාගේම අසමත් ධනේශ්වර ක්‍රමයත් පැරදවීම අපේ වගකීමක්



*රටට පෙනෙන්නේ පවතින කොවිඩ් වසංගතය පමණකි. නමුත් වසංගත තත්වය හමුවේ වැඩිපුර සමාජයට නිරාවරණය නොවන පැතිකඩ ගණනාවක් තිබේ. මේ සමාජ භේදවාචකයන් හමුවේ කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව 'අයිතීන් උදෙසා කාන්තාවෝ' සංවිධානයේ සභාපතිනි සරෝජා සවිත්‍රි පෝල්රාජ් සහෝදරිය දැක්වූ අදහසයි මේ.*

කොවිඩ් වසංගතය ලෝකය පුරාම පැතිරීම, මරණයට පත්වීම හා හානියට පත් වූ අය දෙස බලද්දී පංති අසමානතාවය තදින්ම පේන්න තියෙනවා. දේශපාලනයෙදී අපි හැමදාම මේ පංති අසමානතාවය නැත්නම් ධනේශ්වර ක්‍රමයේ අර්බුදය නිසා ජනතාව පීඩාවට පත්වෙන බව ඒත්තු ගන්වන්න හැදුවත් ඒ හැම වෙලාවකටම වඩා මේ වෙලාවෙ පංති අසමානතාවය නිසා මිනිස්සු පීඩාවට පත්වෙන එක දකින්න ලැබෙනවා. ලංකාව, ඉන්දියාව හෝ ඇමරිකාව ගත්තත් මාස දෙක තුනකට තමන්ගේ අත්‍යවශ්‍ය බඩු ටික අරන් තියාග න්න පුළුවන්, නිරෝධායනය තමන්ගෙ ගේ ඇතුළෙම හෝ හෝටලයක කරගන්න පුළුවන්, සියලු පහසුකම්වලින් සමන්විත ආර්ථිකයක් ගොඩනගාගෙන ඇති ඉහළ පංතියට මේ බලපෑම අවම මට්ටමක තියෙනවා. ඒ හැරුනම රාජ්‍ය සේවකයන්, සෞඛ්‍ය නිලධාරීන් හා පර්යේෂකයන් මුහුණ දෙන අර්බුදයට යටත්වයි මේ කතා කරන්නේ.

නමුත් එදිනෙදා ආර්ථිකය හඹා යන දෛනික ජීවිතයකට හුරුවෙලා ඉන්න මිනිස්සු මේකෙන් බැට කන ප්‍රමාණය හුඟක් වැඩියි. පෞද්ගලික වාහනයක් නැති, පොදු ප්‍රවාහන සේවය පාවිච්චි කරන, අදටත් ජල මූලාශ්‍ර පොදුවේ පාවිච්චි කරන ජනතාව මේ නිසා විශාල පීඩාවකට පත්වෙලා තියෙනවා. මෙයිනුත් කාන්තාව තමයි වැඩිපුරම පීඩාවට පත්වෙන්නේ. ගෝලීය වශයෙන් ගත්තම දෛනික ජීවිතයේ අඩුම ආදායම, අඩුම ආර්ථික ප්‍රතිලාභ තියෙන්නේ කාන්තාවට. තමන් වෙනුවෙන්, තම දරුවන් වෙනුවෙන් ආහාර හොයන්න, වතුර හොයන්න, දර හොයන්න දවසකට කිලෝ මීටර් හතර, පහ, හය, දහය දක්වාම දුරක් පයින් ගමන් කරන්න සිද්ධවෙන කාන්තාවෝ ලෝකය පුරාමත් ලංකාවෙත් අදටත් ඉන්නවා. මේ කාන්තාවෝ පාවිච්චි කරන්නේ පොදු ජල මූලාශ්‍ර. ඒ වගේ තැන්වල කොවිඩ් ව්‍යාප්තියට තියෙන ඉඩකඩ වැඩියි.

ඒ වගේම සාමූහිකව, කණ්ඩායම් විදියට වැඩ කරන්න සිදුවෙන ගොවිපළවල්, ඇඟළුම් කම්හල්, තේ වතු සහ අනෙකුත් ආයතනවලත් විශාල වශයෙන් රෝගයට අනාවරණය වන අඩුම පහසුකම් යටතේ වැඩ කරන, සෞඛ්‍ය පහසුකම් කප්පාදු කළ පිරිසෙන් වැඩි පිරිසක් කාන්තාවනුයි. මේ පිරිසෙන් විධිමත් නොවන රැකියාවල යෙදෙන කාන්තාවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. විශේෂයෙන් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විධිමත් රැකියාවල නියුතු කාන්තාවන්ට මාසිකව ස්ථිර වැටුපක් ලැබෙනවා. සෞඛ්‍ය ආවරණ තියෙනවා. ඔවුන්ට වැටුප් රහිත නිවාඩු හා ප්‍රසූත නිවාඩුවලට හිමිකම තියෙනවා. නමුත් ලංකාවේ කාන්තාවන්ගෙන් විධිමත් රැකියාවල නියැලිලා ඉන්නේ 15%ක් 16%ක් පමණ පිරිසක් පමණයි. සමස්ත ශ්‍රම බලකායෙන් සියයට තිස් ගණනක් කාන්තාවන් වුණත් ඉතිරි 80%ක් පමණම නොවිධිමත් රැකියාවල නියුතු අය.

දෛනික කම්කරු ලෙස ඇඟළුම් සේවිකාවන් ලෙස, විදේශයන්හි ගෘහ සේවිකාවන් ලෙස වතු කම්කරුවන් ලෙස, හා කුලී කම්කරුවන් ලෙස මේ පිරිස රැකියාවල නියුතු වෙනවා. ඔවුන් සෑම දෙනාම මේ වෙනකොට අනාරක්ෂිත සෞඛ්‍ය තත්වයකයි පසුවන්නේ. ඔවුන්ට ලැබිය යුතු සෞඛ්‍ය ආරක්ෂණය කිසිදු අයුරකින් ඔවුන්ට ලැබෙන්නේ නැහැ.

ඒ වාගේම මේ වනවිට ලංකාවේ තිබෙන බරපතළම අර්බුදයක් තමයි ගර්භනී කාන්තාවන්ට තිබිය යුතු සෞඛ්‍ය ආරක්ෂණය නොමැති කම. උදාහරණයක් විදියට ගර්භණී කාලයේදී ගර්භණී මව්වරු කිසිදු වෛරස් රෝග යකට ගොදුරු නොවන්නට වෛද්‍ය උපදෙස් ලබා දෙනවා. එයට හේතුව ගර්භණී මවට මෙන්ම කළලයටත් සංකූලතා ඇති විය හැකි නිසා. බිහිවන දරුවා නිරෝගී දරුවෙකු වන්නට නම් කිසිදු වෛරස් ආසාදනයකට ගොදුරු නොවී සිටිය යුතුයි. නමුත් මේ මොහොතේ සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු ගර්භණී කාන්තාවන් මේ අවදානම දරාගෙන විශාල කැප කිරීමක් කරමින් ඉන්නවා. ඒ වගේම ඊටත් වඩා අති දුෂ්කර අවස්ථාවන්ට මුහුණ දෙනවා. චක්‍ර ලේඛනයක් මගින් රාජ්‍ය අංශයේ ගර්භණී කාන්තාවන් සේවයට වාර්තා නොකිරීමට අවසර ලබා දුන්නත් අනෙකුත් අයට ඒ අවස්ථාව හිමිවුනේ නැහැ. මා කථාකරන මේ මොහොත වෙනකොටත් ගර්භණී මව්වරුන් සිව් දෙනෙක් පමණ මිය ගොස් තිබෙනවා. එවැනි තත්වයක් හමුවේ වුවත් ගර්භණී තත්වයේ සිටින හෙද නිලධාරිනියන්ට නිවාඩු ලබා ගැනීමේ දුෂ්කරතා තියෙනවා. ඔවුන් අනෙක් අයගේ ජීවිත ආරක්ෂා කිරීම වෙනුවෙන් ගර්භය දරාගෙන වෛරසයට නිරාවරණය වෙනවා. වෛද්‍ය, හෙද හා අනෙකුත් කාර්ය මණ්ඩලවල අයත් මේ අභියෝගයට මුහුණ දෙනවා.

පෞද්ගලික අංශයට මේ සේවයට වාර්තා නොකිරීමේ හිමිකම මා දන්නා තරමින් තවමත් ලැබී නැහැ. ඒ වගේම අවධිමත් රැකියාවල නියුතු ගර්භනී කාන්තාවන්ට තම ගර්භය රැකගෙන ගෙදර ඉන්න හැකියාව තිබුණත් ඔවුන්ගේ ආර්ථිකයෙන් යැපෙන ඔවුන්ගේ පවුල්වලට දරුවන්ට වගකියන්නට කෙනෙක් නැහැ. ඒ නිසාම එවැනි රැකියාවල නියුතු ගර්භණී කාන්තාවන්ට තම දිවි නොතකා ජීවන අරගලයට මුහුණ දෙන්නට සිදුවෙනවා.

මවකට දරුවෙක් කියන්නේ අමිල සම්පතක්. අනෙක දරුවෙක් දරාගෙන සිටීම ජාතික වගකීමක්. එය කාන්තාවගේ අවශ්‍යතාවය මත හෝ තනි පවුල් ඒකකයක අවශ්‍යතාවය මත ඇති වුවක් නෙවෙයි. ඒ නිසා රජයට, ආණ්ඩුවට වගකීමක් තියෙනවා මේ ජාතික වගකීම ඉටුකරන කාන්තාවන් ආරක්ෂා කිරීමට සහ ජාතික සම්පතක් වුන මේ නූපන් බිළිඳුන් ආරක්ෂා කිරීමයි. ඒ නිසාම ගර්භණී කාන්තාවන් වෙනුවෙන්, විශේෂයෙන් අවිධිමත් රැකියාවල නියුතු ගර්භණී කාන්තාවන් වෙනුවෙන් සහන සැලසිය යුතුයි. ඔවුන් දරුගැබ බිහිකරන තුරු හෝ කරන රැකියාවලින් ඉවත්වෙලා නිවසට වී ඉන්නට ඔවුන්ට දීමනාවක් ලබා දෙන්නට, අදාළ වෙනත් පහසුකම් සපයන්නට, සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයක් සකසන්නට, ඔවුන්ගේ පෝෂණය පිළිබඳ සොයා බලන්නට වගේම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් එන්නත්කරණයට විධිමත් ක්‍රියා මාර්ගයක් රජය විසින් ගත යුතුව තියෙනවා. නමුත් මේ නූපන් දරු සම්පත නිරෝගීව අනාගත ලෝකය රකින්න බිහිකර ගැනීමට අදාළ වටපිටාව සකසා දීමේ යුතුකම මේ මොහොතේ ආණ්ඩුව පැහැර හැර තිබෙනවා.

ඒ වගේම තමයි මේ වසංගතය හමුවේ තවත් බේදනීය පැතිකඩක් තමයි අධ්‍යාපනය කියන්නේ. අධ්‍යාපනයේ බේදවාචකයට මුහුණ දෙන්නෙත් කාන්තාවෝ. දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන් සියල්ල අවධානය මෙන්ම නිරන්තර කැපවීමට පේවෙලා ඉන්නේ අම්මලා. මේ වසර දෙකක් තිස්සේ කඩාවැටෙන අධ්‍යාපන පද්ධතිය සකස් කරන්න පාලකයන්ට වුවමනාවක් නැහැ. කොහොමත් ධනේශ්වර අධ්‍යාපනය කියන්නේ ඇති හැකි අයට පමණක් ලබාගත හැකි නැති බැරි අය අධ්‍යාපනයෙන් පිටුවහල් කරන ක්‍රමයක්. මේ කොවිඩ් වසංගතයත් එක්ක ඔන්ලයින් අධ්‍යාපනය මේ ඇති නැති පරතරය තවත් පුළුල් කරනු ලැබුවා පමණක් නෙවෙයි තාක්ෂණය අත්පත්කර ගන්න බැරි පහළ අධ්‍යාපනයක් තියෙන දෙමව්පියන්ගේ දරුවන් අධ්‍යාපනයෙන් ඈතටම විසිකර දමනු ලැබුවා. ඒ නිසා රජයට වගකීමක් තියෙනවා සැමට සාධාරණ අධ්‍යාපනයක් ලබා දෙන්න. ඒ වෙනුවෙන් ආණ්ඩුවට මේ වෙලාවේ ගන්න පුළුවන් හොඳම ක්‍රියාමාර්ගයක් තමයි රූපවාහිනී නාලිකාවක මෙම අධ්‍යාපන වැඩසටහන් විකාශනය කරන එක. ඔන්ලයින් පහසුකම් පරිහරණය කරන පිරිසට වඩා රූපවාහිනී පරිහරණය කරන පිරිස ලංකාවේ වැඩියි. ඒ නිසා ග්‍රාමීය මට්ටමට වඩාත් ළඟා වෙන්න පුළුවන් හොඳම ක්‍රමය එයයි. එය අධ්‍යාපන අමාත්‍යාංශයට කළ හැකි දෙයක් නමුත් මේ වගකීමත් පැහැර හැරලා තියෙනවා.

අපි එදා පටන්ම නිදහස් අධ්‍යාපනයත් නිදහස් සෞඛ්‍යයත් රැකගැනීම වෙනුවෙන් අරගල කළා. අධ්‍යාපනය හා සෞඛ්‍ය විනාශ මුඛයට යාමේ බෙදවාචකය කොතරම් දරුණු ද කියන එක අපි මේ මොහොතේ අත්විඳිමින් හිඳිනවා. විශේෂයෙන්ම රෝහල්වල පහසුකම් නැති එක, පීසීආර් සඳහා පෞද්ගලිකව වියදම් දැරීමට සිදුවීම, ඉහළ යන මරණ සංඛ්‍යාව, රෝහල්වල ඉඩ පහසුකම් මදි වීම, දැඩිසත්කාර ඒකකවල ඇඳන් හිඟය යන මේ ධනේශ්වර ක්‍රමයේම අර්බුදය වන මේ අසමානතාවයන් සමනය කරන්නත් සමානාත්මතාවයෙන් යුතු මානව අවශ්‍යතා සම්පූර්ණ කරන්නත් මේ ධනේශ්වර ක්‍රමයට තවදුරටත් හැකියාව නැහැ කියන එක මේ බේදවාචකය තුළින් අනාවරණය වෙලා තියෙනවා.

අපි විශ්වාස කරනවා මේ ගෝලීය වසංගතයට නිවැරදි පිළියමක් ලබාදෙන සැමට යුක්තිසහගත හා සාධාරණ අයිතීන්, සෞඛ්‍ය, අධ්‍යාපන හා ජීවන සුරක්ෂාව යන කරුණුවලදී විධිමත් ක්‍රමවේදයක් ඇති කිරීම කළ හැක්කේ සමාජවාදයට පමණයි. ඒ තුළින් පමණයි මා කියූ කාන්තාවන්ගේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්නෙත්. ඒ නිසා මේ කොවිඩ් වසංගතය පැරදවීම හා සමානවම මේ අසමත් ධනේශ්වර ක්‍රමය පැරදවීමේ වගකීමත් අප අත්පත්කර ගතයුතු කරට ගත යුතු වගකීමක් බව අමතක කළ යුතු නැහැ.

## පියෙකුගේ කඳුළු

(නිමිත්ත: කොරෝනා වසංගතයෙන් ගැබිණි මව්වරු හතර දෙනෙක් මිය යති)

දාහක් පැතුම් මැද සිහිනෙක පාට සොයා
ආවත් නොපිපි කැකුළක මුදු සුවඳ පුරා
දෑසක් පුරා නොසිදෙන ▯ල්පතක් තියා
නූපන් කිරි කඳුළු සැඩ ගං දිගේ ගියා

ඈතට වෙලා දුක් දොම්නස් විඳින්නද
සීතල කොපුල් රහසින් පිරි මදින්නද
දෝතට අරන් නැලවිලි ගී ගයන්නද
දෑසට නොදැක කෙලෙසින් පැන් වඩන්නද

තාත්තා නිසා මා මගේ ලේ කිරි නොකළ
වෙනසක් කළේ ඇයි මට මගේ මල් කැකුළ
නූපන් නුඹ ළඟින් හිඳ තනි රකින්නට
අම්මා එක්ක ගියේ ඇයි පුත? කියන් මට

## සිව්දෙසින්


# ගෝතමාලාවේ කාන්තාවන් ජීවිත බියක



2021 පළමු මාස 04 ඇතුළත ගෝතමාලාවේ කාන්තාවන් 160 දෙනෙකු ඝාතනයට ලක්වී ඇත. එය දිනකට එක් මරණයකට වැඩි සංඛ්‍යාවකි. එසේම ප්‍රචණ්ඩත්වයක් සම්බන්ධයෙන් පැමිණිලි 20,000කට වඩා වාර්තා වී ඇති අතර එයට ස්ත්‍රී දූෂණ 3000ක් පමණ ඇතුළත් වෙයි. මෙම කාලය තුළ වසංගත තත්ත්වය හමුවේ සංචරණ සීමා ඇති වීම තුළ කාන්තාවන් ඝාතනය වීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වර්ධනය වී ඇති බව දක්නට ලැබෙයි. මෙලෙස ප්‍රචණ්ඩත්වයට ලක්වන කාන්තාවන්ට උපකාර කිරීමට සුදුසු නිසි යාන්ත්‍රණයක් නොමැති වීමද ගැටලුවක්ව පවතී. ලිංගික අපරාධකරුවන්ගෙන් 03%ක් වත් සිර දඬුවම්වලට ලක් නොවන තත්වයක් තුළ නීතිය කෙරෙහිද අපරාධකරුවන් බියක් නොදක්වන තත්වයක් ඇතිවී ඇත. බොහෝ කාන්තාවන්ට තම ජීවිත ආරක්ෂා කර ගැනීම මෙම තත්වය යටතේ අභියෝගයක්ව පවතී.

කෙසේ නමුත් ගෝතමාලාවේ කාන්තාවන් මෙම තත්වයට විරුද්ධව හඬනැගීම සහ වීදි බැස අරගල කිරීම දක්නට ලැබෙයි. මෙම විරෝධතාවලට සම්බන්ධ වන කාන්තා ක්‍රියාකාරිනියන් පෙන්වා දෙන්නේ ගොතමාලාව තුළ කාන්තාවන්ට තීරණ ගැනීමට ඇති අයිතිය අවම බවත් පිරිමි විසින් තම ඥාති දියණියන්, මිණිබිරියන් සහ සහෝදරියන් භාණ්ඩ සේ සලකා අපයෝජනය කිරීම හේතුවෙන් ළමා ගැබ්ගැනීම් සංඛ්‍යාව වැඩි මට්ටමක පවතින බවය. එවන් අවස්ථාවකදී වුවද ගබ්සාවක් සඳහා ඉඩක් නීතියෙන් ලබාදී නොමැති බවද ඔවුහු පෙන්වා දෙති. කෙසේ නමුත් පාලකයින්ද කාන්තා හිංසනය වැළක්වීමට ක්‍රියාමාර්ග ගැනීමට උත්සුක නොවන බව විරෝධතාකරුවෝ ප්‍රකාශ කරති.

# සමාගම් අධ්‍යක්ෂක මණ්ඩලවලට කාන්තාවන්




මැදපෙරදිග රටවල් ගත් විට සංස්කෘතික වශයෙන්ම කාන්තාවන් ප්‍රමාද වන තෙක් සේවා ස්ථානයේ රැඳී සිටීමට සිදුවන රැකියා කිරීම අධෛර්යමත් කරවන තත්වයක් පවතී. කෙසේ නමුත් එක්සත් අරාබි එමීර් රාජ්‍යය තුළ ලියාපදිංචි සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩලයේ අවම වශයෙන් එක් කාන්තාවක් හෝ සිටිය යුතු බවට නීතියක් ඉදිරිපත් වී තිබේ. මාර්තු 15 වන දින මෙය නිවේදනය කර තිබුණත් එය පහසු ඉලක්කයක් නොවන බව දක්නට ලැබෙයි. මෙයට ප්‍රධානම හේතුව වී ඇත්තේ කාන්තාවක් එවැනි තනතුරුවලට පත්වීම අධෛර්යමත් කරන ආගමික සංස්කෘතික පසුබිමයි.

බොහෝ විට කාන්තාවකට මෙවැනි තනතුරක් පිළිගැනීමට පෙර පවුලේ අවසරය අවශ්‍ය වෙයි. එමිරේට් රාජ්‍යයේ විශ්වවිද්‍යාල සලකන විට 70%ක් කාන්තාවෝ වෙති. එසේම රාජ්‍ය සේවකයින්ගේ තුනෙන් දෙකක් කාන්තාවෝ වෙති. නමුත් ඔවුන්ගෙන් නායකත්ව වගකීමක් දරන පිරිස 30%ක් පමණි. කෙසේ නමුත් මෙම පියවර ඉදිරියට ක්‍රියාත්මක කිරීමටත් මෙම කොන්දේසිය ඉටු නොකරන සමාගම්වලට දඩ ගැසීමට හෝ නඩු පැවරීමට කටයුතු කරන බව ප්‍රකාශිතය. මෙම කොන්දේසිය හා එකඟ වෙමින් එමිරේට් රාජ්‍යයෙහි විශාලතම සමාගම් කිහිපයක් සිය අධ්‍යක්ෂක මණ්ඩලයට කාන්තාවන්ද නම්කිරීමට පියවර ගෙන තිබේ.

# ඉස්තාන්බුල් සම්මුතියට ඇතුළත් වන ලෙස තුර්කියට බලකිරීම්




පසුගිය මැයි 10 දා ලොව පුරා කාන්තාවන් විරෝධතාවලට එක් වූයේ වසර 10කට පෙර එවැනි දිනයක එළඹුණු කාන්තා අයිතිවාසිකම් සහ අරක්ෂාව උදෙසා ලෝකය ළඟා වූ වැදගත්ම සම්මුතියක් වන ඉස්තාන්බුල් සම්මුතියට නැවත ඇතුළත් වන ලෙසට තුර්කි ජනාධිපතිට බලකරමිනි.

මාර්තු මාසයේදී ඉස්තාන්බුල් සම්මුතියෙන් සිය රට ඉවත් වන බවට තුර්කි ජනාධිපති ප්‍රකාශ කළ අවස්ථාවේ පටන් එම තීරණයට විරුද්ධව විරෝධතා පැන නැග්ගේය. මෙම තීරණය ජුලි මස 01 දින බලාත්මක වීමට නියමිතය. ප්‍රධාන වශයෙන්ම ඉස්තාන්බුල් සම්මුතියේ අරමුණ වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ ගෘහස්ථ හිංසනය වැළැක්වීමයි. මෙම සම්මුතියට ඇති වගකීමෙන් තුර්කිය නිදහස් වීම තුළ එරට මිලියන ගණනක් කාන්තාවන්ගේ සහ ගැහැණු ළමුන්ගේ ජීවිතවලට අවදානමක් ඇති විය හැක.

# ආර්ථිකයේ කුණුවීම 2020 මහ බැංකු ඇසින්

ලංකාව 73 වසරක් පාලනය කළ සහ දැනටත් පාලනයේ සිටින ධනපති පාලකයින් විසින් අනුගමනය කරන ලද ආර්ථික උපායමාර්ගයන් අසාර්ථක බව යළිත් වතාවක් ශ්‍රී ලංකා මහා බැංකුවේ 2020 වසරට ඉදිරිපත් කළ වාර්ෂික වාර්තාවෙන්ද ඔප්පු කරනු ලැබ ඇත. මහ බැංකුව විසින් වාර්ෂිකව ඉදිරිපත් කරන රටේ මූල්‍ය තත්වය පිළිබඳ වාර්ෂික වාර්තාවකින් රටේ සංවර්ධන මට්ටම, ජනතාවගේ ජීවන තත්වය පිළිබඳව, ඇති නැති පරතරය වැනි කරුණු නිවැරදි ලෙස පෙන්නුම් නොකරන බව අපට වටහාගත හැකිය. නමුත් පවතින ආණ්ඩුවේ ආර්ථික ඉලක්කවලට ගැලපෙන ලෙස සංඛ්‍යා සටහන් යොදා ගත්තද මූලික වශයෙන් කලින් වසර හා සැසඳීමේදී ආර්ථික වර්ධනය, නිෂ්පාදනයේ මට්ටම, ණය තත්වය, ආනයන අපනයන පරතරය වැනි කරුණු පිළිබඳව දළ වැටහීමක් ඒ මගින් ලබාගත හැකිය.



"අධිරාජ්‍යවාදයේ ස්වභාව නිරූපී අංග ලක්ෂණය රැඳී පවතින්නේ, අපට පෙනෙන්නට තිබෙන පරිදි, ලෝකය පීඩිත ජාතීන් විශාල ගණනක්ද, පීඩක ජාතීන් ඉතාමත් කුඩා සංඛ්‍යාවක්ද, වශයෙන් බෙදී තිබීම සහ මෙහි පසුකී ජාතීන්ට යෝධ ධනස්කන්ධයක් සහ බලවත් යුද්ධ හමුදා තිබීම කෙරෙහිය."

**ලෙනින්**

**පෙරදිග ලෝකයේ ජාතික විමුක්ති ව්‍යාපාර**

**326 පිටුව**

## ආර්ථික වර්ධනය

රාජපක්ෂ පවුල් පාලනය විසින් ලංකා ඉතිහාසයේ දරුණුම ආර්ථික කඩාවැටීමට රට ලක් කළ වසර බවට 2020 වසර පත්කරන ලදී. 2019 දී වාර්තා වූ 2.3%ක ආර්ථික වර්ධන වේගය -3.6%ක් බවට පත් කරන ලදී. ආණ්ඩුව මෙම ආර්ථික කඩා වැටීමට හේතුව ලෙස කොරෝනා වසංගත තත්වය හැමවිටම හුවා දැක්වූවද 2020 පළමු කාර්තුවේම -2.3ක් බවට පත්වූයේ කොරෝනා බලපෑමක් හේතුවෙන් නොව පොදු බිඳ වැටීමේ හේතු නිසාය.

මෙම ආර්ථික වර්ධන වේගය ඍණ මට්ටමට කඩා වැටීමට ප්‍රධාන ලෙස බලපාන ලද්දේ කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදනයන්ගේ බිඳ වැටීමයි. දෙවන කාර්තුවේදී ඇඟලුම් නිෂ්පාදන විශාල ලෙස කඩා වැටීමට ලක්විය. එය 2020 වසරේදී 30.8%ක පසුබෑමක් පෙන්වන ලදී. මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනවලට පමණක් සීමාවූ දේශීය කර්මාන්ත නගා සිටුවීමේ යෝජනා ගතවූ වසරේදීත් ප්‍රායෝගිකව ක්‍රියාවට නැගීමක් සිදු නොවූ, කටින් බතල සිටුවීමේ යෝජනාවලට පමණක් සීමා වීමේ ප්‍රතිඵලය වන්නේ කර්මාන්ත අංශය පසුගිය වසරට වඩා 6.9%කින් කඩා වැටීමට ලක්වීමයි.

## ආනයනය හා අපනයනය

ආණ්ඩුව නිරන්තරයෙන් ප්‍රකාශයට පත් කළේ ආනයන සීමා කිරීමේ ප්‍රතිපත්තිය හරහා විශාල ඩොලර් විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට ඇති හැකියාව පිළිබඳවය. එසේම අපනයනය දිරි ගැන්වීමටද වෙනදාට වඩා සාකච්ඡා පැවැත්වීය. නමුත් 2020 වසරේදී කලින් වසරට වඩා ආනයන වියදම ඩොලර් මිලියන 3,882 කින් අඩුවන විට අපනයන ආදායමද ඩොලර් මිලියන 1,893 කින් පහළ යාමේ ප්‍රතිඵල ලෙස වෙළඳ ශේෂ වාසිය ලෙස ආණ්ඩුවට ඉතිරි කර ගත හැකිව ඇත්තේ ඩොලර් මිලියන 1,893ක් පමණි. එම වාසියේ වැඩිම පංගුව ලැබී ඇත්තේ ඉන්ධන සඳහා 2020දී දරන ලද වියදම අඩුවීමය. ලෝක තෙල් වෙළඳපොළේ තෙල් බැරලයක මිල ඩොලර් 64 සිට 40 දක්වා පමණ අඩු වීමත් කොරෝනා තත්වය යටතේ ඉන්ධන භාවිතය අඩුවීමත් යන හේතු මත 2019දී ඉන්ධන ආනයනයට දරන ලද ඩොලර් මිලියන 3,891ක් වෙනුවට 2020දී වියදම් කරන ලද්දේ ඩොලර් මිලියන 2,542ක් පමණි. එහි වාසිය ඩොලර් මිලියන 1,349කි. මුළු වාසියෙන් ඒ ප්‍රමාණය අඩු කළ විට ආනයන සීමා කිරීමෙන් ඇතිවූ ලාබය වන්නේ ඩොලර් මිලියන 544ක් පමණි.

**ආණ්ඩුව ආදායම උපයන ක්‍රියාවලියක් හෝ නිෂ්පාදන ක්‍රියාවලියක් මගින් ආර්ථිකය මෙහෙයවනවා වෙනුවට සිදුකර ඇත්තේ රටේ පවතින මුදල් ප්‍රමාණයත් ආණ්ඩුවේ කටයුතු සඳහා යොදවා රට ණය කර තිබීමයි. ඒ නිසා ජනතාවගේ ආර්ථික කටයුතු, කර්මාන්ත, ව්‍යාපර හැකිළී යන අතර, දූෂිත පාලනයක් පවත්වා ගෙන යාමට රටේ ජනතාවට මුදල් ඉපැයීමටත් වියදම් කිරීමටත් සිදුව ඇත.**

ඒ අනුව මෙම ආනයන සීමා කිරීමෙන් ඩොලර් ඉතිරි කර ගැනීමක් නොව ලෝක තෙල් වෙළඳපොළේ ඇතිවූ වාසියේ ප්‍රතිඵලයක් නිසා ලද සහනයක් පමණක් බව පැහැදිලිය. නමුත් ඒ හා සමාන්තරව ආහාරපාන සඳහා පමණක් 2019ට වඩා ඩොලර් මිලියන 1,550ක් වැඩිපුර වියදම් කර ඇත. ඒ අතරද සීනි, පොල් තෙල් හා කිරිපිටි ආනයනයට දරන ලද වියදම ඉහළ යාම කැපී පෙනේ.

## ආදායම, වියදම සහ හිඟය


ආණ්ඩුව 2020 වසරේදී ලබා ඇති අයවැය හිඟය මහ බැංකු වාර්තා අනුව ඍණ -11.%කි. ඒ, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශයක් ලෙස ආදායම 9.2% (ප්‍රදානයන් සමග රුපියල් බිලියන 1,373) සහ වියදම 20.3% (රුපියල් බිලියන 3,040) ක් ලෙස ගණනය කිරීමෙනි.

2020 වසරට අගෝස්තු මාසයේදී ඉදිරිපත් කළ අයවැය මගින් පවා ආණ්ඩුව -7.9% ක මට්ටමේ අයවැය හිඟය පවත්වා ගැනීමට අපේක්ෂා කරන ලදී. නමුත් ඒ ඉටු කරගත නොහැකිව නිදහසින් පසු ලැබූ ඉහළම ආදායම බිඳ වැටීමේ ප්‍රතිශතය මෙවර පෙන්නුම් කර ඇත.

මෙම ආදායම බිඳ වැටීමට ප්‍රධාන ලෙස බලපෑ හේතුවක් වූයේ ආණ්ඩුව බලයට ආ විගසම තම ගජ මිතුරන් වෙනුවෙන් සිදු කළ බදු කපා හැරීමයි. ආර්ථික සේවා ගාස්තු, උපයනවිට ගෙවීම බදු, වැට් බදු, හා ජාතිය ගොඩ නැගීමේ බදු වැනි බදු රාශියක් ඉවත් කරන ලදී. එයින් රජයට සිදුවූ පාඩුව බිලියන 650කට වඩා වැඩි යැයි ගණනය කර ඇත. නමුත් ඒ බදු අත්හැරීමෙන් පීඩාවට පත්ව සිටි පොදු ජනතාවට කිසිදු සහනයක් නොලැබුණු අතර, රජයට සිදුවන පාඩුව ගෙවීමට සිදුවන්නේද අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ඉහළ දැමීම මගින් පොදු ජනතාවට මිස එම සහන අත්පත් කරගත් ඉහළ ධනපති පංතියට නොවේය.

අයවැය හිඟය -11.1%ක මට්ටමේ පවතින බව පෙන්වා ඇත්තේද ආණ්ඩුව වංචනික ක්‍රියාවලියක් හරහාය. ආණ්ඩුවේ අයවැය සකස් කිරීමේ ප්‍රතිපත්තිය වන්නේ අදාළ වියදම්, වියදම සිදු කරන වසරට ඇතුළත් කිරීමේ පදනම අනුවය. 2019ට අදාල වියදමක් 2020 මුලදී සිදු කරන්නේ නම් එය 2020 දී වියදමක් ලෙස සලකා ඇත. නමුත්, එම මුදල් පදනමට ගණනය කිරීමේ ක්‍රමවේදය 2020 වසරට පමණක් වෙනස් කොට 2020ට අදාළ රු. බිලියන 422ක වියදමක් 2019 වියදම් ලෙස ආපසු ගැලපීමක් සිදුකර ඇත. එහි වුවමනාව වී ඇත්තේ 2020 වියදම අඩුවෙන් දක්වා අයවැය පරතරය අඩු කොට පෙන්වීමයි. එම වියදම අඩු කොට පෙන්වීම ආර්ථික විද්‍යානුකූලව නිවැරදි කරන්නේ නම් 2020දී ඇත්ත වියදම රු. බිලියන 3,040ක් නොව රු. බිලියන 3,462ක් වනු ඇත. එවිට 2020 වසර සඳහා අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ඍණ 14% ක් වනු ඇත. එය ඉතිහාසයේ ඉහළම අයවැය පරතරයක්වීම වැළැක්වීමට මෙම වියදම් වෙනස් කිරීමද වංචනික ලෙස සිදු කර ඇත.

## ණය සහ සංචිත අවුල




2020 වසරේ අවසානයේදී රජයේ ණය නොපියවූ ප්‍රමාණය පමණක් ඩොලර් බිලියන 16,427කි. 2019 දී පැවැති එය අගය බිලියන 14,155කි. ඒ අනුව වසරකදී පමණක් රු. බිලියන 2,272ක් ආණ්ඩුව ණය වී ඇත. 1948 සිට 2005 දක්වා වසර 57ක් සඳහා රජයේ මුළු ණය පැවැතියේ රු. බිලියන 2,226 කි. ඒ, වසර 57ක ණය එකතුවට වඩා ණයක් ගෝඨාභය පාලනය විසින් එක වසරකදී ලබා ගෙන ඇත. මෙම රාජ්‍ය ණය පංගුව දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශයක් ලෙස 109%කි.

ආණ්ඩුවේ ආදායම මෙන් දෙගුණයකට ආසන්න ප්‍රමාණයක් ණය ගැනීමෙන් රට ඇද දමා ඇති ආර්ථික උගුලේ තරම හිතාගත හැකිය. ආණ්ඩුවට විදෙස් ණය ලබා ගැනීමේ මාර්ග ඇහිරීයාමත් සමග, විශේෂයෙන් ණය ශ්‍රේණිගත කිරීම්වල අසාදු ලේඛනයට වැටීමත් සමග ආණ්ඩුවට සිදුවූයේ දේශීය මූලාශ්‍ර ලෙස මහ බැංකුවෙන් මුදල් අච්චු ගැසීමට සහ වාණිජ බැංකුවලින් ණය ලබා ගැනීමටය. 2020 වසරේදී පමණක් වාණිජ බැංකු සහ මහ බැංකුව රජයට ලබා දී ඇති ණය ප්‍රමාණය රු. බිලියන 4,548ක් වන අතර එය 2019 වසරට වඩා රු. බිලියන 1,752 කින් ඉහළ යාමකි.


ආණ්ඩුව ජනතාවගේ බැංකුවල ඇති තැන්පතු මුදල් සහ මහා බැංකුවේ මුදල් අච්චු ගැසීමෙන් තම අර්බුදයට පිළියම් සොයා ඇත්තේ එලෙසය.

(7.13 ප්‍රස්ථාරය)

ආණ්ඩුව ආදායම උපයන ක්‍රියාවලියක් හෝ නිෂ්පාදන ක්‍රියාවලියක් මගින් ආර්ථිකය මෙහෙයවනවා වෙනුවට සිදුකර ඇත්තේ රටේ පවතින මුදල් ප්‍රමාණයත් ආණ්ඩුවේ කටයුතු සඳහා යොදවා රට ණය කර තිබීමයි. ඒ නිසා ජනතාවගේ ආර්ථික කටයුතු, කර්මාන්ත, ව්‍යාපර හැකිළී යන අතර, දූෂිත පාලනයක් පවත්වා ගෙන යාමට රටේ ජනතාවට මුදල් ඉපැයීමටත් වියදම් කිරීමටත් සිදුව ඇත.

## වත්කම් සංචිත අවුල

2020 මහ බැංකු වාර්තාවට අනුව 2019 වසර අවසානයට පැවැති දළ නිල විදේශ වත්කම් ප්‍රමාණය ඩොලර් මිලියන 7,642කි. (බිලියන 7.6)




එය 2020 අවසානය වනවිට ඩොලර් බිලියන 02කින් අඩුවී ඩොලර් මිලියන 5,664ක් දක්වා අඩු වී ඇත. (ඩොලර් බිලියන 5.6) 2021 - මාර්තු 31 වනවිට මෙම ප්‍රමාණය තවත් ඩොලර් බිලියනයකින් පහත වැටී ඩොලර් බිලියන 4ක් දක්වා අඩුවී තිබේ. ආණ්ඩුව

12 වැනි පිටුවට

# පොලිටිකල් පංතිය

කොරෝනා කාලේ මැද වුණාත් සිලබස් එක කවර් වුණේ නෑ කියල පොලිටික්ක පංති දාලා. ළමයි මාස්ක් දාගෙන බිල්ලො වගේ වට පිට බල බලා පංතියට ඇදෙනවා.

'ගුඩ් මෝනිං සර්' අනුරුද්ධිය එන ගමන්ම කිවුව.

'ගුඩ් මෝනිං වසන්ති' පොලිටික්කට ටැපලුණා.

'සර් මම වසන්ති නෙවෙයි... අනුරුද්ධිකා' අනුරුද්ධිය නම කෑල්ල බර කළා.

'සමාවෙන්න ළමයො. මට අඳුරගන්න බැරිවුණා'. පොලිටික්කා කීවට කෙල්ලගේ හිතට හරි ගියේ නැත්තෙ වසන්තයගෙ 'ඇද්ද උඹට' බැල්මට.

'බලන්නකො සර්... මාර කේස් එක නේද? කනිය බෙල්ලෙ දාන් ඉන්න මාස්ක් එක තව පහළට කළේ කට නිකටෙ කියල හිතල හිතාගෙනද මන්ද.

'මොකක්ද ළමයො කේස් එක කිවුවෙ?' 'පොලිටික්කා' මොන මරාලයක්ද වගේ බැල්මක් දැම්ම.

'කනියො, ඔහොම බහුවරණ ප්‍රශ්න දාන්න එපා. 'මාර කේස් එක' කිවුවහම ඕනෑම කෙනෙක්ට පැටලෙනව. අහන්නෙ විල්පත්තු කේස් එකද, සිංහරාජෙ කේස් එකද, ගම සමග පිළිසඳර කේස් එකද, සීනි කේස් එකද, පොල් තෙල් කේස් එකද, කොරෝනා කේස් එකද, වැක්සීන් ගහන කේස් එකද, වැක්සින් ගාණෙ කේස් එකද, සංචරණ සීමා කේස් එකද, පෝට් සිටි කේස් එකද, ණය කේස් එකද, නැව් කේස් එකද, කොළඹ ඉඩම් කේස් එකද, චීන කුණු පෝර කේස් එකද, නැත්තම් නගරාධිපතියගෙ බර්ත්ඩේ කේස් එකද කියලා හරියට කියපන්. තවත් කොච්චර කේස් තියෙනවද ලංකාවෙ මිනිහෙකුට හිතන්න.' මංජුට එරමිණිය ගොතාගෙන ඉඳගත්තෙ නැතුව විතරයි.

'නෑ මං ඇහුවෙ සර් අම්බානක් ෆේල් වෙච්ච කේස් එක' කනිය පැහැදිලි කරන්න ගිහින් නූල් බෝලෙ තවත් ඇනුව.

"ඒක තමයි මම කිවුවෙ කේස් එක හරියට කියන්න කියල. මොකද ඔය හැම කේස් එකෙන්ම සර් පට්ට ෆේල්. ඉතින් සර් ෆේල් කේස් එක කිවුවට මෙලෝම අදහසක් එන්නෙ නෑ." මංජුව ඔළුව දෙපැත්තට වැනුව මොළේට ලේ උනන්න වගේ.

"මටත් හිතා ගන්න බෑ ළමයිනේ මෙච්චරම දේවල් අවුල් වෙන්නෙ මොකද කියල. බලන්න ඡන්දෙ වෙනකම් කට්ටියම එකට කොච්චර හොඳට කැම්පේන් එක කළා ද?" පොලිටික්කගෙ ඇස්වල කඳුළු.

"බලාගෙන යන කොට මම හිතන්නෙ සර් හොඳටම කළේ අප්‍රේල් කරපු වැඩේ කියල" සමන කිවුවා.

"ඕව් ඇත්ත සමන්. බලන්න කොච්චර හොඳට මිනිස්සුත් හැසිරුණාද? කොල්ලො ටික ඔක්කොම වැඩ ටික තිතට ප්ලෑන් කළා. අප්‍රේල් අග වෙනකොට මේක ඉවර වෙන්නත් ගියානෙ" පොලිටික්ක පංතිය දිහා බැලුවෙ ඇස් ලොකු කරල..."බලන්න ඡන්ද තියන්න තීරණේ අරගෙනත්නෙ තිබුණෙ"

"මට හිතෙන්නෙ සර් පටලගත්ත. සර් කියන්නෙ දෙදහස් විස්ස ගැනනෙ. මම කිවුවෙ ඊටත් අවුරුද්දක් කලින් දෙදහස් දහ නවයෙ අප්‍රේල් ගැන"

"හත්දෙයියනේ සමන් කියන්නෙ එතකොට මේ පාස්කු ප්‍රහාරය සැලසුම් කරල කළේ සර් කියලද? හීනෙන්වත් එහෙම හිතන්න එපා... පවු සිද්ධවෙයි" පොලිටික්ක බය වෙච්ච පාර කවුරුවත් අහගෙන හිටියද බලන්න ජනේලෙනුත් එබුණා.

කලබල වෙන්න එපා සර්. මං කිවුවෙ පාස්කු කේස් එක ගැන නෙමෙයි. ඒකත් සැලසුම් කරපු වැඩක් තමයි, කවුද කියල තාම ඔප්පු වුණේ නැති වුණාට... මම කිවුවෙ ඒකෙන් දවස් දෙක තුනකට පස්සෙ සර් ඇවිත් තමන් ජනාධිපතිවරණයට ඉල්ලනවා කියලා කියපු එක ගැන. ඒක වෙල් ප්ලෑන්ඩ්" සමන කොයිතරම් දරුණු වංගුවක් නැමුවද කියනවනම් පොලිටික්කට හුස්ම වැටුණෙ ඊට පස්සෙ.

"මොකද්ද සමන් වෙල් ප්ලෑන්ඩ් කතාව?" පොලිටික්ක උඩු තොල ඉස්සරහට දාල කමිසෙ අස්සට පිඹින ගමන් ඇහුව.

"අපි දන්න, අපි දැකපු ටික ඒකනෙ. බලන්න ඒක කොයි තරම් සැලසුමකට කියවුණාද කියල. තාම මිනී කෑලි එකතු කරන ගමන්. මිනිස්සු ඔක්කොම මරණ බයෙන්. සමාජය තැතිගැන්විලා. සර් ඇවිල්ල සංසුන්ව තමන් ඡන්දෙට ඉදිරිපත් වෙනවා, මේ රටේ ජනතාව බේරා ගන්නවා කියනකොට ඒක මිනිස්සුන්ට වැදුණා. ඒක වෙල් ප්ලෑන්ඩ් නෙමෙයිනම් ඊට පස්සෙ නාගන්නෙ නැතුව, ප්ලෑන් කරල කරපු එක දෙයක් කියන්නකො" සමන පහක් දාන්න වගේ අත දානකොට පොලිටික්ක හිටියෙ නෑ.

කවුළුව හැරී තබමි

# තාරුණ්‍යය සොයා ගන්න... ඔවුන් වෙතට යන්න...

තරුණයෝ ආවේගශීලීය, හිතුවක්කාරය, අතිධාවනකාරිය යනුවෙන් වැඩිහිටි පරම්පරාව තුළ පොදු මතයක් ඇත. අපි මේ කථාකරන තරුණ පරම්පරාවද ආවේගශීලී විය. හිතුවක්කාරී විය. අතිධාවනකාරී විය. නමුත් ඔවුන් අද අප අතර නැත. මියගොස්ද නැත.

ඔවුන්ගේ සිරුරු පුළුස්සා අළුකර දමලාය. නමුත් මරා දැමීමට නොහැකි වී ඇත. මේ අන්කවුරුවත් නොව අප සැම වසරකම ජූනි 20 වැනි දින සමරනු ලබන විරු සිසුවෝය.

ඇත්තය. ඔවුහු ආවේගශීලී වූහ. ඒ, මේ අසාධාරණ සමාජ ක්‍රමයට එරෙහිවය. ඇත්තය. ඔවුහු හිතුවක්කාරී වූහ. එහෙත් ඒ, මෙම අයුක්තිසහගත සමාජ ක්‍රමයට එරෙහිවය. ඇත්තය. ඔවුහු අතිධාවනකාරී වූහ. එහෙත් මේ දූෂිත සමාජ ක්‍රමයට එරෙහිවය.

රටකට තරුණයින් සිටියද සහ තරුණකම තිබුණද "තාරුණ්‍යය" නොමැති නම් එහි වටිනාකමක් නැත. තරුණයන් හා තරුණකම සංඛ්‍යාත්මකව ගිණිය හැක. එහෙත් "තාරුණ්‍යය" එසේ කළ නොහැක. කොටින්ම තාරුණ්‍යය යනු ස්වාර්ථකාමයේ අංශුමාත්‍රයක්වත් නොමැතිව මිනිස් වර්ගයාගේ යහපත වෙනුවෙන්ම තම දිවිය කැපකරන තරුණයන්ගේ විශේෂිත ගුණයයි. අප කථාකරන විරු සිසුවන්ට එය නොඅඩුවම තිබුණි. ඔවුන් තාරුණ්‍යයෙන් පිරිපුන් යයි අපි කියන්නේ එනිසාය. ඔවුන් රට කන, රට වනසන පාලකයන්ව දුටුගැමුණුලා කර තාප්පවල ඇන්දා වූද පාරවල් අසල කිරිබත් කැවා වූද ඇටිකෙහෙල් ගිල දැමූ උගුඩුවන්ගේ ගණයට අයත් වූවෝ නොවූහ.



අදද තරුණයෝද සිටිති. තරුණකමද තිබේ. නමුත් තාරුණ්‍යය සොයා ගැනීමට නම් විරු සිසුවන් දෙසට හැරෙන්න. ඔවුන් අධ්‍යයනය කරන්න... ඔවුන් පසුකර ඉදිරියට යන්න...

# අපි පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් මව්බිම විකුණන්නෙමු



එදා වගේම අදත් අපට පළමුවත් මව්බිම! දෙවනුවත් මව්බිම! තෙවනුවත් මව්බිම! මේ පසුගියදා යෙදී තිබුණු රණවිරු දිනයේදී අපේ රටේ අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ කළ විශේෂ ප්‍රකාශයේදී පළ කළ උදාන වාක්‍ය කිහිපයකි. එසේ කර දින දෙකකට පසු කොළඹ පෝර්ට් සිටි පනත හෙවත් පෝර්ට් සිටිය චීනයට 99 අවුරුද්දකට පවරාදෙන පනත අගමැතිද ඡන්දය දී වැඩි ඡන්දයෙන් පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත්තේය.

ඒ අනුව හිටපු 'මහරජාණන් වහන්සේට' තම උදාන වාක්‍යවලට මේ ටිකද එකතු කර ගැනීමට අමතක විය. එනම් " පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් අපි මව්බිමම විකුණං කන්නෙමු" යන්නයි. මෙහිදී රාජපක්ෂ නඩය බලය හා මුදල් වෙනුවෙන් තමන්වම පාවාදෙමින් මුළු රටම පවා දී ඇත. මෙසේ කරන්නේද මුදලට බලයට රටම පාවාදී ඇති රාජපක්ෂ පවුලේ පුංචි හාදයා ධන තෘෂ්ණාවෙන් මිදෙන්න කියමින් අපට සිංදු කියන ගමන්ය.

රාජපක්ෂවරු බලයට ගෙනා මේ රටේ බහුතරයක් කාන්තාවෝ කිරිබත් කමින් නැටුවෝය. පිරිමි සුරාවෙන් මත්වී ප්‍රීති ඝෝෂා කරමින් වීදි පුරා නැටුවෝය. තරුණ තරුණියෝ තාප්ප පුරා චිත්‍ර අඳිමින් චිත්තප්‍රීතියෙන් මත් වී ගියෝය. මැදමූලන නිකායේ සඟ ගණයා දිවා රෑ පිරිත් සංගායනා කළෝය. කුලී ලියන්නෝ සහ කියවන්නෝ මාධ්‍ය අරක්ගෙන කට දෙකොනින් වසුරු හළමින් ස්තෝත්‍ර ගායනා කළෝය. දැන් අපට ඇසීමට ඇත්තේ මෙපමණකි. ඔබලාට හිසේ සිට දෙපතුළ දක්වා තිබූ සියලු රෝග දැන් සනීපද කියාය. ඔබට දැන් සැපදැයි අපි නොඅසමු.

# බබා දයාගේ වෙසක් කූඩුව

පසුගිය දිනවල රූපවාහිනී නාලිකා ප්‍රවෘත්ති විකාශනවල අපූරු ප්‍රවෘත්තියක්ද විකාශනය කළේය. එය වෙසක් උත්සවය වෙනුවෙන් කළ අපූරු සොයා ගැනීමකි. සමහර ප්‍රවෘත්ති නාලිකා එය පළ කළේ හරියට කොවිඩ් වසංගතයට ශ්‍රී ලංකාවෙන් නවතම එන්නතක් සොයා ගත්තා සේය. ප්‍රවෘත්ති අතර එය විශේෂ ප්‍රවෘත්තියක් වූ සේය.

පුවත වූයේ දයාසිරි ජයසේකර ඇමතිවරයා මෙවර වෙසක් උත්සවයට කොළඹ නගරය සැරසීම සඳහා තම අමාත්‍යාංශය මගින් බතික් වෙසක් කූඩු වගයක් හදා එහි ප්‍රථම කූඩුව අගමැතිවරයාට ප්‍රදානය කිරීමය. එක අතකට සරුංගල් පවා චීනයෙන් ගෙන්වන රටක එය පුදුමයට කාරණයකි. මේ මහා බෞද්ධ රටට බෞද්ධ කොඩිය ගෙන්වන්නේද චීනයෙනි. ඒ අතින් ගත්කල දයාසිරි බබා, අගමැති තාත්තා ඉදිරියේ මහා ප්‍රාතිහාර්යයක් පා තිබේ.

සිනහවට කරුණ වන්නේ රටේ දෙවෙනි පුරවැසියාද එය මහානාර්ඝ නිපැයුමක්සේ රටටම පෙන්න පෙන්න භාර ගැනීමය. මෙවැනි මොන්ටිසෝරි



වැඩ පෙන්නා ලකුණු දමාගත හැක්කේද මොන්ටිසෝරි වැසියන් වෙසෙන රටකම පමණි.

2021 මැයි 20

# මේ ආණ්ඩු 'ආර්ථික හැරවුම් ලක්ෂ' ගැන කතා කරනකොට පාර්ලිමේන්තුවේ බිත්ති කොක්හඬලා හිනා වෙනවා

(පෝට් සිටි කොමිෂන් සභා පනත පිළිබඳ විවාදයට එක්වෙමින්)

පාර්ලිමේන්තු මන්ත්‍රී
අනුර දිසානායක සහෝදරයා

අපි මේ සාකච්ඡා කරන්නේ, හෙක්ටයාර් 269ක් ගොඩ කරලා, ඊට අනුබද්ධ හෙක්ටයාර් 446ක බිම්කඩක් පිළිබඳවයි. ඒ බිම්කඩේ මේ වන විටත් රජයට අයිති හෙක්ටයාර් 62ක භූමියක්ද, චයිනා හාබර් සමාගමට අයිති හෙක්ටයාර් 116ක භූමියක්ද, හෙක්ටයාර් 91කින් සමන්විත පොදු පහසුකම්වලින් සමන්විත භූමියක්ද තියෙනවා. මේ භූමිය පාලනය වන්නේ කෙසේද, කවර ආයතනයකින්ද, මේ භූමියේ යටිතල පහසුකම් සැපයීම කාගේ වගකීමක්ද, භූමිය තුළ ක්‍රියාත්මක කරන ආයතනවලට කවර බදු පහසුකම් දෙන්නේද, කවර බදු සහන ඉවත් කරන්නේද, කොපමණ කාලයකට ලබා දෙන්නේද කියලා තීරණය කරන නීතියක් සම්මත කරන්න යනවා. මේ භූමියට ගොස් භාණ්ඩයක් අරගෙන යළි මේ භූමියට ඇතුළත් වන්නේ නම්, පනවන බදු ගැන නීතියක් සම්මත කරන්න යනවා. සැබැවින්ම ගත්තොත්, වෙනම කලාපයකට අයිති නීති සමුදායක්. සමහර නීතිවලින් බැඳීමක් තිබෙන, සමහර නීති ලිහිල් කරන, සමහර නීති මුළුමනින්ම අත්හැරීමක් සිදුකරන්න යනවා.

### මූල්‍ය පාලනයෙන් ගිලිහීම

මධ්‍යගත රාජ්‍යයක පැවැත්ම තිබෙන්නේ, ජනතාවගේ පරමාධිපත්‍යය නියෝජනය කරන පාර්ලිමේන්තුවේ බලය එම රාජ්‍යය පුරාම විසිරී පැවැතීම, පාර්ලිමේන්තුවේ සම්මත කරන නීති රාජ්‍යය පුරාම විසිරී පැවැතීම, සමාන අයිතිවාසිකම්වලින් සමන්විත පුරවැසියන් රාජ්‍යය පුරාම සිටීම යන මූලික ලක්ෂණ ක්‍රියාත්මක වීම තුළින්. හැබැයි, මේ පනතින් මේ පාර්ලිමේන්තුවට මධ්‍යගත නොවන විශේෂයෙන්ම මූල්‍ය පනත් හතකට යටත් නොවන ප්‍රදේශයක් හදනවා. තවත් පනත් 14ක් කොමිෂන් සභාවට අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට දෙනවා. මහජනයාගේ මූල්‍ය බලය පාලනය කිරීමේ පාර්ලිමේන්තු බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 144 වැනි වගන්තියෙන් තහවුරු කර තිබෙනවා. අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කිරීම පමණක් නොවෙයි, එය පරීක්ෂා කිරීමේ බලයත් පාර්ලිමේන්තුවේ කෝප් සහ කෝපා කොමිෂන් සභාවලට පැවරී තිබෙනවා.

පසුගිය කාලයේ කෝප් කාරක සභාව පිළිබඳ විශාල සංවාදයක් ආවා. මහජනයාගේ මුදල් කවර හෝ ප්‍රමාණයක් යම් ආයතනයක රුපියලක් හෝ යොදවා තිබෙනවා නම්, කෝප් සභාවට කැඳවිය හැකි බවට නීතිපතිවරයා නිශ්චිතව දැක්වූවා. පෝට් සිටි කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ මූල්‍ය බලය සමඟ ගැටග ැසෙනවා නම්, කෝප් සභාවට කැඳවිය යුතුයි. හැබැයි, එහෙම කැඳවීමේ බලයක් නැහැ. මෙය ආකාර ගණනාවකින් පාර්ලිමේන්තු මූල්‍ය බලයෙන් ඉවත් වෙනවා.

මෙතෙක් පැවැති ආයෝජන කලාප තුළ කිසිදු නේවාසික පුරවැසියෙක් නැහැ. එළියේ ඉඳලා වැඩට ගිහිල්ලා, ගෙදර එනවා. මෙම කලාපයේ තව විශේෂයක් තමයි, නේවාසික පුද්ගලයන් ඉඳීම. මෙම නේවාසික පුද්ගලයන් ශ්‍රී ලාංකික පුරවැසියන් පමණක් ද? නැහැ. ශ්‍රී ලංකාවේ පුරවැසිභාවයට යටත් නොවන පුරවැසියන් කණ්ඩායමක් එහෙ නිර්මාණය වෙනවා. එය බොහෝ විට චීන ගහනය වෙන්න පුළුවන්. ශ්‍රී ලාංකික පුරවැසියන් ප්‍රමාණයකුත් ඉන්න පුළුවන්.

### දිගේලි වන ස්වාධිපත්‍යය

හැබැයි, මේ පළාත පාලනය වෙන්නේ කාගෙ න්ද? මෙය අපේ රටේ ආර්ථිකය ලිහිල්කරණයක් පමණක් නොවෙයි. අපේ රටේ ස්වෛරීභාවය, ස්වාධිපත්‍යය, ස්වාධීනත්වය සැලකිය යුතු ප්‍රමාණයකට දිගේලි කරලා තියෙනවා. එවැනි දිගේලි කිරීමකින් තොරව ආයෝජකයන් ගෙන්වා ගන්න බැරිනම් අවංකව ඒක කියන්න. සඟවන්න එපා. මේ අණපනත් සම්මත කරන්නේ කවුද? මහින්ද රාජපක්ෂ මැතිතුමා කළ ප්‍රකාශයක් තියෙනවාඃ "ලංකා ආණ්ඩුවෙන් විකුණන දේවල් ගන්න එපා. අපි බලයට ආ ගමන් විකිණූ සියල්ල ආපසු ගන්නවා." මෙහෙම ජනතාවට එකඟතාව දීපු පාලකයන්.

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කළ ප්‍රකාශයක් තියෙනවාඃ "වත්මන් රජය - ඒ වෙලාවේ තිබුණු රජය - විකුණා දැමූ සම්පත් සියල්ල යළි රටට පවරා ගන්නවා". බලය ලබා ගැනීම සඳහා එවැනි දේශපාලන මතවාදයක් නිර්මාණය කළ ආණ්ඩුවක්. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපති පුටුවේ වාඩි වෙලා, පළමුවැනි වතාවට ගියේ ඉන්දියාවට. ඉන්දියාවේ මාධ්‍ය ආයතනයක් එක්ක කළ සාකච්ඡාවක දී ප්‍රකාශ කළාඃ "හම්බන්තොට වරාය විකිණීම වැරැද්දක්. ඒ ගිවිසුමේ විශාල වැරදි ගණනාවක් තිබෙනවා. එම වැරැදි නිවැරදි කරනවා". හැබැයි, සති දෙකකට පසුව නැවත කීවේ, හම්බන්තොට වරාය ගිවිසුමේ කිසිදු වැරැද්දක් සිදු වී නැති බවයි.



මේ පාර්ලිමේන්තුවේ හම්බන්තොට වරාය ගිවිසුම සාකච්ඡා වෙන වෙලාවේ, ඒ ගිවිසුමට අනුව විශාල බදු සහන ලබා දෙන්න ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ සම්මත කරන කොට විපක්ෂයේ සිටි ඔය කණ්ඩායම නැඟිටලා ගියා. එදත් හම්බන්තොට වරාය විකිණීමටත්, ඊට බදු සහන ලබා දෙන ගැසට් නිවේදනවලටත් විරුද්ධව ඡන්දය පාවිච්චි කළේ අපේ මන්ත්‍රී කණ්ඩායමයි, තව අතරමං වෙලා හිටිය පස්දෙනෙකුයි විතරයි. එදා හම්බන්තොට වරාය විකිණීමට විරුද්ධව කිසිදු රාජපක්ෂවරයෙක් පාර්ලිමේන්තුවේ කට ඇරලා තියෙනවාද? පුළුවන් නම් කියන්න.

> ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුව විවෘත කිරීමට ඇවිල්ලා, ආර්ථික දැක්මක් ඉදිරිපත් කළා. ඒ ආර්ථික දැක්මේ කොතැනක හෝ මේ වරාය නගරය ගැන කිසි තැනක සටහනක් නැහැ. මේක තමන්ගේ ආර්ථිකයේ හැරවුම නම්, පහුගිය අගෝස්තු මාසයේ 20 වැනිදා කළ කතාවේ සඳහන් නොවුණේ ඇයි? මාස හත අටක් ගිහින් ආර්ථිකයේ හැරවුම බවට පත් වෙන්නේ ඇයි? මේක ශ්‍රී ලංකා ආර්ථිකයේ උපායමාර්ගයේ කොටසක් නොවෙයි. මේක චීන ලෝක දේශපාලන ව්‍යාපෘතියේ කොටසක්.

### පවුලක ව්‍යාපෘතිය

ඒ නිසා මේ දේශපාලන ව්‍යාපෘතියක් වාගේම යම් පවුලක ව්‍යාපෘතියක්. මේ පැත්තෙන් මේ අය ඉන්න කොට අනෙක් පැත්තෙන් ඉන්නේ, චයිනා හාබර් සමාගම. හෙක්ටයාර් 116 අනූනව අවුරුද්දකට හිමි කරගෙන තියෙන්නේ, මේ සමාගම. මේ පවුල් කඳවුරට චයිනා හාබර් සමාගමේ, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ 013359190 ජංගම ගිණුමෙන් 2014 දෙසැම්බර් 12 වැනි දින 981321 දරන චෙක් පතෙන් මිලියන 40ක් ලබා දෙනවා. 2015 ජනවාරි 07 වැනිදා 981328 දරන චෙක් පතෙන් මිලියන 25ක් නිදහස් කරනවා. 2015 ජනවාරි 02 වැනි දින 981333 දරන චෙක් පතෙන් මිලියන 25ක් නිදහස් කරනවා. 2015 ජනවාරි 07 ඡන්දයට කලින් දා 981335 දරන චෙක් පතෙන් මිලියන 25ක් නිදහස් කරනවා. 2014 දෙසැම්බර් 31 වැනිදා 981319, 981320 දරන චෙක්පත්වලින් මිලියන 58ක් නිදහස් කරනවා. මේ මුදල් නිදහස් කරන්නේ කාටද? ජනාධිපතිවරණයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ දේශපාලන වැඩවලට. මෙතැන ඉන්න චයිනා හාබර් සමාගම තමයි. නිව්යෝර්ක් ටයිම්ස් පුවත් පත වාර්තා කළා ඩොලර් මිලියන 7.3ක් ලබා දුන්නා කියලා. ඒ වෙලාවේ මහින්ද රාජපක්ෂ මහත්මයා පාර්ලිමේන්තුවටත්, රටටත් කීවා, නිව්යෝර්ක් ටයිම්ස් එකට විරුද්ධව නඩු දානවා කියලා. අපි බලන් හිටියා නඩු දානකම්.

ඒ විතරක් නොවෙයි, පෝට් සිටිය ආසන්නයේ සි.අයි.බී.ටී. සමාගම දකුණු කොළඹ වරාය සංවර්ධනය භාර ගත්තු සමාගම. ඒ සමාග මෙන් 1,94,10,000ක් චෙක් පත් අංක 594191 මඟින් පුෂ්පා රාජපක්ෂ පදනමට දෙනවා. දැන් එතකොට කවුරු අතරද මේ ගනුදෙනු තියෙන්නේ? අද පාර්ලිමේන්තුවෙන් සම්මත කර දී, ඒ නීතියෙන් වැඩි බලයක් ලැබෙන මේ සමාගම කවුද? මේ රටේ දේශපාලන චෞරයන් නිර්මාණය කිරීම සඳහා සමහර හාමුදුරුවන් වහන්සේලාටත් මුදල් ලබාදී තියෙනවා. මේක ඇතුළේ තියෙනවා, ඉතාමත් කැත ගනුදෙනු. මහජනයාගේ දේපොළ පවරා දීම සඳහා මුදල් කුට්ටි මත සම්පාදනය කර දෙන නීතියක් මේක.

එක් පවුලකට මහා ධනයක් ලබා දීලා, ඒ පවුල විසින් නීති සම්පාදනය කරන්න තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නෙ මොකද? කොවිඩ් රෝගය මර්දනයට සල්ලි ගෙනැවිත් දෙනවා නම්, තමුන්නාන්සේලා අත් උස්සන්න. පී. සී. ආර්. පරීක්ෂණ වැඩි කරන්න මුදල් අනුමත කරන්න අත් උස්සන්න. කඩාවැටිලා තියෙන ආර්ථිකයට සහනයක් ලබා දෙන්න නම්, අත් උස්සන්න. මෙවැනි කළු ගනුදෙනු පිරිච්ච සමාග මකට බලතල ලබා දෙන නීතියකට තමුන්නාන්සේලා අත් උස්සන්නේ ඇයි? මම අහන්නේ එච්චරයි.

### විදේශිකයන් අතට යාමේ අවදානම

ලංකාවේ පළමු වතාවට අපේ රටේ කිසිදු ආයතනයකට පත්කරන පරිපාලකයන් ශ්‍රී ලාංකිකයන් විය යුතුයි කියලා සඳහන් කරන්නේ නැහැ. එහෙම නොලියන්නේ ඇයි ? එහෙම නොලියන්නේ, මේ පාර්ලිමේන්තුව මේ රටේ පුරවැසියන් වෙනුවෙන් නීතියක් සම්මත කරන නිසා. මේ පනතට ඒ හා සමාන ලෙසම 5-7ක කොමිසමක් පත් කරනවා කියලා තිබුණා. මේ පනතේ යටි ගනුදෙනු තියෙන බව අපි දැනගෙන හිටියා. ඒ නිසා සමාජය, මේ අය ශ්‍රී ලාංකිකයන් පමණක්ද කියලා ප්‍රශ්නයක් ඇහුවා. අපිට සැකයක් තිබුණා, මෙය ශ්‍රී ලාංකිකයන්ගෙ න් පමණක් සමන්විත වෙන්නේ නැහැ කියලා. අධිකරණයෙත් මේ ප්‍රශ්නය විමසුවාට පස්සේ අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් කීවේ, බහුතරය ශ්‍රී ලාංකිකයන් කියලා. මෙහි සාමාජිකයන් 07 වෙනවා නම්, හතර දෙනෙක් ශ්‍රී ලාංකිකයන්. දැන් තත්ත්වය මොකක්ද? මේ හතර දෙනා ද්විත්ව පුරවැසියන් වීමේ ඉඩක් තියෙනවා. එක් චීන ජාතිකයෙකුට මේ රටේ ටික කලක් ඉඳලා, ද්විත්ව පුරවැසිකම අරගෙන මුළු කොමිසමේම බලය ගන්නත් පුළුවන්.

ඇයි ඒ පැත්තට හිතන්නේ? ඒ තරම් යටි ගනුදෙනු මේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා මේ ආයතනයත් මේ රටේ සමහර පවුල්වලටත්, සමහර දේශපාලකයන්ටත් මුදල් වියදම් කරලා තියෙනවා. ඒ නිසා ඒ සාධාරණ සැකය අපට තිබෙනවා. මේ රටේ මොන කොමිෂන් සභාවේද විදේශිකයකුට අවස්ථාවක් නිර්මාණය කළේ? ලංකාවේ පළමුවැනි වතාවට විදේශිකයන්ට කෝටා එකක් වෙන් කරනවා. ඒ කියන්නේ, මෙම කොමිෂන් සභාවේ බහුතරය ශ්‍රී ලාංකිකයන් වෙන කොට අනෙක් අය විදේශිකයන් විය හැකියි.

විදේශිකයන්ගෙන් සමන්විත මේ කොමිසමට දෙන බලය මොකක්ද? පාර්ලිමේන්තුව සතුව තියෙන බලතලවලින් ප්‍රමාණයකුත් කොමිෂන් සභාවට පවරනවා. ඕනෑම ආයෝජනයක් ගෙන්වා ගැනීමට මෙතෙක් ආයෝජන මණ්ඩල පනත, ක්‍රමෝපායික සංවර්ධන පනත තියෙනවා. ඕනෑම ව්‍යාපෘතියක් වෙනුවෙන් ක්‍රමෝපායික සංවර්ධන පනත හරහා බදු සහන ලබා දෙන්න පුළුවන්. ෂැන්ග්‍රිලා ව්‍යාපෘතිය ආපු වෙලාවේ, ක්‍රමෝපායික ව්‍යාපෘතියක් ලෙස නම් කරලා, ගැසට් එකක් ගහලා, බදු සහන ලබා දුන්නා. අවුරුදු 15ක් යන තෙක් කිසිදු බද්දකට යටත් නැහැ. තව අවුරුදු 13ක් යන තෙක් සියයට 50යි. හරිද වැරදිද වෙනම එකක්. ගැසට් එක පාර්ලිමේන්තුවට ඇවිත් සම්මත කළා.


හම්බන්තොට වරාය විකුණුවාට පස්සේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස නම් කර බදු සහන දෙන ගැසට් එක පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ නිසා මේ රටේ ජනතාව දැනගත්තා. හැබැයි, තමුන්නාන්සේලා ක්‍රමෝපායික සංවර්ධන පනත මෙම බලප්‍රදේශයට අදාළ නොවන පනතක් බවට පරිවර්තනය කළා. අවශ්‍ය වන බදු සහන ලබා දීම වෙනුවෙන් මේ කොමිෂන් සභාවට පූර්ණ බලයක් නිර්මාණය කර දෙනවා.

ඒ නිසා මා නැවත නැවත කියනවා, මෙය අපේ ස්වෛරීත්වය, ස්වාධීනත්වය, අපේ ස්වාධිපත්‍යයේ යම් කොටසක් අත්හැරීමක්; දිගේලි කිරීමක්; පවරා දීමක්; ලිහිල් කිරීමක් කියලා. තමුන්නාන්සේලා හැමදාම කියන කතාවක් "ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍යය" කියලා. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුව විවෘත කිරීමට ඇවිල්ලා, ආර්ථික දැක්මක් ඉදිරිපත් කළා. ඒ ආර්ථික දැක්මේ කොතැනක හෝ මේ වරාය නගරය ගැන කිසි තැනක සටහනක් නැහැ. මේක තමන්ගේ ආර්ථිකයේ හැරවුම නම්, පහුගිය අගෝස්තු මාසයේ 20 වැනිදා කළ කතාවේ සඳහන් නොවුණේ ඇයි? මාස හත අටක් ගිහින් ආර්ථිකයේ හැරවුම බවට පත් වෙන්නේ ඇයි? මේක ශ්‍රී ලංකා ආර්ථිකයේ උපායමාර්ග යේ කොටසක් නොවෙයි. මේක චීන ලෝක දේශපාලන ව්‍යාපෘතියේ කොටසක්. ඔවුන්ට යුදමය සැලැස්මක්, ආර්ථිකමය සැලැස්මක්, දේශපාලනමය සැලැස්මක් තියෙනවා. අපි හිතනවා, සාපේක්ෂව ගත්තොත්, ලෝකයේ බලතුලනයක් තියෙන

12 වැනි පිටුවට

# රට රකින්න ආපු ආණ්ඩුවෙන්....

03 පිටුවෙන්...




විල්බැරැක් වල භාණ්ඩ රැගෙන ආ අතර එය ආණ්ඩුව හාස්‍යයට ලක්කිරීමක්ද විය. මෙහිදී ආණ්ඩුව කළේ එලෙස භාණ්ඩ රැගෙන ආ මුව ආවරණයක් නොපැළඳි අයෙක් අත්අඩංගුවට ගැනීමය.

ආණ්ඩුව දිගටම ආණ්ඩුවට එන විවේචන වැළැක්වීමට හා ආණ්ඩු විරෝධීන් මර්දනය කිරීමට නිරෝධායන නීති යොදා ගනිමින් සිටී. ආණ්ඩුවේ අය ප්‍රසිද්ධියේම නිරෝධායන නීති කඩන අතර තම විරුද්ධවාදීන් දඬයම් කිරීමට ආණ්ඩුව මෙම නීති යොදාගන්නා බව ජනතාව දනී. ඒ පිළිබඳ විරෝධයක්ද සමාජය තුළ තිබේ. විශේෂයෙන් මුහුණු පොතේ ආණ්ඩු විරෝධී මත පළවීම වැළැක්වීමට ආණ්ඩුව විසින් මර්දනයේ හස්තය දියත්කරනු ලැබ තිබේ.

කොරෝනා අනතුර අස්සේ ඩොලර් කීපයක් උපයා ගැනීමට උදයංග වීරතුංගලා මැදිහත්වී යුක්රේනයෙන් සංචාරකයන් ගෙන්වා ලංකාවට කොරෝනා බෝකරන විට, පොහොසත් ඉන්දියානුවන්ට නිරෝධායනය වීමට ලංකාවේ හෝටල් ලබාදෙන්නට ඉඩ දිය හැකි නීති අහිංසක මිනිසුන් අරභයා ක්‍රියාත්මක කිරීම ගැන සමාජයේ විරෝධයක් තිබේ. එසේම විදේශගත ශ්‍රී ලාංකිකයන් ලංකාවට ගෙන්වීමේදී එම කාර්ය ආණ්ඩුවේ ගජමිතුරන්ට මුදල් උපයා ගැනීමේ ජාවරමක් බවට පත් කොට විදේශගත ශ්‍රමිකයින් ගසාකෑම ගැන ඒ අය තුළවිරෝධයක් තිබේ. කොරෝනා ජාවාරමක්කර ගැනීමට එරෙහි විරෝධයක් සමාජය තුළ තිබේ. ෆෝට් සිටියේ වැඩි අයිතිය චීනයට ලබාදෙමින් ෆෝට් සිටි පනත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම පිළිබඳ ගොඨාභයට ඡන්දය දුන් අය තුළ පවා විරෝධයක් තිබේ. ඒ අතර බලන විට පෙනීයන්නේ රට තුළ සෑම ජන කොටසක් තුළම ආණ්ඩුවට එරෙහි විරෝධයක් වර්ධනය වෙමින් තිබෙන බවය.

මෙම විරෝධය වර්ධනයවී කිසියම් වෙලාවක ඕනෑම හේතුවක් මත පුපුරා යා හැක. සත්‍යය එයයි. එහෙත් ආණ්ඩුව දිය රත්වන තුරු හැලියේ කෙළින කකුළුවන් සේ සිටියාවේ. එහෙත් වමේ හා ප්‍රගතිශීලී ව්‍යාපාරවල වගකීම වන්නේ ගොඩනැගෙන මෙම විරෝධය වැරදි වෙලාවක වැරදි ආකාරයට පුපුරා යාම වළක්වා මෙම විරෝධය ධනපති ක්‍රමය වෙනස් කිරීමේ ජනතා ක්‍රියාකාරිත්වයක් දක්වා වර්ධනයකිරීමත් මෙම විරෝධයට නිවැරදි දේශපාලන නායකත්වයක් ලබාදීමත්ය.

# කොවිඩ් හමුවේ...

7 පිටුවෙන්...

එන්නත් ලබාගැනීමට ඉල්ලීම් කිරීම, ගිවිසුම්ගත වීම වැනි මූලික ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණා. ආණ්ඩුව මේ කිසිවක් කළේ නැහැ. ලෝක සෞඛ්‍ය සංවිධානය එන්නත්කරණ ලද ජන සනත්වය අවම වශයෙන් 70%ක් විය යුතු බවට නිර්දේශ කර තිබෙනවා. ඒ අනුව අපේ රටේ ජනගහනයෙන් ලක්ෂ 140කට එන්නත් ලබාදිය යුතුයි. ආධාර ලෙස ලැබුණු එන්නත් ප්‍රමාණය හැරුනුකොට ආණ්ඩුව මිලදී ගත්තේ ලක්ෂ 05ක් පමණයි. එයිනුත් අසමත්.

ඇස්ට්‍රාසෙනිකා එන්නත් 12,65,000ක් ලැබුණා. ඒ එන්නත් ලබාදීමේ ක්‍රියාවලිය ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලබාදී තිබු මාර්ගෝපදේශනයන් පිළිපැද්දේ නැහැ. සෞඛ්‍ය කණ්ඩායම් හමුදා යාන්ත්‍රණය, පොලීසිය, වැඩිහිටි සහ රෝගාබාධවලට ලක්වී ඇති ජනතාව ආදී වශයෙන් ප්‍රමුඛතා තිබුණා. නමුත් අපේ රටේ සමහර අයගේ ගෙවල්වල, සමහර අයගේ ලියුම්වලට, සමහර අයගේ කෝල්වලට එන්නත් ලබාදුන්නා. මුළු එන්නත් ක්‍රියාවලියම අවුල් කළා. අපේ රටේ වරප්‍රසාදයක් ලෙස එන්නත ලැබිය යුතු නැහැ. ඇස්ට්‍රාසෙනිකා එන්නත පළමු වටයේදී ලක්ෂ 09කට පමණ ලබාදී දෙවන වටයේදී ඉතිරි වෙලා තියෙන්නේ ලක්ෂ 03ක් විතර. ලක්ෂ හයකට විතර දෙවැනි එන්නත නැතිව යනවා. මේ එන්නත් ප්‍රමාණය ලැබුණාට පස්සේ අඩක් දෙවැනි වර ලබාදෙන්න යොදවන්න තිබුණා. නමුත් මේ දේශපාලන නායකත්වයත් යාන්ත්‍රණයත් එන්නත් ලබාගැනීමේදී සහ ලබාදීමේදී අසමත්වී තිබෙනවා.

කොවිඩ් මර්දන ජනාධිපති කාර්ය සාධක බලකාය මාස ගණනකින් රැස්කරලා නැති බව වාර්තා වෙනවා. මේ නිසා අද පත්වී තිබෙන්නෙ ස්වභාවික තත්වයක් නොවන බව නැවත නැවතත් කියනවා. දේශපාලන නායකත්වය සහ ගොඩනගා තිබෙන යාන්ත්‍රණයේ අසමත්කම සහ අත්හැරීම බව අවධාරණය කරනවා. කොවිඩ් වසංගතය ගරානාවක් බවට පත්කර ගැනීමට ඉඩදීමෙන් අද ලැබී තිබෙන ප්‍රතිවිපාක උග්‍ර වී තිබෙනවා. පී.සී.ආර්. පරීක්ෂණ කට්ටල ගෙන්වීම, නිරෝධායන හෝටල් වෙන් කිරීම, විදේශවල සිට එන අය ඒවාට යෙදවීම, තමන්ගේ චෞර වළල්ලේ කණ්ඩායම්වල ව්‍යාපාර බවට පත්කර ගන්න ඉඩ දුන්නා. උදයංග වීරතුංග ඥාති සොහොයුරාට යුක්‍රේනයේ සංචාරකයන් ගෙන්වන්න ඉඩ දුන්නා. සංචාරක ඒජන්සියක් නැති කෙනෙක් යුක්‍රේන සංචාරකයින් ගේන්න පටන් ගත්තා. එංගලන්ත ප්‍රභේදය ලංකාවට ආවේ යුක්‍රේන් සංචාරකයන්ගෙන් කියලා සමහර අය අනතුරු අඟවා තිබෙනවා. අපේ රටේ පාලකයන්ගේ චෞර වළල්ල ඩොලර් 690කට සති දෙකක නිරෝධායනයක් ලබාදුන්නා. ඉන්දියන් වෛසරය ව්‍යාපාරයක් බවට පත්කර ගැනීම නිසා අද බරපතළ තත්වයකට පත්වී තිබෙනවා.

ජනතාව යම් ප්‍රමාණයකට වගකීම් විරහිත ලෙස හැසිරී තිබෙන බව අපි පිළිගන්නවා. දේශපාලන නායකත්වය කඩා වැටෙනකොට, යාන්ත්‍රණය කඩාවැටෙනකොට ජනතාවගේ මේ හැසිරීම අරුම පුදුම දෙයක් නෙවෙයි. දියාරු ප්‍රතිපත්ති සහ තීන්දු-තීරණ, ඒකමතිකභාවයක් නොවීම වැනි තත්වයන් තුළ පොදු ජනයා නිතැතින්ම මේ ආකාරයට හැසිරෙනවා. සමස්ත යාන්ත්‍රණයම අරාජික වුණාම පුරවැසියන් හැසිරීමේ ස්වභාවය මේක.

අද **බිළිගනිමින් තිබෙන මිනිස් ජීවිත, වෛරසය පිළිබඳව ජනතාව තුළ ඇතිවී තිබෙන බිය, පුරවැසියන්ගේ ඇස්වලින් ගලන කඳුළු යනාදී සියල්ල බරපතළ අපරාධ. මේ අපරාධවලට ජනාධිපතිවරයා සහ ඔහුගේ දේශපාලන නායකත්වයත්, ගොඩනගා තිබෙන යාන්ත්‍රණයත් වගකියන්න ඕනෑ.** මේ වෙනකොට ගැබිනි අම්මලා මිය ගිහිල්ලා. ආලෝකය නොදැකපු ගැබ තුළ ඉන්න දරුවා මියයාම මොන තරම් අපරාධයක්ද? මාස 03ක ළදරුවෙකුත් මියගොස් තිබුණා. මේ පාලකයන් මේවා සංවේදීව දකිනවාද? ඔවුන්ට මේවා ඉලක්කම් විතරයි. ඒ නිසා තමයි ආණ්ඩුවේ උදවිය " ඉන්දියාවේ මැරෙන තරම් අපේ මැරෙන්නේ නැහැ" කියන්නේ. මොන දුෂ්ට චින්තනයක්ද ඒක පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වෙනත් රටවල් එක්ක සංඛ්‍යා සංසන්දනය කර පෙන්වනවා. සෑම පුරවැසියෙක්ම මියයෑම පිළිබඳව පාලකයාට කම්පනයක් තිබෙන්න ඕනෑ. මේ අය එහෙම සහ කම්පනයක් තියෙන පාලකයෝ නෙවෙයි. මේ සෑම කඳුළු ගැලීමකටම පාලකයා වගකිව යුතුයි. නමුත් ඔවුන්ට ඒවා ඉලක්කම් විතරයි.



මේ සියල්ලන්ගෙන් පෙන්නුම් කරන්නේ මේ සමාජ ක්‍රමයේ දුෂ්ටභාවය. මෙය මනුෂ්‍යත්වයේ සමාජ ක්‍රමයක් නෙවෙයි. සියල්ල ඉලක්කම් මත ගණනය කරන සමාජ ක්‍රමයක්. හැඟීම් ගණනය කරන සමාජ ක්‍රමයක් නෙවෙයි. ඩොලර්, රුපියල් ආදිය මත ගණනය කරන සමාජ ක්‍රමයක්. මේ දුෂ්ට අතිශය අසාර්ථක සමාජ ක්‍රමයේ පරිවර්තනයක් අද අවශ්‍යයි. එය දිගු කාලීන වැඩක්. හැබැයි මේ මොහොතේ කෙටි කාලීනව යමක් කළ යුතුයි. අපි දීර්ඝ කාලයක් මේ ක්‍රියාවලිය කොතැනට වර්ධනය වේදැයි බලා සිටියා. නමුත් දැන් රටේ පවතින තත්වය තීරණාත්මක සංධිස්ථානයකට පැමිණ තිබෙනවා. සහතික ලෙසම මේ රටේ ජනතාවගේ ජීවිත බේරා ගැනීම සඳහා අපි දේශපාලන ව්‍යාපාරයක් ලෙස උපරිම ලෙස මැදිහත්වීමට සූදානම්.

# ආර්ථිකයේ කුණුවීම...

9 පිටුවෙන්...

මුහුණ දෙන විශාලතම අර්බුදය වන්නේ මෙම පහළ වැටෙන වත්කම් සංචිතය හා ඉදිරියේදී ගෙවීමට ඇති විශාල ඩොලර් ණය කළමනාකරණය කිරීමයි. 2021 වසර තුළදී පමණක් ආණ්ඩුව ඩොලර් බිලියන 6.9ක් ණය ලෙස ගෙවිය යුතුය. 2021 ජූලි මාසයේදී කල් පිරෙන අනිවාර්යෙන් ගෙවිය යුතු ඩොලර් බිලියනයක ස්වෛරී බැදුම්කර කල්පිරීමක්ද ඒ අතර වේ.

දැනටමත් චීනයේ ඩොලර් බිලියන 1.5ක් ලබා ගෙන ඇති අතර, කොරියාවෙන්ද ඩොලර් මිලියන 500ක් සහන ණයක් මෑතකදී ලබා ගන්නා ලදී. ආණ්ඩුව මේ විදේශ වත්කම් හිඟයට පිළිතුරක් ලෙස කොළඹ වරාය නගර ව්‍යාපෘතිය එකම බලාපොරොත්තුව බවට පත් කරගෙන ඇත්තේ එබැවිනි.

ආණ්ඩුවේ ආදායම බිඳ වැටීමත්, මුදල් අච්චු ගැසීම හා වාණිජ බැංකුවල ඇති ජනතාවගේ තැන්පතු ආණ්ඩුවට ලබා ගෙන එදිනෙදා කටයුතු පවත්වා ගෙන යාමට සිදුවීමත්, ණය ප්‍රමාණය රටේ මුළු නිෂ්පාදනය ඉක්මවා ගොස් තිබීමත්, සලකා බලන විට තවදුරටත් ලංකාවේ ආර්ථිකය යැයි සැලකීමට හැක්කේ කුමක්දැයි පැහැදිලි ප්‍රශ්නයක් පැනනගී. 73 වසරක් පවත්වාගෙන ආ ආර්ථිකය ලිහිල්කරණයේ, නිදහස්කරණයේ ධනවාදී අසාර්ථකත්වය ආණ්ඩුවේම සංඛ්‍යා දත්ත මගින් අද වනවිට ඔප්පු කෙරෙමින් තිබේ. කොරෝනා වසංගතයෙන් මිනිසුන් දහස් ගණනින් මිය ගියද ධනපති පංතියට තමන්ගේ සූරාකෑම නතර කළ නොහැක්කේ ඒ තරමටම ගරා වැටෙන ආර්ථිකයක් බවට ලංකාවේ ආර්ථිකය මේ වනවිට කුණුවී ගොස් තිබීම නිසාය. පවතින ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් රටේ සම්පත් විකිණීමට ධනපති පාලක පංතියට සිදුවී ඇත්තේ ඔවුන්ගේ නීතියම ඔවුන්ගේ අර්බුදයට පිළිතුරු නොවන නිසාය.

වෛද්‍යවරුන් ජීවිත බේරා ගැනීමට රට සති දෙකකට වැසීමට යෝජනා කරන විට, එසේ කළොත් ආර්ථිකය ඊට වඩා භයානක ලෙස කඩා වැටෙනු ඇතැයි මහා බැංකු අධිපති කියා සිටින්නේ කුණුවී ගඳ ගසන මේ අර්බුදයේ යථාර්ථයයි.

# මේ ආණ්ඩු 'ආර්ථික හැරවුම් ලක්ෂ' ගැන...

11 පිටුවෙන්...

එක හොඳයි.

තනි කෙනෙක් අතට ලෝකයේ බලය සංකේන්ද්‍රණය වෙන එක වැරදියි. 1991දී සමාජවාදී කඳවුර බිඳවැටුණාට පස්සේ එක්සත් ජනපදය කේන්ද්‍ර වූ ඒකධ්‍රැවීය ලෝකයක් නිර්මාණය වුණා. ඒ නිසා ලෝකයට යුද්ධ අපනයනය කළා. ඉතාමත් බරපතළ විනාශකාරී ආර්ථිකයන් අපනයනය කළා. ඒ නිසා එක්සත් ජනපදය කේන්ද්‍ර කර ගත් ලෝකයක් නිර්මාණය වෙන එක වැරදියි. තවත් බලකඳවුරක් නිර්මාණය වෙන එක හොඳයි. හැබැයි, අපට ප්‍රශ්නය තියෙන්නේ, කවර හෝ කඳවුරක ඉතාමත් ළෙන්ගතු නෑයෙක් බවට පත් වෙන එක; යටත් වැසියෙක් බවට පත් වෙන එක.

**විදේශ ප්‍රතිපත්තියක් නොමැතිවීම**

අපි කුඩා ආර්ථිකයක් තිබෙන පරිධියේ පිහිටි රටක්. වර්ග කිලෝමීටර් 65,610ක, මිලියන 22ක් පමණ ජීවත් වන කුඩා ජනගහනයක් ඉන්න රටක්. ඩොලර් බිලියන 80යි දළ ජාතික නිෂ්පාදිතය. ඒකපුද්ගල ආදායම ඩොලර් 4,000ට අඩුයි. සිංගප්පූරුවේ 58,000යි. අපි කොහොම ද ලෝකයේ නිර්මාණය වෙමින් තිබෙන බලකඳවුරේ ගොදුරු බවට පත් නොවී අපේ උපායමාර්ගය සකස් කර ගන්නේ? අපේ උපන් නූපන් දරු පරම්පරාවල අවශ්‍යතාවලටත් එම ප්‍රතිපත්තිය අතිශය වැදගත්. තමුන්නාන්සේලාට එහෙම විදේශ ප්‍රතිපත්තියක් තිබුණාද? උදාහරණ කීපයක් කියන්නම්.

නොරොච්චෝලේ බලාගාරය ඉන්දියානු සමාගමකට ගියා. ඒක අවලංගු කරලා චීන සමාගමකට දුන්නා. ඉන්දියාව තර්ජනය කරලා, විශාල අවාසි සහිතව සාම්පූර් බලාගාරය දෙන්න වුණා. කාලය නැති නිසා අවසාන වශයෙන් මා කියන්නේ, මේක වත්ත බද්දට දි ඇස්සට දත නියවනවා වාගේ වැඩක්. ධාන්‍ය ධනයෙන් සම්පූර්ණ වෙච්චි හාමු මහත්තයෙක් හිටියා. ඔහු ධනය සියල්ල විනාශ කරලා, අවසානයේදී වත්ත බද්දට දුන්නා. ඔහුට ජීවත් වෙන්න මාර්ගයක් නැති වුණා. බඩගින්නට අර වත්ත අයිනට වෙලා, කුරුම්බා මදය ගලවන්න ඇස්ස කපන එකට දත නියවනවා. වත්ත බදු දීලා ඇස්සට දත නියව නියවා ඉන්නවා. මතක තබා ගන්න. මේක තමයි, වෙන්නේ.

ඛනිජ සම්පත්වලින් ගහණ, ලෝකයේ වැදගත් ගමන් මාර්ගයක පිහිටි විශාලතම මානව සම්පතක් හිමි, රට වගේ අට ගුණයක මහ මුහුදක් හිමි රාජ්‍යයක්. මේ රටේ මේ සම්පත් ඉතා හොඳින් කළමනාකරණය කරලා, ලෝකයත් එක්ක ඉස්සරහට යන්න අවුරුදු හැත්තෑතුනක් අසමත් වී තිබෙනවා. ඒ නිසා 2020දී ණය වාරිකය සහ පොලිය ගෙවීම බිලියන 1,931ක් වෙන කොට ආදායම බිලියන 1,383යි. ණය ගෙවන්නත් බිලියන 588ක් ණයට ගන්න සිද්ධ වුණා. 1948 සිට 2005 දක්වා ගත වූ කාලයේ ම ණය අරන් තිබුණේ, ට්‍රිලියන 2.2ක් විතර. හැබැයි, 2020 වසරේ දී විතරක් ණය පංගුව ට්‍රිලියන 2.2කින් වැඩි කරගෙන.



හැමදාමත් මේ පාර්ලිමේන්තුවේ ආර්ථික හැරවුම් ලක්ෂ ගැන කතා කළා. ඒ හැරවුම් ලක්ෂ ගැන අදත් කතා කරන කොට පාර්ලිමේන්තුවේ බිත්ති කොක්හඬලා හිනා වෙනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


# ජනතාවගේ කටවල් වැසීම සඳහා කොරෝනා නීති පාවිච්චි කිරීමට ඉඩ දිය නොහැකියි

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



පෝට් සිටි රට පාවාදීමේ පනත රට හමුවේ තැබූ මොහොතේ නිරෝධායන නීතිවලට ගරු කරමින් ජ.වි.පෙ. විසින් සිදු කරන ලද මහජන විරෝධය මර්දනය කිරීම සඳහා ආණ්ඩුව නිරෝධායන නීති යොදා ගැනීමට සූදානම් වන බවට චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ආණ්ඩු විරෝධී මත යටපත් කිරීමටත් ආණ්ඩු විරෝධීන් දඩයම් කිරීමටත් තමන්ගේ නොහැකියාව වසා ගැනීමටත් නිරෝධායන නීති පාවිච්චි කිරීමට තරම් ආණ්ඩුව බංකොලොත් වී සිටින බව පෙන්වා දුන්නේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 21වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය.

"ආණ්ඩුව කන්න ඕනෑ වුණාම කබරගොයාත් තලගොයා කරගන්නවා. ආණ්ඩුව නිරෝධායන නීති පාවිච්චි කරමින් සිටින්නේ සත්‍ය ලෙසම කොරෝනා පාලනයට නෙමෙයි; ආණ්ඩුවට එරෙහි විරෝධයන් යටපත් කර මර්දනය කිරීම වෙනුවෙනුයි. මේ තත්වයට හොඳම උදාහරණයක් තමයි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා පහුගියදා නිකුත් කර තිබූ චක්‍රලේඛය. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අයට මාධ්‍යවලට ප්‍රකාශ දෙන්න එපායැයි එයින් නියම කර තිබෙනවා. කොරෝනාවල ඇත්ත තත්වය ආණ්ඩුව සඟවමින් තිබෙනවා. ඇත්ත රෝගීන් ගණන, ඇත්ත මරණ ගණන, ඇත්ත අර්බුදය ආණ්ඩුව කියන්නේ නැහැ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මේ පිළිබඳ අවබෝධයක් තිබෙන අය ප්‍රශ්නෙ බරපතළකම ජනමාධ්‍යවලට කිවුවා. රෝහල්වල ඇඳන් නැතිකම, පහසුකම් නැතිකම, එන්නත ලබාදීමේදී මතුවූ ගැටලු වෛද්‍යවරුන්, පීඑච්අයි මහත්වරුන් විසින් පෙන්වා දුන්නා. මේ ප්‍රශ්නයේ බරපතළකම සමාජය දැන ගත්තේ මේ තත්වය නිසයි. ආණ්ඩුව තමන්ගේ වගකීම පැහැර හරිමින් සිටින බව රට දැනගත්තා. ආණ්ඩුව කළ යුතුව තිබුණේ මේ විවේචන දැකලා තමන්ගේ අඩුපාඩු සම්පූර්ණ කරගැනීමයි. ඒ වෙනුවට ආණ්ඩුව කරමින් සිටින්නේ කතා කරන අයට මුඛවාඩම් දැමීමයි. කොරෝනා බෝවීමට අදාළව දමා ගත යුතු මුඛවාඩම ආණ්ඩුව විරුද්ධවාදීන්ගේ කටවල් වහන්න යොදා ගන්න හදනවා.

ආණ්ඩුව කොරෝනා මර්දනය කිරීම සම්පූර්ණයෙන් අසාර්ථකයි. ආණ්ඩුව කොරෝනා පාලනය කිරීම වෙනුවට වෙන වැඩ කරමින් සිටිනවා. මෙවැනි තත්වයක් තිබියෙදී තමන් විරුද්ධ වන හඬවල් වැසීම සඳහා කොවිඩ් මර්දන නීති පාවිච්චි කරන්න හදනවා. මේකට ආණ්ඩුවට වගකියන්න සිද්ධ වෙන බවට අපි ආණ්ඩුවට අනතුරු අඟවනවා. මේ විරෝධයන් හැමදාම මෙහෙම තිබෙන්නේ නැහැ. මේවා පුපුරා යන වෙලාවක් එයි.

අපි ආණ්ඩුවට අවධාරණය කරන්නේ නිරෝධායන නීති පාවිච්චි කරලා තමන්ගේ විරුද්ධවාදීන් හඬ යටපත් කිරීමට උත්සාහ දැරීම නතර කරන ලෙසයි. මෙවැනි ආකාරයේ කුඩා කෙනිත්තිලිවලින් අපව බියවැද්දීමට හිතනවානම් ඒ ගැන කණගාටුයි. අපිට එහෙම කරන්න බැහැ. මේ මව්බිම ආරක්ෂා කිරීම වෙනුවෙන් අපට කළ හැකි මැදිහත්වීම අපි අනිවාර්යයෙන් කරනවා. ඒ වෙනුවෙන් හිරේ යන්න වෙනවානම් අපි සතුටින් භාරග න්න ලෑස්තියි."

# රට විකුණන්න තිබෙන උනන්දුව එන්නත ගෙන්වන්න තිබුණානම් අද ව්‍යසනයක් නැහැ

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා



ආණ්ඩුවට වරාය නගර කොමිෂන් සභා පනත සම්මත කරගැනීමට තිබූ උනන්දුව කොවිඩ් එන්නත් ලබා ගැනීමට තිබුණේනම් රට මෙතරම් ව්‍යසනයකට පත්නොවීමට ඉඩ තිබූ බව පෙන්වා දෙන ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලෙකම් විජිත හේරත් සහෝදරයා තවත් කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කර පෞද්ගලික සමාගම් ස්ථාපිත කර රටේ සම්පත් විකිණීම සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන බව ප්‍රකාශ කළේය.

විජිත හේරත් සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 30 වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඔහු මෙසේද කියා සිටියේය.

"ආණ්ඩුව කැබිනට් මණ්ඩලයට සුපුරුදු පරිදි රටේ ජාතික සම්පත් කුණු කොල්ලයට විකුණන කැබිනට් පත්‍රිකාවක් දැම්මා. සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් ආයෝජන සහ ක්‍රමෝපාය සංවර්ධන කියන කැබිනට් පත්‍රිකාව දැම්මා. මේකේ තියෙන්නේ සෙලෙන්දිවා කියන ආයතනය මහ භාණ්ඩාගාරයේ කොටස් අයිතිය සතුව හදන බවයි. ඊට පස්සේ සෙලෙන්දිවා සමාගමට අනුබද්ධව තවත් සමාගමක් හදනවා. 'ස්පෙෂල් පර්පස් වෙහිකල්' කියලා. මේ සමාගමේ කොටස් 49ක් සෙලෙන්දිවා සමාගමේ අයිතියට පත් කරනවා. කැබිනට් පත්‍රිකාවේ 2.4 වගන්තියේ ඒ ගැන සම්පූර්ණයෙන් සඳහන් වෙනවා. 'එකී පරිපාලන සමාග මේ වත්කමක කොටස්වලින් 49%ක් දක්වා මූලිකව නිදහස් කරනු ඇති අතර එහිදී පාලනය සහ පාලන බලය රඳවා ගනු පිණිස නිදහස් කළ වත්කමේ රන්මුවා කොටස් ප්‍රමාණයක් සෙලෙන්දිවා ආයතනය විසින් දරනු ලැබේ.' ඒවගේම 6 වැනි වගන්තියේ 'දිගු කාලීන බදු අයිතිය හෝ කළමනාකරණ අයිතිය පමණක් පෞද්ගලික ආයෝජකයෙකු වෙත පැවරීමේ විකල්ප ක්‍රමය අනුගමනය කිරීමටද සෙලෙන්දිවා ආයතනය බලාපොරොත්තු වේ'. ඒ වගේම 7 වැනි වගන්තියේ 'වඩාත් සුදුසු ප්‍රාග්ධන ව්‍යුහය සාක්ෂාත් කරගැනීම සඳහා ණය හෝ ව්‍යාපාරික වස්තු පොදුවේ අලෙවි කිරීම යන දෙක අතුරින් සුදුසු අංගය අනුගමනය කර අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට නියමිතය.' ඒ වගේම 'නව අනුබද්ධ සමාගමේ කොටස් නිකුත් කිරීම හෝ මුලින් ගෙවීම් කිරීමට සෙලෙන්දිවා ආයතනය විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමග අන්‍යොන්‍ය වශයෙන් එකඟත්වයකට පත්විය හැකිය.' යනුවෙන් කියනවා.

මේ කියන්නේ අපේ රටේ වාණිජ වශයෙන් ඉතාම වටිනා ඉඩම් අවුරුදු 99, අවුරුදු 198ක්, වගේ කාලවලට පුද්ගලික සමාගම්වල්ට දෙන්න හදන එකයි. ආණ්ඩුව බලයට එන්න කලින් කීවේ එක්සත් ජාතික පක්ෂයෙන් විකුණන ඒවත් ආපහු ගන්නවා කියලා. හැබැයි ආපු ගමන් ෂැංග්‍රිලා හෝටලයේ පිටුපස්සේ ඉඩම සිංගප්පූරු සමාගමකට වික්කා. පෝට් සිටිය පාර්ලිමේන්තුවේ සම්මත වෙනකොටම ඊට සමාන්තරව කොළඹ ඉඩම් ටික විකුණන්න කැබිනට් පත්‍රිකාවක් අනුමත කර ගත්තා. මේක බරපතළ අපරාධයක්.

එක පැත්තකින් ආණ්ඩුවට කොරොනාවලින් බැටකන ජනතාවට උත්තර නැහැ. මුළු රටේම ජනතාව විපතෙන් විපතට පත්වෙලා. ඒ අස්සේ රටේ ඉඩම් ටික විකුණනවා. ඒ නිසා මේ ආණ්ඩුවේ ඔළමොට්ටල සහ චෞරයන් රකින ප්‍රතිපත්තියට එරෙහිව රටේ සම්පත් රැක ගැනීම වෙනුවෙන් අවදි වෙන්න, නැගිටින්න කියලා ඉතා ඕනෑකමින් ජනතාවට කියා සිටිනවා."

# මුදල් අච්චු ගැසීමෙන් රට ගොඩ ගත නොහැකි බව මහ බැංකු වාර්තාවෙනුත් පැහැදිලියි

## ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



ජනතාව, නිෂ්පාදන ක්‍රියාවලිය සහ කර්මාන්ත ඒකාබද්ධ වූ වැඩපිළිවෙලක් ආණ්ඩුව සතුව නොමැති බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, වාණිජ බැංකුවල වත්කම් ආණ්ඩුවට ගැනීමෙන් සහ මුදල් අච්චු ගැසීමෙන් රට ගොඩගත නොහැකි බව 2020 මහ බැංකු වාර්තාව මගිනුත් පැහැදිලි වන්නේයැයි කියා සිටියේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 09වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. මෙම මාධ්‍ය හමුව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සභික වසන්ත සමරසිංහ සහෝදරයා සහ නලින් හේවගේ සහෝදරයාද එක්ව සිටියහ.

මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙසේ කියා සිටියේය.

"රට බරපතළ ආර්ථික අර්බුදයකට ගමන් කරමින් තිබෙන බවට අපි දිගින් දිගටම අනතුරු ඇඟවූවා. නමුත් ආණ්ඩුව ආර්ථිකය හදන්න හිතලවත් තියෙන බවක් අපිට පෙන්නේ නැහැ. මෙතෙක් කරගෙන ආ ආකාරයටම රටේ සම්පත් විකිණීමේ ගමන ඇරෙන්න වෙන මාර්ගයක් පෙන්වලා නැහැ. ආණ්ඩුව දේශීය වශයෙන් ණය පංගුව වැඩිකරගන්න අතර විදේශ සංචිතය අඩුකරගෙන තිබෙනවා. විදේශ රටවල්, විදේශ ණය දෙන ආයතන අප රට සම්බන්ධයෙන් තීරණ ගන්නේ අප සතු විදේශ සංචිත ප්‍රමාණය මතයි. විදේශ සංචිතය 2019දී ඩොලර් මිලියන 7642ක් තිබිලා 2020 අවසන් වනවිට ඩොලර් මිලියන 5674ක් දක්වා අඩුවෙලා. මේ අවුරුද්දේ ගෙවී ගිය මාස 04 තුළදී මේ තත්වය ඩොලර් බිලියන 04ක් දක්වා අඩුවී තිබෙනවා. ආණ්ඩුව ඉදිරි අවුරුද්ද සඳහා ඩොලර් බිලියන 6.9ක විදේශ ණය ගෙවන්න ඕනෑ. ලබන ජූලි මාසයේ 27වැනිදාට ඩොලර් බිලියනයක ස්වෛරීත්ව බැඳුම්කර ණය ගෙවන්න ඕනෑ. මේ ණය ගෙවන්නේ කොහොමද?

ගෝඨාභය රාජපක්ෂ මහත්තයා කීවේ වියත් මගෙ න් උදව් අරගෙන දැනුමේ ආර්ථිකයක් හදනවා කියලා; කෘෂි ආර්ථිකය ශක්තිමත් කරනවා, නිෂ්පාදනය වැඩි කරනවා කියලා. නමුත් අද වන විට ඒ හැම අංශයක්ම කඩා වැටිලා. ඊට හේතුව වසංගතය යැයි පෙන්නුවාට මේ තිබෙන්නේ මෙතෙක් ගෙනියපු ආර්ථික උපායමාර්ගයේ වැරැද්දයි."







බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.